# විසල් මාතර සංවර්ධන සැලැස්ම 2023 – 2033

# වැලිගම

## ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය



විසල් මාතර සංවර්ධන සැලැස්ම 2023-2033

# වැලිගම

## ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය

**වැලිගම ප්‍රාදේශීය සභාව සඳහා වන නගර සංවර්ධන සැලැස්ම 2023-2033**

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2023

**සියළුම හිමිකම් ඇවිරිණි.**

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපැල - info@uda.gov.lk
දුරකථන අංක - + 94112 873 637
ප්‍රකාශනය - 2021

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම( 2023 -2033), පලමු කොටස, දෙවන කොටස සහ තුන්වන කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශ.දු.අ.ත. විශ්ලේෂණය (SWOT) සහ සැලැස්ම යන කොටස් වලිනි. දෙවන කොටස 2023 -2033 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

වැලිගම ප්‍රාදේශීය සභා සංවර්ධන සැලැස්ම 2023 -2033, මාතර දිස්ත්‍රික් කාර්යාලයේ සැලසුම් අංශය විසින් සකස් කර ඇත.

**අධීක්ෂණය**

ඉංජිනේරු එල්. බී. කුමුදු ලාල්- සභාපති, නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී , වරලත් වාස්තු විද්‍යාඥ මහින්ද විතානාරච්චි - අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අ, නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් - කලාප I) - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් - කලාප II) - නා.සං.අ., නීතිඥ ඩී. එම්. කිරිවන්තුඩුව - අධ්‍යක්ෂ (නීති) - නා.සං.අ , නගර නිර්මාණ ශිල්පී රූපා රංජනී - අධ්‍යක්ෂ(උපායමාර්ගික සැලසුම්) නා.සං.අ.

**සැලසුම් කණ්ඩායම**

**අධීක්ෂණ කටයුතු හා මෙහෙයවීම** : වරලත් නගර නිර්මාණ ශිල්පී අනුර මැදවෙල - අධ්‍යක්ෂ (දකුණු පළාත) නා.සං.අ., වරලත් නගර නිර්මාණ ශිල්පී ජී. එල්. සුමනසේකර - ස්ථාන භාර නිලධාරී (මාතර දිස්ත්‍රික් කාර්යාලය), වරලත් නගර නිර්මාණ ශිල්පී සුනිල් කාරියවසම්- සහකාර අධ්‍යක්ෂ - සැලසුම් (මාතර දිස්ත්‍රික් කාර්යාලය), වාස්තු විද්‍යාඥ ජේ.සී. වික්‍රමරත්න - සහකාර අධ්‍යක්ෂ (මාතර දිස්ත්‍රික් කාර්යාලය), වරලත් වාස්තු විද්‍යාඥ ඩොමිනි වික්‍රමසිංහ - සහකාර අධ්‍යක්ෂ (මාතර දිස්ත්‍රික් කාර්යාලය), වරලත් නගර නිර්මාණ ශිල්පි අෂාන් මධුරංග (මාතර දිස්ත්‍රික් කාර්යාලය), වරලත් නගර නිර්මාණ ශිල්පී ඔෂානි තුෂාරා (මාතර දිස්ත්‍රික් කාර්යාලය), ඒ.පී.එම්.සමරසිංහ - බලාත්මක සැලසුම්කරු (මාතර දිස්ත්‍රික් කාර්යාලය), එස්.ඒ.ශරානි - බලාත්මක සැලසුම්කරු(මාතර දිස්ත්‍රික් කාර්යාලය), එච්.එෆ්.එල්.වරුණි - බලාත්මක සැලසුම්කරු (මාතර දිස්ත්‍රික් කාර්යාලය), කේ.එස්.රෙජී - බලාත්මක සැලසුම්කරු (මාතර දිස්ත්‍රික් කාර්යාලය) වාස්තු විද්‍යාඥ එස්.සී.ගුරුසිංහ, එස්.කේ.රාජපක්ෂ යාපා - නගර නිර්මාණ ශිල්පී (පුහුණු)

**සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය**
උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ (අධීක්ෂණය, නියාමය සහ ගැසට් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ (PORS, DRR, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ. (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)

## ප්‍රණාමය

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරිය මාතර දිස්ත්‍රික් කාර්යාලයෙහි මූලික අධීක්ෂණය යටතේ සිදු විය. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ මාතර නගරයට ආසන්නව පිහිටි වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පවත්නා ස්වාභාවික පරිසරය ප්‍රශස්ත භාවිතයට යොමු කරමින් සංචාරක හා ආර්ථික නවෝදය තුළින් නොනිදන සංචාරක නාගරිකයක් ලෙස සංවර්ධනය කිරීම මෙම සංවර්ධන සැලැස්මෙහි අරමුණ වී ඇත.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම 2023-2033 රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත. මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන යටතේ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සඳහා අනුමැතිය ලබාදීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස විෂය භාර ගරු අමාත්‍ය ගරු අමාත්‍ය අනුර කරුණාතිලක මැතිතුමන්ට අධිකාරියේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටිමු. තවද වැලිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් හා නිලධාරීන්, සහ සැලැස්මට දායකත්වය ලබා දුන් සියලුම රජයේ නිලධාරීන්ට ,සැලසුම් කණ්ඩායම නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කර සිටිමු.

විශේෂයෙන්ම මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්ය හා මග පෙන්වීම ලබා දුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ඉංජිනේරු එල්. බී. කුමුදු ලාල් මහතාට, අධ්‍යක්ෂ ජනරාල් වරලත් වාස්තු විද්‍යාඥ මහින්ද විතානාච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - කලාප 1 නගර නිර්මාණ ශිල්පී එම් .පී. රණතුංග මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - කලාප II නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න මහතාට, අධ්‍යක්ෂ (දකුණු පළාත) නගර නිර්මාණ ශිල්පී අනුර මැදවල මහතාට හා උපායමාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී රූපා රංජනී මහත්මියට අපගේ ස්තූතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ .කළුපහන මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්. සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, නීති අංශයේ කාර්යයෙහි නියුතු අධ්‍යක්ෂ දයානි කිරිවන්තුඩුව මහත්මියටත්, මාතර දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සියලුම සේවක මහත්ම මහත්මීන්ටත් අපගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමු.

# පූර්විකාව

දකුණු පළාතෙහි ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය වන මාතර මහ නගරය හා තදාසන්න නගර වල ඇතිවන සංවර්ධනය හේතුවෙන් පැන නගින අභියෝගයන්ට මුහුණ දීම සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මතුවී ඇත. ඒ අනුව, එම ප්‍රදේශය සැලසුම්ගත සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කරගනිමින් විසල් මාතර නාගරික සංවර්ධන ප්‍රදේශය අංක 1409/08 දරණ 2005.10.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

එසේ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය සඳහා මාතර මහා නගර සභා බල ප්‍රදේශය, වැලිගම නගර සභා බල ප්‍රදේශය සහ මාතර, වැලිගම, වැලිපිටිය, දෙවිනුවර, මාලිම්බඩ, තිහගොඩ යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි කොටස් වලින් යුත් වර්ග කිලෝමීටර් 175.0 ක භූමි ප්‍රදේශයක් ඇතුළත් වේ. මෙම ප්‍රදේශයේ වර්තමාන සංවර්ධන නැමියාව සළකා 2022.10.19 දිනැති අංක 2302/20 දරන අති විශේෂ ගැසට් නිවේදන මගින් ඉහත සඳහන් පළාත් පාලන ආයතන හතට අයත් සම්පූර්ණ භූමි ප්‍රමාණය වන වර්ග කිලෝ මීටර් 303.0ක ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් විසල් මාතර සංවර්ධන ප්‍රදේශය පුළුල් කරන ලදි. ඒ අනුව මෙම විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශය භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික අංශ එකිනෙක සුසංයෝග වන ලෙස ඉඩම් පරිහරණය ක්‍රමාණුකූලව පෙළගස්වමින්, සියළුම ඉදිකිරීම් සහ සම්බන්ධතා මාර්ග (Communication Routes) වාස්තුගත කර මහජනතාවට පහසුවෙන් ජීවත්විය හැකි පරිසරයක් නිර්මාණය කිරීම අරමුණ ඇතිව විසල් මාතර සංවර්ධන සැලැස්ම පිළියෙළ කරන ලදි. එම සැලැස්ම මඟින් ප්‍රදේශීය විභවතාවයන් සැළකිල්ලට ගෙන “සහසබ්බන්ධතා නගරයක් ” ළගාකරගැනීමේ දැක්ම ඔස්සේ පිළියෙළ කරන ලද සංකල්පිත සැලැස්මට අනුව පළාත් පාලන ආයතන සඳහා වෙන වෙනම විස්තරාත්මක සංවර්ධන සැලසුම් විසල් මාතර නගර සංවර්ධන සැලැස්ම යටතේ පිළියෙළ කරන ලදි.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලය මගින් වැලිගම ප්‍රාදේශීය සභා සංවර්ධන බල ප්‍රදේශයම ආවරණය වන ලෙස ආර්ථික, සමාජයීය, භෞතික , පාරිසරික හා සංස්කෘතික යන සංරචකයන් සලකා 2019 වර්ෂයේ මෙම සැලැස්ම සකස් කිරීම ආරම්භ කරන ලදී. එය 2023-2033 කාල පරාසය සඳහා බලාත්මක කිරීමට නියමිතය. සංවර්ධන සැලැස්ම කොටස් තුනකින් සමන්විත වන අතර පළමු කොටස සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, ශ.දු.අ.ත. විශ්ලේෂණය හා සැලැස්ම යන පරිච්ඡේදයන්ගෙන් සමන්විතය. දෙවන කොටස සැලසුම් ප්‍රදේශය සඳහා වන කලාපිකරණ නියමතා, අනුමත භාවිතයන් සහ විශේෂ නියමතා අන්තර්ගත

වේ. තෙවන කොටස යටතේ භූ ගෝලීය ඛණ්ඩාංක සමග කලාපීය මායිම් සහ අනෙකුත් ඇමුණුම් ඇතුළත් කර ඇත.

පළමු කොටසේ පළමු පරිච්ඡේදය යටතේ සංවර්ධන සැලැස්ම, එහි නිත්‍යානුකූල රාමුව, සැලැස්මේ පාර්ශවකරුවන්, සැලසුම් සන්දර්භය හා සැලසුම් ක්‍රියාවලිය දක්වා ඇත. දෙවන හා තෙවන පරිච්ඡේදය යටතේ පිළිවෙලින් සැලසුම් ප්‍රදේශයේ සීමා නිර්ණය කිරීම හා සැලැස්මේ අවශ්‍යතාවය විස්තරාත්මකව සඳහන් කොට ඇත. සිව්වන පරිච්ඡේදය යටතේ දැක්ම, අරමුණු හා පරමාර්ථ ද පස්වන පරිච්ඡේද යටතේ එක් එක් අරමුණ සඳහා වන ශ.දු.අ.ත. විශ්ලේෂණය අන්තර්ගත වේ. හයවන පරිච්ඡේද යටතේ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන ප්‍රධාන උපායමාර්ගික සැලසුම් ලෙස ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, මෙන්ම ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයන් සවිස්තරාත්මකව එක් එක් අංශ යටතේ දක්වා ඇත.

එමෙන්ම දෙවන කොටසේ හත්වන පරිච්ඡේදය සංවර්ධන කලාප හා කලාප නියමතා සඳහා වෙන්කොට ඇති අතර, අටවන පරිච්ඡේදය  යටතේ යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා හා රක්ෂිත සඳහා වෙන් කොට ඇත.

අවසාන වශයෙන් මෙම අධිකාරියේ සහ ශ්‍රී ලංකා රජයේ අරමුණ වන්නේ මෙම නගර සංවර්ධන සැලැස්ම 2023-2033 අදාළ කාල වකවානුව සඳහා සාර්ථකව බලාත්මක කිරීම වේ.

## ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

### නගර සංවර්ධනය යථාර්ථයක් කරමින් ගොඩනැගෙන වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය



අති ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රතිපත්ති මත "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" සංකල්පය යථාර්ථයක් බවට පත්කර ගැනීමේ අභිලාෂය සාක්ෂාත් කරගැනීම උදෙසා වන අරමුණු හා ඉලක්ක කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටුකර ගැනීම පිණිස සංවර්ධනයේ නව මානයක් ගොඩනගමින් නිවැරදි දිශානතියක් කරා රාජ්‍ය යොමු කිරීම සඳහා, නව සංවර්ධන සැලසුම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, අතිශය වැදගත් ජාතික ක්‍රියාවලියක් වශයෙන් හඳුනාගත හැක.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුල පවතින, විෂමතාවයන්, හා දුර්වලතාවයන් හඳුනා ගනිමින්, පළාත් දිස්ත්‍රික්ක හා නගර අතර පවතින සමාජ, ආර්ථික, භෞතික හා පාරිසරික සාධක පදනම් කරගත් එකිනෙකට වෙනස් විභවතාවයන් හඳුනා ගනිමින් වඩාත් ප්‍රායෝගික නාගරික සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් අවශ්‍යතාවය මත නගර සංවර්ධන සැලසුම් 68 ක් සකස් කොට ප්‍රකාශයට පත් කර තිබෙන අතර, මෙම වසර තුල තවත් නගර සංවර්ධන සැලසුම් 22 ක් සකස් කොට ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය මේ වන විට සිදුකරමින් පවතී. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මක්ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. වසර 2025 වන විට තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අවශ්‍යතාවය මත රටේ සංවර්ධනයට දායක වන නගර සැලසුම් විශාල ප්‍රමාණයක් සකස් කිරීම සඳහා සැලසුම් කර ඇත.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි පවතින විභවතාවයන් වශයෙන් හඳුනා ගත් සේවා සැපයීම යන විභවතාවය මත පදනම්ව සේවා සැපයීමේ මධ්‍යස්ථානයක් වශයෙන් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය කිරීම, මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී ප්‍රමුඛස්ථානය ලබාදී තිබෙන ප්‍රධාන සාධකය වශයෙන් සඳහන් කල හැක.

එසේම ප්‍රදේශයේ පවතින ස්වභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද හඳුනා ගනිමින් එම සම්පත් වඩාත් විධිමත් පරිදි නේවාසිකයින් සඳහා භාවිත කල හැකි ආකාරයෙන් සංවර්ධනය කිරීම මෙම සංවර්ධන සැලැස්ම මඟින් යෝජිත අරමුණු වශයෙන් සඳහන් කල හැක.

මෙම සැලැස්ම සකස් කිරීමේදී සෑම සමාජ ස්ථරයක්ම නියෝජනය කරමින්, පුරවැසියන්, වෘතීයවේදීන්, විශේෂඥයින් හා පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබා ගත් අතර එම තොරතුරු විශ්ලේෂණය කරමින් තාක්ෂණික ක්‍රමවේදයක් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබා ගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම (2023-2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි අපේක්ෂා කරමි.

**අනුර කරුණාතිලක**
**නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය**

## ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය



1978 අංක 41 දරණ පනතේ බලතල ප්‍රකාරව ස්ථාපනය කරන ලද නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමුඛතම කාර්යය වනුයේ නාගරික සංවර්ධන බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරනලද ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමයි.

ඉහත බලතල ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික ප්‍රදේශ සඳහා 1982 අංක 04 දරණ නාගරික වර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ (II කොටසේ) 8 අ (1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලතල පැවරී ඇත. ඒ අනුව ප්‍රදේශයේ පවතින සමාජ ආර්ථික, භෞතික හා පාරිසරික සාධක සැලකිල්ලට ගෙන උපායමාර්ගිකව සංවර්ධනය කලයුතු අංශයක් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරමින් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කාලීන අවශ්‍යතාවයන් හඳුනා ගනිමින්, යථාවත් සැලසුම් ක්‍රමෝපායන් උපයෝගීකර ගනිමින් 2023-2033 වසර දක්වා බලාත්මක වන ලෙස වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හා විභවතාවයන් හඳුනා ගැනිම හා විභවතාවයන් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම සඳහා උපායමාර්ගික ප්‍රවේශයන් අනුගමනය කර ඇති අතර, සංවර්ධන සැලසුම මගින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා හඳුන්වාදී ඇත. එබැවින් වඩාත් යහපත් හා කාලීන මහජන අවශ්‍යතාවයන් ඉටු කිරීම පිණිස බලාත්මක කරනු ලබන මෙම සංවර්ධන සැලැස්මෙහි අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් හා මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

**ඉංජි.එල්.බී.කුමුදු ලාල්**
**සභාපති**
**නාගරික සංවර්ධන අධිකාරිය.**

## ප්‍රාදේශීය සභා ලේකම්තුමියගේ පණිවුඩය



නාගරික සංවර්ධන අධිකාරීය විසින් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම පිළිබඳව මාගේ කෘතඥතාවය ප්‍රථමයෙන් ප්‍රකාශ කර සිටින අතර, එමඟින් වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අනන්‍ය වූ ලක්ෂණ ආරක්ෂා වන පරිදි විශේෂයෙන් සංචාරක කර්මාන්තය වර්ධනයත් ඒ තුලින් ප්‍රදේශයේ ආර්ථික තත්වය දියුණු කර ගැනීමට ගෙන ඇති උත්සාහය අගය කල යුතු වේ.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරිමේදි පොදු මහජනතාව නියෝජනය කරමින් අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා අදහස් පිලිබඳව ද අවධානය යොමු කර තිබීම මා අගය කරන අතර, සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුලින් 2033 වර්ෂය වන විට වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය භෞතික, ආර්ථික,සාමාජීය හා පාරිසරික වශයෙන් විධිමත්ව නගා සිටුවමින් නොනිදන නාගරිකයක් කරා අප යන ගමනට ඔබ ගෙන ඇති ප්‍රයත්නය පිලිබඳව මා ඇතුළු අප ප්‍රාදේශිය සභාවේ සුභාශිංෂණ පළකර සිටිමු.

ලේකම්
වැලිගම ප්‍රාදේශිය සභාව

# අමාත්‍යතුමාගේ අනුමැතිය

**මාතර මහා නගර සභාව, වැලිගම නගර සභාව, මාතර ප්‍රාදේශීය සභාව, වැලිගම ප්‍රාදේශීය සභාව, දෙවිනුවර ප්‍රාදේශීය සභාව, තිහගොඩ ප්‍රාදේශීය සභාව සහ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මාතර සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය, අනුර කරුණාතිලක වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 අගෝස්තු මස 28 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, මාතර මහා නගර සභාව, වැලිගම නගර සභාව, මාතර ප්‍රාදේශීය සභාව, වැලිගම ප්‍රාදේශීය සභාව, දෙවිනුවර ප්‍රාදේශීය සභාව, තිහගොඩ ප්‍රාදේශීය සභාව සහ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වූ විසල් මාතර සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

අනුර කරුණාතිලක (පා.ම)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,

12 වන මහල,

"සෙත්සිරිපාය" අදියර - II

බත්තරමුල්ල.

2024 ...12... මස 11 වන දින.

ගැසට් නිවේදනය


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2416/07 - 2024 දෙසැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.12.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**මාතර මහා නගර සභාව, වැලිගම නගර සභාව, මාතර ප්‍රාදේශීය සභාව, වැලිගම ප්‍රාදේශීය සභාව, දෙවිනුවර ප්‍රාදේශීය සභාව, තිහගොඩ ප්‍රාදේශීය සභාව සහ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වන විසල් මාතර සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය, අනුර කරුණාතිලක වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 අගෝස්තු මස 28 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, මාතර මහා නගර සභාව, වැලිගම නගර සභාව, මාතර ප්‍රාදේශීය සභාව, වැලිගම ප්‍රාදේශීය සභාව, දෙවිනුවර ප්‍රාදේශීය සභාව, තිහගොඩ ප්‍රාදේශීය සභාව සහ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව යන බල ප්‍රදේශ සඳහා වූ විසල් මාතර සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**අනුර කරුණාතිලක** (පා.ම.),
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 11 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර II,
බත්තරමුල්ල.

EOG 12 - 0233/1


1A - PG 6954 — 19 (2024/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## පටුන


**ප්‍රණාමය ..... iv**

**පූර්විකාව ..... v**

**ගරු අමාත්‍යතුමාගේ පෙරවදන ..... vii**

**ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය ..... viii**

**ප්‍රාදේශීය සභා ලේකම්තුමියගේ පණිවුඩය ..... ix**

**අමාත්‍යතුමාගේ අනුමැතිය ..... x**

**ගැසට් නිවේදනය ..... xi**

**සිතියම් ලැයිස්තුව ..... xv**

**වගු ලැයිස්තුව ..... xvi**

**I වන කොටස ..... 1**

**දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම ..... 1**

**1 වන පරිච්ඡේදය ..... 2**

**සංවර්ධන සැලැස්මේ පසුබිම ..... 2**

**1.1.** හැඳින්වීම ..... 3

**1.2.** සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් ..... 6

**1.3.** සංවර්ධන සැලැස්මේ විෂය පථය ..... 7

**1.4.** සැලසුම් ක්‍රියාවලිය ..... 9

**2 වන පරිච්ඡේදය ..... 13**

**මූලික අධ්‍යයනය ..... 13**

**2.1.** අධ්‍යයන ප්‍රදේශය ..... 14

**2.2.** සැලසුම් සීමාව නිර්ණය කිරීම ..... 14

**2.2.1.** හැඳින්වීම ..... 14

**2.2.2** ක්‍රියාකාරී සීමාව ..... 16

**2.2.3** භූගෝලීය සීමාව ..... 16

**2.2.4** පරිපාලන මායිම් ..... 16

**2.2.5** සැලසුම් සීමාව ..... 17

**2.3** සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය ..... 17

**2.3.1** ඓතිහාසික පසුබිම ..... 17

**2.3.2** ජනගහනය ..... 24

**2.3.3** නිවාස ..... 25

**2.3.4** ඉඩම් පරිහරණ රටාව ..... 25

**2.3.5** මාර්ග හා ගමනාගමනය ..... 27

**2.3.6** ජලය සම්පාදනය ........ 28
**2.3.7** විදුලි සැපයුම ........ 28
**2.3.8** අධ්‍යාපන පහසුකම් ........ 28
**2.3.9** සෞඛ්‍ය පහසුකම් ........ 29
**2.3.10** ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ........ 29
**2.3.11** මළාපවාහනය ........ 29
**2.3.12** පාරිසරික සංවේදී ස්ථාන ........ 29
**3 වන පරිච්ඡේදය ........ 31**
**සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය ........ 31**
**3.1.** හැදින්වීම ........ 32
**3.2.** හඳුනාගත් ගැටළු ........ 34
**3.3.** හඳුනාගත් විභවතා ........ 39
**04 වන පරිච්ඡේදය ........ 45**
**සංවර්ධන සැලසුම් රාමුව ........ 45**
4.1 දැක්ම ........ 46
**4.2** දැක්මේ ප්‍රකාශය ........ 47
**4.3** අරමුණු ........ 48
**4.4** පරමාර්ථ ........ 48
**05 වන පරිච්ඡේදය ........ 50**
**ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විශ්ලේෂණය ........ 50**
**5.1.** සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය ........ 51
**5.2.** විස්තරාත්මක ශ . දු .අ . ත. විශ්ලේෂණය ........ 53
**06 වන පරිච්ඡේදය ........ 71**
**සැලැස්ම ........ 71**
**6.1** සංකල්පිත සැලැස්ම ........ 72
**6.2** යෝජිත භූමි පරිහරණ සැලැස්ම ........ 74
රූප සටහන් අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : ........ 77
**6.3.** සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග ........ 78
**6.3.1.** සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග සැලැස්ම ........ 78
**6.3.2.** භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම ........ 89
**6.4.** ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම ........ 104
**6.4.1.** සංචාරක සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම ........ 104
**6.4.2.** වාණිජ හා සේවා සංවර්ධන සැලැස්ම ........ 114
**6.4.3** කර්මාන්ත සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම ........ 117

6.5 තිරසර පාරිසරික ක්‍රමෝපායන් ........ 120

........ 129

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශිය සැලැස්ම - 2033 ........ 130

6.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග ........ 133

6.6.1 හැඳින්වීම ........ 133

6.6.2 ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම ........ 135

6.6.3 ව්‍යාපෘති පිලිබඳ විස්තර ........ 136

**II වන කොටස ........ 181**

**07 වන පරිච්ඡේදය ........ 182**

**සංවර්ධන කලාප හා කලාප නියමතා ........ 182**

7.1. හැඳින්වීම ........ 183

7.1 කලාපීකරණ සැලැස්ම ........ 184

7.2. සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා ........ 186

7.3. සංවර්ධන කලාප නියමතා ........ 191

08 වන පරිච්ඡේදය ........ 201

**යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා ........ 201**

**උපලේඛන ........ 208**

**III වන කොටස ........ 243**

**ඇමුණුම් ........ 244**

**සිතියම් ලැයිස්තුව**

සිතියම් අංක 1 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය: අධ්‍යාන ප්‍රදේශය ........................................ 15

සිතියම් අංක 2 : ජාතික භෞතික සැලැස්ම (2050)................................................................................ 21

සිතියම් අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය:කලාපීය සම්බන්ධතාවය ................................121

සිතියම් අංක 4 : සංචාරක ගමන් මාර්ග............................................................................................ 53

සිතියම් අංක 5 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : සංචාරක කටයුතු සඳහා සංවර්ධන නැම්යාව. ................................................................................................................................................ 61

සිතියම් අංක 6 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : ආපදා ව්‍යාප්ත ප්‍රදේශ ................................ 63

සිතියම් අංක 7 : ප්‍ර වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : අභ්‍යන්තර මාර්ග පද්ධතිය ..................... 65

සිතියම් අංක 8 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : යෝජිත භූමි පරිහරණ සැලැස්ම 2033 ....... 76

සිතියම් අංක 9 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය ................... 83

සිතියම් අංක 10 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : යෝජිත ජනාවාස සැලැස්ම 2033.............. 86

සිතියම් අංක 11: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : යෝජිත මාර්ග පද්ධතිය ............................ 90

සිතියම් අංක 12 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : මීටර් 24ක් දක්වා පුළුල් විය යුතු මාර්ග ...... 91

සිතියම් අංක 13 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : විදුලි සැපයුම ........................................ 115

සිතියම් අංක 14 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : පරිසර සංවේදී ප්‍රදේශ කලාපීකරණය...... 121

සිතියම් අංක 15 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම 2033.. 126

සිතියම් අංක 16 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශිය සැලැස්ම 2033 ........................................................................................................ 129

සිතියම් අංක 17: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : යෝජිත සංවර්ධන ව්‍යාපෘති.................... 134

සිතියම් අංක 18 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : කලාපිකරණ සැලැස්ම- 2023-2033....**Error! Bookmark not defined.**

## වගු ලැයිස්තුව


වගු අංක 1: සැලසුම් ක්‍රියාවලිය .......... 9

වගු අංක 2 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : ජනගහන වර්ධනය 2012-2022 .......... 24

වගු අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : ඉඩම් පරිහරණ රටාව 2022 .......... 26

වගු අංක 4 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : මාර්ග පද්ධතිය 2022 .......... 27

වගු අංක 5 : වැලිගම ප්‍රාදේශීය සභා සංවර්ධන බල ප්‍රදේශය : රජයේ රෝහල් තොරතුරු .......... 79

වගු අංක 6 : වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය - නිවාස අවශ්‍යතාවය 2033 .......... 85

**වගු අංක 7: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - පුළුල් කිරීමට යෝජිත වෙරළ ප්‍රවේශ මාර්ග .... 95**

වගු අංක 8 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - දෛනික ජල අවශ්‍යතාවය 2033 .......... 99

වගු අංක 9 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ඝණ අපද්‍රව්‍ය සංයුතිය -2022 .......... 102

වගු අංක 10 : මිරිස්ස සමුද්‍රිය කලාපයෙහි තල්මසුන් නැරඹීම සඳහා සංචාරකයින් පැමිණීම හා ආදායම (2019 සිට 2023 දක්වා)) .......... 106

වගු අංක 11 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - පවත්නා හෝටල් සහ ඒවායේ සේවය කරන සේවකයින් පිලිබඳ තොරතුරු .......... 107

වගු අංක 12 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම .......... 185

වගු අංක 13 : සංවර්ධන කලාප සහ කලාප සංගුණක .......... 187

වගු අංක 14 : භූමියෙහි ආනතිය අනුව අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය සහ ගෙබිම් අනුපාතයෙහි ප්‍රතිශතය .......... 188

වගු අංක 15 : භූමියෙහි ආනතිය අනුව අවසරලත් අවම භූමි ප්‍රමාණය සහ ඉඩමේ අවම පළල හා ගැඹුර..155

වගු අංක 16 : නේවාසික කලාපය .......... 192

වගු අංක 17 : වාණිජ කලාපය .......... 193

වගු අංක 18 : මිශ්‍ර සංවර්ධන කලාපය .......... 194

වගු අංක 19 : සංචාරක කලාපය .......... 195

වගු අංක 20 : කර්මාන්ත කලාපය .......... 196

වගු අංක 21 : සංරක්ෂණ කලාපය .......... 197

වගු අංක 22 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග .......... 202

වගු අංක 23 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග .......... 203

වගු අංක 24 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ප්‍රාදේශීය සභා මාර්ග සඳහා යෝජිත මාර්ග පළල .......... 204

## ඡායාරූප ලැයිස්තුව

ඡායාරූප අංක 1: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : පැරණි වැලිගම වෙරළ තීරය ..................... 19
ඡායාරූප අංක 2 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : පටු වෙරළ පිවිසුම් .................................. 34
ඡායාරූප අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : විධිමත් ලෙස සංවර්ධනය නොවූ මාර්ග.... 35
ඡායාරූප අංක 4 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පොදු පහසුකම් නොමැති වීම.................................................................. 36
ඡායාරූප අංක 5 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :අවිධිමත් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම ......... 37
ඡායාරූප අංක 6 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : අවිධිමත්ව සංවර්ධනය වී ඇති උප සේවා මධ්‍යස්ථාන ........................................................................................................................ 37
ඡායාරූප අංක 7 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : වෙරළ කලාපයේ අවිධිමත් ඉදිකිරීම් ........ 38
ඡායාරූප අංක 8: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : සංචාරක කර්මාන්තය සම්බන්ධ .............. 39
ඡායාරූප අංක 9 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : බහුවිධ ප්‍රවාහන සේවයක් පැවතීම ............ 41
ඡායාරූප අංක 10 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : කොටවිල නව නගර සැලැ ..................... 42
ඡායාරූප අංක 11 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : සංවර්ධනය සඳහා යොදාගත හැකි ඉඩම්. 43
ඡායාරූප අංක 12 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ලෝඩ්ස්ටා කර්මාන්ත ශාලාව ............... 43
ඡායාරූප අංක 13 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - මිරිස්ස ධීවර වරාය ............................... 54
ඡායාරූප අංක 14 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - භූ විෂමතා ලක්ෂණයන්ගෙන් යුතු වෙරළ තීරය ........................................................................................................................ 55
ඡායාරූප අංක 15: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ජෛව විවිධත්වයෙන් යුත් ගරාඩුව කලපුව හා බොරාල වැව ........................................................................................................ 56
ඡායාරූප අංක 16: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - තරු පන්තියට අයත් සංචාරක හෝටල්.... 56
ඡායාරූප අංක 17: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - රිටිපන්න ධීවර කර්මාන්තය................... 58
ඡායාරූප අංක 18 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - කොටවිල උසාවි සංකීර්ණය ................. 62
ඡායාරූප අංක 19: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - කොටවිල නව රෝහල ......................... 62
ඡායාරූප අංක 20 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : අනාගත සංවර්ධනයට යොදාගත හැකි ඉඩම් ........................................................................................................................ 64
ඡායාරූප අංක 21 : දක්ෂිණ අධිවේගී මාර්ගය කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානය......................... 66
ඡායාරූප අංක 22 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : නිසි පරිදි සංවර්ධනය නොවූ මාර්ග......... 67
ඡායාරූප අංක 23 : සංවර්ධන බල ප්‍රදේශය ගාල්ල පරිපාලන නගරයට හා මාතර වාණිජ නගරයට මැදිව පිහිටා තිබීම ........................................................................................................ 69
ඡායාරූප අංක 24 : කොටවිල නව රෝහල.......................................................................... 73
ඡායාරූප අංක 25 : සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කරගත් නූතන ආයුර්වේද ක්‍රම............................ 80
ඡායාරූප අංක 26 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - නදී තීරාරාමය..................................... 80
ඡායාරූප අංක 27 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - කෝවිල් කන්ද රජමහා විහාරය............. 81
ඡායාරූප අංක 28 : පොල්වතුමෝදර දුම්රිය නැවතුම් ස්ථානය පවත්නා තත්වය සහ යෝජිත තත්වය ........................................................................................................................ 82
ඡායාරූප අංක 29 : මිරිස්ස දුම්රිය නැවතුම් ස්ථානය පවත්නා තත්වය සහ යෝජිත තත්වය............ 87
ඡායාරූප අංක 30 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාල භූමිය.................................................................................................................. 88
ඡායාරූප අංක 31 : වෙරළ ආශ්‍රිත සංචාරක ක්‍රියාකරකම් ............................................................ 92
ඡායාරූප අංක 32 : නිල් තල්මසුන් නැරඹීම....................................................................... 92
ඡායාරූප අංක 33 : තල්මසුන් නැරඹීමේ පහසුකම් මධ්‍යස්ථානය දළ සැලැස්ම.............................. 93
ඡායාරූප අංක 34 : තල්මසුන් නැරඹීමේ පහසුකම් මධ්‍යස්ථානයේ ඉදිරිපස පෙනුම........................ 93

ඡායාරූප අංක 35 : ගිරාගල සිට මිරිස්ස දක්වා වෙරළ තීරය පාරිසරික විනෝදාත්මක කොරිඩෝවක් ලෙස ( Sea Green Recreational Corridor ) සංවර්ධනය ........ 94
ඡායාරූප අංක 36 : යෝජිත මිදිගම වෙරළ උද්‍යානය ........ 96
ඡායාරූප අංක 37 : පොල්වතුමෝදර පැරණි පාලම හා යෝජිත සංචාරක අවන්හල........ 97
ඡායාරූප අංක 38 : ගරාඬුව කලපුව........ 98
ඡායාරූප අංක 39 : සංචාරක නැරඹුම් ස්ථාන ........ 101
ඡායාරූප අංක 40 : කුරුල්ලන් නැරඹීමත් කඳවුරු බැඳීම හා ඡායාරූප ගැනීම සඳහා අවස්ථාවක් සැලසීම........ 103
ඡායාරූප අංක 41 : කොටවිල නව නගර වින්‍යාස සැලැස්ම ........ 105
ඡායාරූප අංක 42 : යෝජිත පරිපාලන සංකීර්ණය ........ 106
ඡායාරූප අංක 43 : කොටවිල මහා රෝහල ........ 108
ඡායාරූප අංක 44 : අධිකරණ සංකීර්ණය ........ 109
ඡායාරූප අංක 45 : ක්‍රීඩා සංකීර්ණයස ( Sea Green Recreational Corridor ) සංවර්ධනය කිරීම . 109
ඡායාරූප අංක 46 : වැලිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය ........ 111
ඡායාරූප අංක 47 : දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය........199
ඡායාරූප අංක 48 : යෝජිත චාර්ලි මවුන්ට් කර්මාන්තපුරය ........ 113
ඡායාරූප අංක 49 : කිරළ හා බතික් කර්මාන්තය නගා සිටුවීම සඳහා වැලිපිටිය හා දෙනිපිටිය මංසන්දි ආශ්‍රිතව අලෙවි මධ්‍යස්ථානය පිහිටුවීම ........ 113

# I වන කොටස

## දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම

# 1 වන පරිච්ඡේදය

## සංවර්ධන සැලැස්මේ පසුබිම

## 1.1. හැඳින්වීම

ලෝකයේ නාගරික ජන සංඛ්‍යාව දිනෙන් දින වේගයෙන් වර්ධනය වෙමින් පවතී. රැකියා අපේක්ෂාව, උසස් අධ්‍යාපනය උදෙසා ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවලට ජනයා සංක්‍රමණය වීම මෙම වර්ධනයට ප්‍රධාන හේතූන් වී ඇත. සංඛ්‍යා ලේඛණ අනුව ලෝකයේ නාගරික ජනගහනය දිනකට 180,000 කින් පමණ වර්ධනය වේ. මේ අනුව වසරකට සාමාන්‍යයෙන් මිලියන 60 ක පමණ ජනගහනයක් නගර කරා ඇදී එයි. එක්සත් ජාතීන්ගේ සංඛ්‍යා ලේඛණ වාර්තා අනුව දැනට ලෝක ජනගහනයෙන් බිලියන 03ක් එනම්, හරි අඩක් පමණ නාගරික ප්‍රදේශවල ජීවත් වන අතර, එය 2030 පමණ වන විට බිලියන 05 ක් පමණ දක්වා වර්ධනය වන බවට ඇස්තමේන්තු කර ඇත.

වර්තමාන ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාව ද දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. ඉහළ මට්ටමේ රැකියාවක්, උසස් ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට සහ අනාගත පරපුර සඳහා උසස් අධ්‍යාපනයක් ලබාගැනීම ආදී විවිධ අරමුණු මුල්කර ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවලට ජනයා ඇදීයාමේ ප්‍රවනතාවයක් පවතියි.

මාතර දිස්ත්‍රික්කය පළාත් පාලන ආයතන 17කින් සමන්විත වන අතර, මාතර මහ නගර සභාව වැලිගම නගර සභාව හැරුණු විට අනෙකුත් ප්‍රදේශ ප්‍රාදේශීය සභා යටතේ පාලනය වේ. ඒ අනුව, විසල් මාතර නාගරික සංවර්ධන ප්‍රදේශය සහ අනෙකුත් සියළුම පළාත් පාලන ආයතනවල නාගරික ලක්ෂණ සහිත ප්‍රදේශ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ සංවර්ධන බල ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

මාතර දිස්ත්‍රික්කයේ වැඩිම ප්‍රබලතාවයක් ඇති පළාත් පාලන ආයතනය මාතර මහ නගර සභාව වේ. ඒ තුළ දිස්ත්‍රික්කයේ ප්‍රධාන රාජ්‍ය ආයතන, වාණිජ හා මූල්‍ය ආයතන, ජාතික පාසල් හා පෞද්ගලික අධ්‍යාපන ආයතන සහ උසස් අධ්‍යාපන ආයතන රාශියක් පිහිටා ඇත. ඒ හේතුවෙන් මාතර මහ නගරය කේන්ද්‍ර කර ප්‍රබල නාගරීකරණයක් ඇතිවෙමින් පවතී. මේ නිසා මාර්ග ආශ්‍රිතව ජන ඝණත්වය වැඩිවීම, ඉඩම් මිල වැඩිවීම සහ ඉහල දෛනික සංචලතාවයක් දක්නට ඇත. මීට අමතරව ප්‍රධාන නගරය ආශ්‍රිතව නාගරික පැතිරීම (Urban Sprawl) හා පාරිසරික සංවේදී ප්‍රදේශවලට අහිතකර බලපෑම් ඇතිවීම මෙන්ම ප්‍රධාන මාර්ග දෙපස රේඛීය ජන සංඛ්‍යා වර්ධනයක්ද ඇති වෙමින් පවතී.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන මාතර නගරය ආශ්‍රිතව වර්ධනය වෙමින් පවතින නාගරික ගැටළු අවම කර විධිමත් නාගරික සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව 1409/08 දරණ 2005.10.07 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් විසල් මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය නමින් නව නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කරන ලදි. මෙම ප්‍රදේශය, මාතර මහා නගර සභා බල ප්‍රදේශය, වැලිගම නගර සභා බල ප්‍රදේශය, මාතර,වැලිගම, දෙවිනුවර, මාලිම්බඩ සහ තිහගොඩ යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වලින් සමන්විත වර්ග කිලෝමීටර් 175.0 ක බල ප්‍රදේශයක් අයත් වේ.

ප්‍රවීන නගර නිර්මාණ ශිල්පී ශ්‍රීමත් පැට්‍රික් ගෙඩින්ස් ප්‍රකාශ කර ඇත්තේ "නගරයක් සැදෙන්නට පළාතක් අවශ්‍ය වේ" (It takes a whole region to make the city.) මේ නිසා නගරයක එම නගරය මායිමට පමණකින් සීමා කළ නොහැක. තවද, ලෙවිස් කීබල් (Lewis Keeble) සඳහන් කරන්නේ නගරයක සීමාව නැතිනම් කඩඉම මෙය යැයි නිර්මාණාත්මකව පැවසිය නොහැකි බවයි.

තවද, ශ්‍රීමත් එබෙන්සර් හොවර්ඩ්ගේ (Sir Ebenezer Howard) "කලබලකාරිත්වයෙන් තොර හෙට දවසකට සැබෑ ප්‍රතිසංස්කරණයක් කරා" (To – Morrow : A Peaceful path to real Reform නැමති ග්‍රන්ථය මඟින් ඉදිරිපත් කරන ලද උද්‍යාන නගර සංකල්පය යටතේ සඳහන් කර ඇත්තේ සීමිත ජනගහනයකට ජීවත් විය හැකි සෑහෙන කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් පවතින, උපග්‍රාහී නගර වලින් සමන්විත නගර සංවර්ධන සැලසුම් ක්‍රමයක් තුලින් නාගරික ගැටළු අවම කරගත හැකි බවය.

කෙසේ නමුත් මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සිදුකරන ලද ක්‍රියාකාරී සීමාව (Functional Boundary), භෞතික සීමාව (Physical Boundary), සහ පරිපාලන සීමාව (Administrative Boundary) යනාදී අධ්‍යයන වලට අනුව පළාත් පාලන ආයතන 07ම ආවරණය වන ලෙස අංක 2302/20 සහ 2022.10.19 වන දිනැති ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව විසල් මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 303.0 දක්වා පුළුල් වී ඇත. මෙම විසල් මාතර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සම්පූර්ණ විසල් මාතර ප්‍රදේශයම ආවරණය වන ලෙස සැලැස්මේ මූලික අධ්‍යයනය සිදුකර ඇති අතර, සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සමස්ථ සංවර්ධන බල ප්‍රදේශයම එකම දැක්මක් යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව විසල් මාතර නාගරික සංවර්ධන සැලසුම් බල ප්‍රදේශයම ආවරණය වන පරිදි සිදුකරන ලද අධ්‍යයනයෙන් පසුව, පරිපාලන වශයෙන් බෙදුම් කර ඇති එක් එක් පළාත් පාලන ආයතන සඳහා වෙන වෙනම සංවර්ධන සැලසුම් සකස් කර ඇත. ඒ අනුව, මෙම සංවර්ධන සැලැස්ම වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කර ඇත.

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් නාගරික සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ගැනීම අරමුණ වේ. 1982.12.17 දිනැති අංක 223/16 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වෙරළ කලාපයේ සිට කිලෝමීටර 01ක් ද, විසල් මාතර සංවර්ධන සැලැස්ම යටතේ 2005.09.07 දින ප්‍රකාශයට පත් කරන අංක 1409/8 අති විශේෂ ගැසට් නිවේදනයට අනුව වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොටසක් ද, අධිවේගී මාර්ගය සඳහා සකස් කරන ලද 2005.11.23 දිනැති අංක 1420/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ද නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, අංක 2302/20 දරණ 2022.10.19 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා 2021 වර්ෂයේ සිට භෞතික, ආර්ථික, සාමාජිය හා පාරිසරික සාධක පදනම් කරගනිමින් නාගරික සංවර්ධන සැලැස්ම සකස් කර ඇති අතර, මෙම සංවර්ධන සැලැස්ම 2023 සිට 2033 දක්වා කාල පරාසය සඳහා බලාත්මක වේ.

## 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

විසල් මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය යටතේ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී අදාල ප්‍රදේශයේ පවතින ගැටළු හා විභවතා හඳුනාගැනීම සඳහා පහත ආයතනවල සහභාගීත්වයෙන් 2021.12.07 දින පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලදි.

ඒ සඳහා සහභාගී වූවන්ගේ නාමාවලිය පහත පරිදි වේ.

- වැලිගම ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල - වැලිගම
- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
- මාර්ග සංවර්ධන අධිකාරිය
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
- භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
- වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය
- මධ්‍යම පරිසර අධිකාරිය
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ගොවිජන සේවා මධ්‍යස්ථානය
- සමෘද්ධි කාර්යාලය
- ධීවර කාර්යාලය
- මිරිස්ස ධීවර වරාය
- හෝටල් හිමියන්ගේ සංගමය

ඉහත සඳහන් පාර්ශවකරුවන්ගේ අදහස් සහිතව වැලිගම ප්‍රාදේශීය සභාව සඳහා අදාළ නගර සංවර්ධන සැලැස්ම සකස් කරන ලදි.

## 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශය පළාත් පලාන ආයතන 07කින් සමන්විත වර්ග කිලෝමීටර් 175.0 කින් යුත් පුළුල් සැලසුම් බල ප්‍රදේශයක් වේ. මෙම සංවර්ධන බල ප්‍රදේශය එකිනෙකට වෙනස් අන්තර් සම්බන්ධතාවයකින් යුත් ආර්ථික ක්‍රියාකාරකම් ඇතුළත් සුවිශේෂ සැලසුම් බල ප්‍රදේශ වේ.

සමස්ත සැලසුම් බල ප්‍රදේශයේ ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශය කලාපීය ව්‍යුහාත්මක සැලසුම් ප්‍රවේශකත්වය මත සිදු කිරීමටත්, එම කලාපීය ව්‍යුහාත්මක සැලසුම් ප්‍රවේශකත්වය පදනම් කරගෙන එක් එක් පළාත් පළාන ආයතනය සඳහා වෙන් වෙන් වශයෙන් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට තීරණය කර ඇත.

විසල් මාතර සංවර්ධන සැලැස්මෙහි කලාපිය ව්‍යුහාත්මක සැලැස්ම යටතේ සංවර්ධන පොකුරු 06ක් හඳුනාගෙන ඇත.

- වාණිජ සහ අධ්‍යාපන පොකුර
- සංචාරක සහ ධීවර පොකුර
- මිශ්‍ර සංවර්ධන හා නේවාසික පොකුර
- සංස්කෘතික සංචාරක සහ ධිවර පොකුර
- කෘෂිකාර්මික හා නේවාසික පොකුර
- කර්මාන්ත පොකුර




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

ඒ අනුව, සංචාරක හා ධීවර පොකුර යටතේ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හඳුනා ගෙන ඇති අතර, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදුකර වර්ග කිලෝ මීටර් 104.57 කින් සමන්විත ග්‍රාම නිලධාරී වසම් 73 කින් යුත් සම්පූර්ණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම ඇතුළත් කර නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කොළඹ සිට කිලෝ මීටර් 145 ක් දුරින් කොළඹ - හම්බන්තොට, වැල්ලවාය වෙරළබඩ මහා මාර්ගයෙන්ද කිලෝ මීටර් 18ක දිගින් යුත් කඩතොළු සහිත දර්ශණීය මුහුදු තීරයකින් හා පොල්වතුමෝදර ගංගාව ආශ්‍රිතව පිහිටා ඇත.

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙහි දර්ශණීය මුහුදු තීරය හා ප්‍රදේශය තුලින් ගලා බසිනා පොල්වතුමෝදර ගංගාවේ පිහිටීම සංචාරක කර්මාන්තයට මෙන්ම ධීවර කර්මාන්තයටද මනා ප්‍රවේශකත්වයක් සපයමින් නිර්මාණය වී ඇත. තවද, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2017 – 2048 වසර සඳහා සකස් කර ඇති ජාතික භෞතික ව්‍යුහ සැලැස්ම තුලින් වැලිගම මිරිස්ස ආශ්‍රිත ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇත.

තවද, ප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට ජෛව විවිධත්වයකින් යුත් කලපු, වැව් හා වන රක්ෂිත පිහිටා තිබීමද පාරිසරක සංචාරක කර්මාන්තය වර්ධනය වීමට බලපා ඇත. වී වගාව හා අපනයන කෘෂිකාර්මික බෝග වන කුරුඳු, රබර්, තේ සංවර්ධන ප්‍රදේශයේ උතුරු සීමාවේ ව්‍යාප්ත වී ඇති අතර, ප්‍රධාන කාර්මික කලාප දෙකක් ස්ථානගත වීමද, ප්‍රදේශයේ නැගෙනහිරට වන්නට කොටවිල ලැබීම ප්‍රදේශය තුළ නව උසාවි සංකීර්ණය, මාතර නව රෝහල ස්ථාපිතව පැවතීමද හේතුවෙන් එම ප්‍රදේශයේ සීඝ්‍ර නාගරික වර්ධනයක් දැකිය හැකිය.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කර තිබෙන උපාය මාර්ගික සැලැසුම් 06 තුළින් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති අතර, යෝජිත සංවර්ධන ව්‍යාපෘති වර්ෂ 2033 වසර පෙරාතුව ක්‍රියාත්මක කර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ද සැලැසුම් කර ඇත.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී උපාය මාර්ගික සැලසුම් ක්‍රමවේදය අනුගමනය කරන ලද අතර, එම ක්‍රමවේදයේදී අනුගමනය කල ක්‍රියාපටිපාටිය පහත පරිදි වේ.

වගු අංක 1: සැලසුම් ක්‍රියාවලිය

**1.පසුබිම් අධ්‍යයනය**

- අධ්‍යයන ප්‍රදේශය පිළිබඳව ලියන ලද ග්‍රන්ථ, සඟරා, පුවත්පත් හා වෙනත් ප්‍රකාශන අධ්‍යයනය කිරීම.
- රාජ්‍ය ආයතන මඟින් ආර්ථික, සමාජීය හා භෞතික තොරතුරු පිළිබඳ ද්විතීක දත්ත ලබාගැනීම.
- භූමි පරිහරණ රටාව පිළිබඳ ක්ෂේත්‍ර සමීක්ෂණ සිදුකිරීම.

**2.විෂය පථය හඳුනාගැනීම**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආශ්‍රිත ක්‍රියාත්මක වන සංචාරක ව්‍යාපාරය මගින් ප්‍රදේශයේ ආර්ථිකයට සිදු කරන බලපෑම, යෝජිත සංවර්ධන ව්‍යාපෘති, දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි කොක්මාදුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය පිහිටීම, කර්මාන්ත කලාප දෙකෙහි පිහිටීම යනාදිය මඟින් ප්‍රදේශයේ සීඝ්‍ර සංවර්ධනය සඳහා සිදු වූ බලපෑම අධ්‍යයනය කරන ලදි.

**3.සංවර්ධන විභවතා හා ගැටළු හඳුනාගැනීම**

අධ්‍යයන ප්‍රදේශය තුළ ආර්ථික , සාමාජීය ,භෞතික හා පාරිසරික අංශයන්හි පවත්නා ගැටළු හඳුනාගන්නා ලදි.මේ සඳහා නගරයේ ඇති එක් එක් ආයතනයන්ගේ සහභාගිත්වය ලබාගැනීමට 2020.09.11 වන දින

පාර්ශවකරුවන්ගේ රැස්වීමක් වැලිගම දී පවත්වන ලදි .එහිදි ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතා, සංවර්ධන ගැටළු, සංවර්ධන යෝජනා ලබා ගැනීමට හැකි වූ අතර එම තොරතුරු NVIVO ක්‍රමවේදය මත විශ්ලේෂණය කරන ලදි.

**4.දැක්ම අරමුණු හා පරමාර්ථ හඳුනාගැනීම**

මෙහිදී ප්‍රදේශය තුළ පවතින සංවර්ධන විභවතාවයන්ගෙන් මනා ලෙස ප්‍රයෝජන ගැනීමටත් ප්‍රදේශය තුළ ඇති සංවර්ධනයේ ගැටළුකාරී තත්ත්වයන් මඟහරවා ගනිමින් පාරිසරික, ආර්ථික, සාමාජීය හා භෞතික අංශයන්හි සමබර සංවර්ධනය තුළින් නගරයේ දියුණුව කරා රැගෙනයාම සඳහා අවශ්‍ය දැක්ම ගොඩනඟන ලද අතර, දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අරමුණු හා පරමාර්ථ සකස් කරන ලදී .

**5.සවිස්තරාත්මක විශ්ලේෂණය**

සංවර්ධන ප්‍රදේශය සඳහා දැක්ම හා එම දැක්ම ලඟාකරගැනීම සඳහා ඉලක්ක සාක්ෂාත් කරගැනීමෙන් අනතුරුව එම පරමාර්ථයන් ඉටුකරගැනීම සඳහා තිබෙන ශක්‍යතා, දුර්වලතා, අවස්ථා හා තර්ජන ඉතා සවිස්තරාත්මකව හඳුනාගනිමින් ඉලක්ක සඳහා වන අරමුණු හඳුනාගන්නා ලදි.

**6.සංවර්ධන සැලැස්මේ උපාය මාර්ග ගොඩනැගීම**

ඉහත සඳහන් කරන ලද සවිස්තරාත්මක විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵල ප්‍රමුඛතා ගත කරමින් සංවර්ධන සැලැස්මේ ඉලක්ක ලඟා කරගැනීම සඳහා අරමුණු හඳුනාගන්නා ලදි. එම අරමුණු මඟින්

ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතාවන් නියමිත කාලයක් තුළදී නියමිත ප්‍රමාණයන්ගෙන් වැඩිදියුණු කරගැනීමටත්, ප්‍රදේශය තුළ පවතින ගැටළුකාරී තත්ත්වයන් මගහරවා ගනිමින් අපේක්ෂිත කාලය තුළ ප්‍රදේශය සංවර්ධනය කරා ගෙන යාම සඳහාත් අරමුණු සකස් කරනු ලැබීය. සංවර්ධන සැලැස්මේ ඉලක්ක හා අරමුණු තුළින් දැක්ම ලඟා කරගත යුතු ආකාරය විශ්ලේෂණය කරන ලදි. ඉන් අනතුරුව උපාය මාර්ග සැලසුම් සකස් කරන ලද අතර ,ක්‍රියාකාරී ව්‍යාපෘති හඳුනාගන්නා ලදී .

**7.සැලසුම් රෙගුලාසි පිළියෙල කිරීම**

සංවර්ධන සැලැස්ම බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධ නීති හා රෙගුලාසි, ඉඩම් පරිහරණයන් සම්බන්ධයෙන් වන නීති හා රෙගුලාසි ද සංවර්ධන සැලැස්මේ දැක්ම කරා ලඟාවීම සඳහා දැනට හඳුනාගත් ගැටළු හා ඉදිරියේදී උද්ගතවේයැයි විශ්ලේෂණය මඟින් අපේක්ෂා කරනු ලබන ගැටළු ද අවම කරගැනීම සඳහා නීත්‍යානුකූල රාමුවක් ඇති කිරීමට මෙහිදී කටයුතු කරන ලදී.

**8.පළාත් පාලන ආයතනයේ එකඟතාවය**

සකස් කරන ලද දළ සංවර්ධන සැලැස්ම සඳහා මහජන අදහස් ලබාගැනීම සහ අදාල පළාත් පාලන ආයතනයට ඉදිරිපත් කර එහි එකතාවය ලබාගැනීම මෙහිදී සිදුවේ.මහජන අදහස් හා පළාත් පාලන

ආයතනයේ යෝජනා අනුව අවශ්‍ය සංශෝධනයන් සිදු කරනු ලැබේ .

**9.සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම හා අනුමැතිය** ලබාගැනීම

පළාත් පාලන ආයතනයේ එකඟතාවය ලබාගැනීමෙන් පසු නැවත සංශෝධනය කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව ඉදිරිපත් කර තවදුරටත් නිවැරදි කරගැනීමට අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබාගැනීම සිදු කරන ලදී.

**10.කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගැනීම හා සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කිරීමකිරීම හා අනුමැතිය ලබාගැනීම**

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුවෙන් ලද උපදෙස් පිළිබඳ අවධානය යොමු කරමින් සංශෝධිත සැලැස්මේ කෙටුම්පත නීත්‍යානුකූල සැලැස්මක් බවට ප්‍රකාශයට පත් කිරීම .

# 2 වන පරිච්ඡේදය

# මූලික අධ්‍යයනය

## 2.1. අධ්‍යයන ප්‍රදේශය

සංවර්ධන සැලැස්මෙහි අධ්‍යයන ප්‍රදේශය ලෙස, මාතර දිස්ත්‍රික්කයේ අග නගරය වන මාතර මහ නගර සභා බල ප්‍රදේශය ,වැලිගම නගර සභා බල ප්‍රදේශය ,දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ,වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ,මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ,තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය , මාතර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය යන පළාත් පාලන බල ප්‍රදේශ 07කින් සමන්විත විසල් මාතර නාගරික සංවර්ධන ප්‍රදේශයම යොදා ගන්නා ලදී.

## 2.2. සැලසුම් සීමාව නිර්ණය කිරීම

### 2.2.1. හැඳින්වීම

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මාතර දිස්ත්‍රික්කයේ බටහිර මායිමේ පිහිටා ඇති අතර, එය වැලිගම හා වැලිපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකටම අයත් වේ. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වර්ග කිලෝමීටර් 104.2 ක් හා ග්‍රාම නිලධාරී වසම් 73කින් සමන්විත වන අතර, 2012 වසරේදී මුළු ජනගහනය 102564 ක් වේ. (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වර්ග කිලෝමීටර් 104.2 කින් යුත් සමස්ථ ප්‍රදේශයම සංවර්ධන සැලැස්මේ අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගෙන ඇති අතර, එයට වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 35ක්ද වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සම්පූර්ණ බල ප්‍රදේශය වන ග්‍රාම නිලධාරී වසම් 38 ම අයත් වේ.

සිතියම් අංක 1 :අධ්‍යයන ප්‍රදේශය : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 2.2.2 ක්‍රියාකාරී සීමාව

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විභවතාවන්ගෙන් පරිපූර්ණ වූ එකිනෙකට වෙනස් වූ භාවිතා වලින් සමන්විත නාගරික බල ප්‍රදේශයකි. නාගරික ප්‍රදේශයේ දකුණු මායිමේ පිහිටා ඇති වෙරළ කලාපය තුළ සංචාරක හා ධීවර කර්මාන්තය ස්ථානගත වී ඇත. එලෙසම නාගරික බල ප්‍රදේශය මධ්‍යයෙන් ගලා බසින පොල්වතුමෝදර ගඟද සංචාරක කර්මාන්තයට මනා ප්‍රවේශකත්වයක් සපයයි. දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් ඔබ්බට උතුරු ප්‍රදේශය තුළ වී වගාව, කුරුඳු හා රබර් වගාව ඇතුළත් සුළු අපනයන බෝග වගාව ව්‍යාප්තව පවතින කෘෂිකාර්මික ප්‍රදේශයකින් සමන්විත වේ. නාගරික බල ප්‍රදේශයේ නැගෙනහිරට වන්නට කොටවිල නව පරිපාලන ප්‍රදේශය ව්‍යාප්තව පවතී. ප්‍රදේශය මධ්‍යයේ බටහිර ප්‍රදේශය තුළ කර්මාන්ත ව්‍යාප්තව පවතී. ඒ අනුව, සංවර්ධන නැමියාව (Development pressure), සංවේදීතා දර්ශකය (Sensitive Index) හා Livability යන දර්ශකයන්ද ඉඩම් වටිනාකම, දෛනික සංචරණ කටයුතු පිළිබඳව සැලකිල්ලට ගෙන ක්‍රියාකාරිත්ව ප්‍රදේශයේ සීමාවන් නිර්ණය කර ගැනුණි.

### 2.2.3 භූගෝලීය සීමාව

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මුහුදු දූපත්, භූ ලක්ෂණ වලින් සමන්විත කි.මී. 18ක් දිග වෙරළ තීරයකින්ද පොල්වත්ත ගඟ, ගරාඬුව කලපුව හා ඒ හා සම්බන්ධ වූ ඇළ මාර්ග පද්ධතියක්ද දක්නට ලැබෙන අතර, ප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට හලල්ල, වැල්ලාන, පැනෑටියන වැනි හුදකලා කඳුගැට සහිත ප්‍රදේශයන් හඳුනාගත හැකිය.

### 2.2.4 පරිපාලන මායිම්

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලන මායිම නිර්ණය කිරීමේදී එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වැලිපිටිය සහ වැලිගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකටම අයත් වන අතර, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 35ක්ද වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සම්පූර්ණ බල ප්‍රදේශය වන ග්‍රාම නිලධාරී වසම් 38 ම අයත් වන සේ ග්‍රාම

නිලධාරී වසම් 73 ක් සහිතව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සකස් වී ඇති අතර, එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම සංවර්ධන සැලැස්මේ පරිපාලන මායිම් ලෙස සලකන ලදී. වැලිගම ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරී ප්‍රදේශය, භූගෝලීය මායිම හා පරිපාලන මායිම යන කරුණු තුනම පරිපාලන මායිම් සඳහා මෙහිදී පදනම් කර ගැනුණි. (සිතියම් අංක 01)

### 2.2.5 සැලසුම් සීමාව

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මෙහි සැලසුම් බල ප්‍රදේශය නිර්ණය කිරීම සඳහා ඉහත විස්තර කරන ලද ක්‍රියාකාරී ප්‍රදේශයෙහි සීමා, භූගෝලීය සීමා, පරිපාලන සීමා හඳුනාගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අංක 223/16 දරණ 1982.12.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙරළ කලාපයේ සිට කිලෝ මීටර් 1 ක්ද, විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස අංක 1409/08 දරණ 2005.09.07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින්ද, දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා වන අංක 1420/17 දරණ 2005.11.23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් හා විසල් මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම සඳහා වන අංක 2302/20 දරණ 2022.10.19 දිනැති ගැසට් පත්‍රය මඟින්ද ප්‍රකාශයට පත්කරන ලද වර්ග කිලෝ මීටර් 104.2 (හෙක්. 10426) ක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම සැලසුම් බල ප්‍රදේශය ලෙස තෝරාගන්නා ලද අතර, එම ප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

## 2.3 සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය

### 2.3.1 ඓතිහාසික පසුබිම

පොළොන්නරු යුගයේ රජ කළ මහා විරු 1 වන විජයබාහු රජතුමාගේ ළමා කාලයේදී එතුමා හඳුන්වන ලද්දේ කීර්ති කුමාරයා යන නමින් වන අතර, ඔහුව සොයා චෝලයන් මුළු ලංකාවම පරීක්ෂා කරන ලද කාලයේදී කීර්ති කුමාරයා රහසින් සැඟව සිට ඇත්තේ වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කඹුරුගමුව හා ගරාඩුව ග්‍රාමයේ බව ලේඛණවල සඳහන් වී ඇත. (කම්සුරුගොමුව නොහොත් කඹුරුගමුවේ ඉතිහාසය -එම්.යු. ජයවීර)

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට දිර්ඝ ඉතිහාසයක් පවතින බවට මේ අනුව පැහැදිලි වන අතර, කීර්ති කුමාරයා උත්සවශ්‍රීයෙන් පළමුවරට කොට කඩුවක් පැළඳ වූ ප්‍රදේශය සිරියබැන්දවූ තැන සිරිබද්දල ලෙස හඳුන්වා ඇති අතර, වර්තමානයේ එම ප්‍රදේශය ගරාඩුව ලෙස හඳුන්වයි. මේ පිළිබඳව පරවි සංදේශයේ 108 වන කවියෙන්ද හඳුන්වා දී ඇත. පසුව රජතුමා පලමු විජයබාහු රජු බවට පත්වූ පසුව මෙම ප්‍රදේශයේ පන්සලක් කරවූ බව ජනප්‍රවාදයේ පවතී. (කඹුරුගමුවේ ඉතිහාසය ග්‍රන්ථය - එම්. යූ. ජයවීර)

කඹුරුපිටියේ වනරතන හිමියන් විසින් රචිත මාතර පුරාණය නැමති ග්‍රන්ථයේ වර්තමානයේ පොල්වතුමෝදර ප්‍රදේශය පොල්ගස් සහිත වතුවලින් ගෙබී ප්‍රදේශයක් බවට හඳුන්වා දී ඇත. ක්‍රි.ව. 1813දි තල්අරඹේ ධම්මධක්ඛිත මාහිමියන් විසින් රචිත දිය සැවුල් සංදේශයේද වැලිගම ප්‍රාදේශිය සභාවේ, කඹුරුගමුව, වැලිහිද, දෙනිපිටිය ග්‍රාමයන් පිලිබදව වර්ණනා කර ඇත. (කඹුරුගමුව ඉතිහාසය -එම්.යූ.ජයවීර) වැලිගම ප්‍රාදේශිය සභාවේ පිහිටි දෙනිපිටිය ප්‍රදේශය පිළිබඳව ප්‍රවීණ කිවිදියක වන ගජමන් නෝනා විසින් රචිත කවි වලද සඳහන් කර ඇත.

ඡායාරූප අංක 1: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : පැරණි වැලිගම වෙරළ තීරය



මූලාශ්‍රය : අන්තර්ජාලය

පසුව මෙම මුහුදුබඩ ප්‍රදේශය පෘතුගීසීන්ට යටත් වූ අතර 1645.01.01 දින පෘතුගීසි ලන්දේසි ගිවිසුම මගින් මාතර දිසාවත් ලන්දේසින්ට හිමිවුණි. වර්ෂ 1815න් පසුව මුළු දිවයිනම ඉංග්‍රීසින්ට යටත් වූ අතර වෙරළබඩ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ ව්‍යාප්ත විය. ලන්දේසින් හා ඉංග්‍රීසින් විසින් මෙම සාමාන්‍ය ජනතාවට කරන ලද බලපෑම පැහැදිලිව නිරූපනය වන්නේ මෙම ප්‍රදේශයේ ජනතාව විසින් වාර්ෂිකව පවත්වනු ලබන ගම්මඩු පොල්පිටිය දේව තොවිලය තුලිනි. යටත්විජිත කාලයේදි වැලිගම ප්‍රදේශය වැල්ලබඩපත්තුව ලෙසත් හැදින්වූ අතර, නිදහසින් පසුව අංක 223/16 දරණ 1982.12.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වෙරළ කලාපයේ කිලෝමීටර් 01 ක ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්විය.

තවද, අංක 1409/08 දරණ 2005.09.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා අංක 1420/17 දරණ 2005.11.23 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ද ග්‍රාම සේවා වසම් 71 කොටස් වලින් යුක්ත ප්‍රදේශයක් ප්‍රකාශයට පත්කර ඇත. එසේම අංක 2302/20 දරණ 2022.10.19 දිනැති ගැසට් පත්‍රය මගින් මුළු ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්විය.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්මේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවෙහි ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම හා එහි වාසිසහගත පිහිටීම තුලින් උපරිම ඵල ලබාගන්නා පරිදි භූමි පරිභෝග සැලැස්ම සකස් කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමයි. ඒ අනුව, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2017 – 2050 වසර සඳහා සකස් කර ඇති ජාතික භෞතික ව්‍යුහ සැලැස්ම තුළ වැලිගම ප්‍රාදේශීය සභාව හා මිරිස්ස ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇත. ඊට අමතරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද සංචාරක සංවර්ධන සැලැස්ම තුලින් සකස් කර ඇති සංචාරක ගමන් පථය තුළ විසල් මාතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය අන්තර්ගත වන බවත්, මිරිස්ස ප්‍රදේශය සංචාරක මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති බවත් පැහැදිලි වේ. (සිතියම් අංක 02) එම සැලැස්මට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අධි සංවේදී වෙරළබඩ පාරිසරික ප්‍රදේශ සංවර්ධනයට හඳුනාගෙන ඇති අතර, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මීට ඇතුළත් කර ඇත.

## සිතියම් අංක 2 : ජාතික භෞතික සැලැස්ම (2050)







මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අන්තර් කලාපීය වැදගත්කමක් ඇති A ශ්‍රේණියේ මහා මාර්ගයක් වන කොළඹ - වැල්ලවාය මාර්ගයේද, දුම්රිය නැවතුම් ස්ථාන 04කින් යුත් කොළඹ - බෙලිඅත්ත දුම්රිය මාර්ගය හා කොක්මාදුව පිවිසුම ද ඇතුළත් දක්ෂිණ අධිවේගී මාර්ගය හා සම්බන්ධ වී පිහිටා ඇත. එම මාර්ගයන් මගින් ප්‍රධාන අගනගරය වන කොළඹ නගරය සමඟද ඊට අමතරව ගාල්ල, මාතර, හම්බන්තොට වැනි නගරද ගාල්ල වරාය, ගාල්ල කොටුව, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොග්ගල ගුවන් තොටුපල, කොග්ගල නිදහස් වෙළඳ කලාපය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල, රුහුණ විශ්ව විද්‍යාලය, කතරගම පූජා නගරය, සිංහරාජ වනාන්තරය, යාල වනෝද්‍යානය වැනි ස්ථාන සමඟද මනා සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. ඉතා කෙටි කාලයකින් මෙම ස්ථාන කරා ළඟාවීමේ හැකියාව තුලින් මෙම නාගරික ප්‍රදේශය ආර්ථික වශයෙන් වැදගත් වීමට හේතු වී ඇත.

මීට අමතරව සංවර්ධන බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් B ශ්‍රේණියේ මාර්ග 03 ක්ද, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් C හා D ශ්‍රේණියේ මාර්ග 14කින්ද ප්‍රාදේශීය සභා හා පොදු මාර්ග ජාලයකින්ද සමන්විත වේ.

සිතියම් අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : කලාපීය සම්බන්ධතාවය




W E S

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය - කලාපීය සම්බන්ධතා

සැකසුම
මාතර දිස්ත්‍රික් කාර්යාලය

නාගරික සංවර්ධන අධිකාරිය

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය, 2022

### 2.3.2 ජනගහනය

**වගු අංක 2 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ජනගහන වර්ධනය 2012-2022**

| වර්ෂය | ජනගහනය | වර්ධන වේගය (%) |
|---|---|---|
| **2012** | 102,564 | 0.35% |
| **2018** | 105,278 | 0.50% |
| **2022** | 106,920 | 0.52% |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව/ සම්පත් පැතිකඩ

ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ ජනගහන තොරතුරු අධ්‍යයනය කිරීමේදී 2012 වසර තුළ මාතර දිස්ත්‍රික්කයේ ජනගහනය 965,291 ක් වන අතර, එම වසර තුළ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනය 102,564 ක් වේ. වැලිගම හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සකස් කරන ලද සම්පත් පැතිකඩ මූලාශ්‍රය අනුව 2018 වසර තුළ ජන සංඛ්‍යාව 105,278 ක් වී ඇති අතර, එය 2022 වසර වන විට 106,920 ක් දක්වා වර්ධනය වී ඇත. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහන වර්ධනය සලකා බැලීමේදී 2012 ජන සංගණන වාර්තා අනුව ජනගහන වර්ධන වේගය 0.35% ක් වන අතර, එය 2022 වන විට 0.52% දක්වා සුළු වර්ධනයක් වී ඇත.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහනයේ සුළු වර්ධනයක් ඇතිවීමට බලපෑ හේතු ලෙස සුනාමි ව්‍යවසනයෙන් පසුව මාතර දිස්ත්‍රික්කයේ වෙරළ තීරය නැවත පදිංචි කිරීම (Relocation Programme) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආශ්‍රිතව සිදුවීම දැක්විය හැකිය. උදා: තුර්කි ගම්මානය, පැලැන දකුණ නිවාස ව්‍යාපෘතිය, දේවගිරි විහාර පන්සල් භූමිය නිවාස ව්‍යාපෘතිය යනාදිය හැදින්විය හැකිය. එසේම සංචාරක කර්මාන්තය වැඩි වශයෙන් ව්‍යාප්ත වී පවතින මිරිස්ස, තල්අරඹ, කඹුරුගමුව, උඩුපිල වැනි ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව සංචාරක හා වාණිජ භාවිතය ඉහළ ගොස් ඇති අතර, එයද ජන සංඛ්‍යාව සුළු වර්ධනයට හේතු වී ඇති බව උපකල්පනය කළ හැකිය. 2033 වසර වන විට වැලිගම

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුරෝකථනය කරන ලද මුළු ජනගහනය 113,113 ක් වේ.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 104.2 (හෙක්ටයාර් 10,457) ක් වේ. 2018 වර්ෂයේ ජන සංඛ්‍යා වාර්තාව අනුව ප්‍රදේශයේ දළ ජන ඝනත්වය හෙක්ටයාර් එකට පුද්ගලයන් 10 ක් වන අතර, 2022 වන විට ද එම අගයෙහි වෙනසක් වී නොමැත. ජන ඝණත්වය වැඩිම ග්‍රාම සේවා වසම් ලෙස කපුවත්ත, මදුරාගොඩ, මිරිස්ස උතුර, වැකඩ, දෙනිපිටිය වසම් හැදින්විය හැකි අතර, ඊට හේතු වී ඇත්තේ එම වසම් ආශ්‍රිතව මුස්ලිම් ජනගහනය ඒකරාශී වීමත්, ධීවර ප්‍රජාව වාසය කිරීමත් වේ. තවද සුනාමි නිවාස ප්‍රතිස්ථානගත කිරීමේ ව්‍යාපෘති පිහිටීමද තවත් හේතුවක් ලෙස හදුනාගත හැකිය. ජන ඝණත්වය අඩුම ග්‍රාම සේවා වසම් ලෙස නලවන, ජඹුරේගොඩ නැගෙනහිර, මිදිගම උතුර වසම් දැක්විය හැකිය.

### 2.3.3 නිවාස

2022 වසර තුළ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු නිවාස ඒකක සංඛ්‍යාව 29,632 ක් වන අතර, එහි ස්ථිර නිවාස 28,769 හා අර්ධ ස්ථිර නිවාස 863 ක්ද වේ.

### 2.3.4 ඉඩම් පරිහරණ රටාව

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10426.76 ක් වන අතර, ඉන් හෙක්ටයාර් 4143.35හෙවත් 39.75% ක් සංවර්ධන කටයුතු සඳහා යෙදවී ඇත. එසේම සමස්ථ භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3910.05ක් හෙවත් මුළු භූමි ප්‍රමාණයෙන් 37.50%ක ප්‍රමාණයක් අනාගත සංවර්ධන කටයුතු සඳහා යොදාගතහැකි අතර හෙක්ටයාර් 2372.46ක් හෙවත් මුළු භූමියෙන් 22.75%ක් සංවර්ධන කටයුතු සඳහා යොගත නොහැකි ඉඩම් ලෙස හඳුනාගෙන ඇත. ඒ සඳහා කුඹුරු ඉඩම්, වගුරු බිම්, ජල ප්‍රදේශ ආදිය ඇතුළත් වී ඇත.

වගු අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ඉඩම් පරිහරණ රටාව 2022

| අනු අංකය | භාවිතය | භූමිප්‍රමාණය (හෙක්ටයාර්) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 01. | නේවාසික | 1941.76 | 18.62 |
| 02. | ගෙවතු | 1526.17 | 14.64 |
| 03. | වාණිජ | 62.25 | 0.60 |
| 04. | කර්මාන්ත | 44.55 | 0.43 |
| 05. | සංචාරක | 91.65 | 0.88 |
| 06. | පොදු කටයුතු (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය) | 66.89 | 0.64 |
| 07. | ක්‍රීඩාභූමි හා විනෝද කටයුතු | 12.72 | 0.12 |
| 08. | මාර්ග හා ගමනාගමනය | 354.38 | 3.40 |
| 09. | ආගමික | 42.98 | 0.41 |
| 10. | කුඹුරු | 1938.84 | 18.59 |
| 11. | තේ | 392.46 | 3.76 |
| 12. | රබර් | 745.90 | 7.15 |
| 13. | පොල් | 709.6 | 6.81 |
| 14. | කුරුඳු | 506.79 | 4.86 |
| 15. | මිශ්‍ර භෝග | 21.69 | 0.21 |
| 16. | වෙනත් | 292.46 | 2.80 |
| 17. | හිස් ඉඩම් | 148.00 | 1.42 |
| 18. | ලඳුකැලෑ | 1093.15 | 10.48 |
| 19. | වනාන්තර | 98.24 | 0.94 |
| 20. | ජලප්‍රදේශ | 214.24 | 2.05 |
| 21. | වගුරු බිම් | 122.04 | 1.17 |
| | **එකතුව** | **10426.76** | **100.00** |

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය ,ක්ෂේත්‍ර සමීක්ෂණය 2021

### 2.3.5 මාර්ග හා ගමනාගමනය

අධ්‍යයන ප්‍රදේශය කොළඹ - වැල්ලවාය ප්‍රධාන මාර්ගය, වෙරළ බඩ දුම්රිය මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය යන බහුවිධ මාර්ග පද්ධතියකින් යුක්ත වේ. එම මාර්ග මගින් සංවර්ධන ප්‍රදේශය අගනුවර සමඟත් පළාත් අගනගරය සමග මෙන්ම නැගෙනහිරින් පිහිටි හම්බන්තොට, මොණරාගල, රත්නපුර වැනි දිස්ත්‍රික්ක සමගත් මනාව සම්බන්ධ කරනු ලැබේ. මීට අමතරව සංවර්ධන ප්‍රදේශය තුළ කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානය, දුම්රිය නැවතුම් ස්ථාන 4 ක් ද ස්ථාන ගතවී ඇති අතර, ගොඩගම හුවමාරු මධ්‍යස්ථානයට කිලෝමීටර් 3 ක් වැනි ආසන්න දුරකින් පවතී.

වගු අංක 4 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : මාර්ග පද්ධතිය 2022

| ශ්‍රේණිය | මාර්ග අයිතිය | මාර්ග සංඛ්‍යාව |
|---|---|---|
| A | මාර්ග සංවර්ධන අධිකාරිය | 02 |
| B | මාර්ග සංවර්ධන අධිකාරිය | 03 |
| C | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 15 |
| E | ප්‍රාදේශීය සභා මාර්ග | 380 |

මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

මීට අමතරව ඉහත මාර්ග පද්ධතිය හා සම්බන්ධ වන පොදු හා පෞද්ගලික මාර්ග ද පවතී. සංවර්ධන ප්‍රදේශය තුළ හෙක්ටයාර් 10,457 ක භූමි ප්‍රමාණයක් ඇති අතර, ඉන් හෙක්ටයාර් 354.38 ක් මාර්ග සඳහා වෙන් වී ඇත. ඒ අනුව මුළු භූමි ප්‍රමාණයෙන් මාර්ග සඳහා යෙදවී ඇති ප්‍රතිශතය 3.4% වන අතර, සම්මත ප්‍රමාණය වන 10% ක අවමය ලඟාකරගෙන නොමැත. දැනට පවතින ප්‍රාදේශීය සභා මාර්ගයන්ගෙන් 90%කම ජල බස්නා කාණු නොපවතින අතර 10%ක් පමණ මාර්ග කැටගල් අතුරා සංවර්ධන කර නොමැත. කාණු පද්ධතිය නොපවතින නිසා සුලු වර්ෂාවකදී පවා එම මාර්ග ජලයෙන් යටවීම දක්නට ලැබේ. අධ්‍යාපන ප්‍රදේශයේ පවතින දුම්රිය නැවතුම්පොළවල් ද ඉතා පැරණි සහ සංවර්ධනය කල යුතු තත්වයක පවතී.

### 2.3.6 ජලය සම්පාදනය

සංවර්ධන ප්‍රදේශය සඳහා ජලය ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍රය පොල්වතුමෝදර ගඟ වේ. කනංකේ ප්‍රදේශයේදී පොල්වතුමෝදර ගඟෙන් ලබාගන්නා ජලය හල්ලල පිහිටි පිරිපහදු මධ්‍යස්ථානය මගින් පිරිසිදු කරනු ලබන අතර, වැලිගම පිහිටි ජල ටැංකිය මගින් සංවර්ධන ප්‍රදේශය තුළට බෙදා හරිනු ලබයි. මෙමගින් දෛනිකව සපයනු ලබන ජලය ප්‍රමාණවත් නොවන බැවින් විසල් මාතර සංවර්ධන සැලැස්ම යටතේ නව ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම ආරම්භ කර ඇති අතර, එහි ඉදිකිරීම් කටයුතු අවසන් වූ විට ජල ගැටළුව විසඳෙනු ඇත. මීට අමතරව, ප්‍රදේශයේ ජනතාව ළිං මගින්ද පානීය ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබයි.

### 2.3.7 විදුලි සැපයුම

ජාතික විදුලිබල පද්ධතියෙන් දකුණු ප්‍රදේශයට විදුලිය සැපයීම කරනු ලබන්නේ මතුගම, ගාල්ල, දෙනියාය, ඇඹිලිපිටිය හා බලංගොඩ පිහිටි උප පොලවල් හරහාය. මාතර ප්‍රදේශයට විදුලිය සැපයීම මෙගාවොට් ඇම්පියර් 2 X 31.5 ධාරිතාවයකින් යුත් ග්‍රිඩ් උප පොලක් හරහා මාතර, ගොඩගම, මැද්දවත්ත හා කඹුරුපිටිය යන ස්ථානවල පිහිටා ඇති අධිසැර මාර්ගය හරහා සම්බන්ධ උප පොල මගින් සිදුකෙරේ.

ජාතික විදුලිබල මණ්ඩලය සමග පැවති සාකච්ඡාව අනුව සංවර්ධන ප්‍රදේශය සඳහා මුළුමනින්ම විදුලිය සැපයීමේ හැකියාව ජාතික විදුලිබල මණ්ඩලය සතුව ඇත.

### 2.3.8 අධ්‍යාපන පහසුකම්

වර්ෂ 2018 දත්ත අනුව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පාසල් 48 ක් පවතින අතර, ඉන් 1AB කාණ්ඩයට අයත් පාසල් 03ක් ද, මහා විද්‍යාල 13 ක්ද, කණිෂ්ඨ විද්‍යාල 19 ක්ද, ප්‍රාථමික විද්‍යාල වේ. පාසල්වල ක්‍රීඩා පිටි පහසුකම් ප්‍රමාණවත් නොවන මට්ටමක පවතින අතර සනීපාරක්ෂක පහසුකම් ද සතුටුදායක මට්ටමක නොපවතී.

### 2.3.9 සෞඛ්‍ය පහසුකම්

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කොටවිල නව දිස්ත්‍රික් මහ රෝහල පිහිටා ඇති අතර, මෙමගින් බාහිර හා අභ්‍යන්තර රෝගීන් සඳහා ප්‍රතිකාර ලබාදේ. මීට අමතරව, ග්‍රාමීය රෝහල් වන මිදිගම, මිරිස්ස, කඹුරුගමුව රෝහල්ද පිහිටා ඇති අතර වැලිපිටිය හා වට්ටක්ගොඩ ප්‍රදේශවල ආයුර්වේද රෝහල් 02 ක් පිහිටා ඇත.

### 2.3.10 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

වැලිගම ප්‍රාදේශීය සභාවේ සංවර්ධන අංශයෙන් ලබා ගන්නා දත්ත අනුව සංවර්ධන බල ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම වැලිගම ප්‍රාදේශීය සභාව මගින් සිදුකරනු ලැබේ. ප්‍රදේශය තුළ දිනකට එකතුවන කැලි කසල ප්‍රමාණය ටොන් 18 ක් පමණ වන අතර, එම මුළු ප්‍රමාණයම කඹුරුගමුව කොම්පෝස්ට් ව්‍යාපෘතිය පිහිටි භූමියට ගෙන යනු ලබයි. ප්‍රදේශයේ පවතින සංචාරක හෝටල්, ආපන ශාලා ආදිය මඟින් මෙන්ම නිවාස වලින් ඉවතලන දෛනික කසල බැහැර කිරීම් ප්‍රමාණය වැඩි වෙත්ම ඒවා බැහැර කිරීම් පිලිබඳ ගැටළු පවතී.

### 2.3.11 මළාපවාහනය

සංවර්ධන ප්‍රදේශය තුළ ඒකාබද්ධ පොදු මළාපවාහන පද්ධතියක් ක්‍රියාත්මක නොවන අතර, ජල මුද්‍රිත සනීපාරක්ෂක වැසිකිලි සහ සනීපාරක්ෂක නොවන වැසිකිලි භාවිතා වේ. වර්තමානය වන විට ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ ඇති වී ඇති දියුණුවත් සමග පොදු මළාපවාහන පද්ධතියක අවශ්‍යතාවය වැඩි වී ඇත.

### 2.3.12 පාරිසරික සංවේදී ස්ථාන

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන භූ ලක්ෂණය වන්නේ කි.මී. 18ක් දිග කඩතොළු සහිත වෙරළ තීරයක් පැවතීමත් ප්‍රදේශය හරහා ගලා බසින පොල්වත්ත ගංගාවත් වේ. වෙරළ කලාපය ආශ්‍රිතව දූපත්, කලපු, බොක්ක, ගං මෝය, වැලි වැටි වැනි භූ ලක්ෂණ දැකිය හැකිය. ඒ අනුව, වෙරළ ආශ්‍රිතව දැකිය හැකි ගිරාගල, මිරිස්ස ධීවර වරාය, ගරාඬුව කලපුව, පොල්වත්ත ගංගාව ආශ්‍රිතව කඩොලාන පවතින ප්‍රදේශය ඉහල

ජෛව විවිධත්වයක් ඇති ප්‍රදේශයන් වේ. එසේම, පොල්වත්ත ගංගාවත් හල්ලල ජලාශය, බොරාල වැව, නාපෙ වැව, ලැබීම වැව හා කඹුරුගමුව වැව යනාදිය ප්‍රධාන ජල මූලාශ්‍රයන් වේ.

මීට අමතරව කුඩේගල කන්ද රක්ෂිතයද, ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇති අනෙකුත් තෙත් බිම් හා කුඹුරු ඉඩම් ද ප්‍රදේශයේ පාරිසරික සමතුලිතතාවය රැකීමට මහෝපකාරී වේ.

# 3 වන පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය

## 3.1. හැඳින්වීම

විසල් මාතර සංවර්ධන සැලැස්ම යටතේ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය පහත කරුණු මත හඳුනා ගෙන ඇත.

1. විසල් මාතර සංවර්ධන සැලැස්මේ සංකල්පය සඳහා අනුගත වීම .
2. සංචාරක කර්මාන්තයේ සංවර්ධනය යොදා ගත හැකි සම්පත් ඌණ භාවිතයේ පැවතීම.
3. සැලසුම් නොකළ භූමි පරිහරණ රටාවේ වෙනස පාලනය සඳහා.
4. වෙරළබඩ ප්‍රදේශ තුළ පවතින සංවර්ධනය රට අභ්‍යන්තර ප්‍රදේශ තුළට ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය.

**<u>විසල් මාතර සංවර්ධන සැලැස්මේ සංකල්පය සඳහා අනුගත වීම.</u>**

විසල් මාතර සංවර්ධන සැලැස්ම පළාත් පාලන ආයතන 07 ක් ආවරණය වන ලෙස සංකල්පිත සැලැස්මක් යටතේ සකස් කර ඇති අතර එම සංකල්පිත සැලැස්මට අනුව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංචාරක සහ ධීවර පොකුරක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත.

විසල් මාතර සංවර්ධන සැලැස්මට අනුබද්ධව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින සංවර්ධන විභවතා උපරිම ප්‍රයෝජනයට ගනිමින් හා සංවර්ධන ගැටළු පාලනය කරමින් නිවැරදි දිශානතියක් කරා සංවර්ධනය මෙහෙය වීම සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මතු වී ඇත.

**<u>සංචාරක කර්මාන්තයේ සංවර්ධනය යොදා ගත හැකි සම්පත් ඌණ භාවිතයේ පැවතීම</u>**

වැලිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කිලෝමීටර් 18.0 ක් තෙක් විහිදුනු මුහුදු තීරය, මුහුදු දූපත්, කලපු හා තුඩු සහිත ස්වාභාවික පිහිටීම හේතුකොටගෙන සංචාරක කාර්මාන්තයට මනා විභවතාවයක් සැපයේ. විශේෂයෙන් මිරිස්ස ගිරාගල, මෝදර වෙරළතීරයේ පවතින මද රළ සහිත ස්වභාවය දෙස්විදෙස් සංචාරකයින් සඳහා රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා මනා ප්‍රවේශකත්වයක් සැපයෙන අතර මිරිස්ස වෙරළ තීරය ආශ්‍රිතව ගැවසෙන නිල් තල්මසුන් නැරඹීමටද සංචාරකයින් මහත් රුචිකත්වයක් දක්වයි. නමුත් මෙම විභාවතාවයන් දැනට පවතිනුයේ ඌණ භාවිතයේ වන බැවින් ඒවා

ප්‍රශස්ථ අයුරින් සංවර්ධනය කර සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට දායක කර ගැනීම මෙම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අවශ්‍යතාවයක් වේ.

තවද ප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට පාරිසරික ජෛව විවිධත්වයකින් යුත් බොරාල වැව, ගරාඩුව කලපුව හා කඩොලාන පරිසර පද්ධතීන් පවතින අතර මේවා නැරඹීමට සංචාරකයින් වැඩි කැමැත්තක් දක්වයි . මේ සඳහා පවතින දුර්වලතා ලෙස ප්‍රවේශ මාර්ග පටු වීම හා සංවර්ධනය නොවීම හා අනෙකුත් යටිතල පහසුකම් ඉතා අවම මට්ටමක පැවතීම දැකිය හැකිය. එබැවින් මෙම ප්‍රදේශ සංචාරකයින් සඳහා විවෘත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයිය යුතුය.

**<u>සැලසුම් නොකළ භූමි පරිහරණ රටාවේ වෙනස පාලනය සඳහා</u>**

සමාජ ආර්ථික හා තාක්ෂණික වෙනස්කම් මත සැලැසුම් බල ප්‍රදේශය තුළ භූමි පරිහරණ රටාවේ සිඝ්‍ර වෙනස්කම් වලට ලක් ව ඇත. විශේෂයෙන්ම වෙරළ තීරය ආශ්‍රිත සංචාරක කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු ඉතා අවිධිමත් ආකාරයෙන් සිදුකරන අතර ඒවා පාරිසරික සංවේදී ප්‍රදේශද ආක්‍රමණය කරමින් එම පරිසර පද්ධතින්ට හානිකර ලෙස ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. එබැවින් වෙරළ තීරය විධිමත් සංවර්ධන සැලැස්මකට අනුව සංවර්ධන කටයුතු සැලසුම් කල යුතුව ඇත. තවද අවිධිමත් භූමි පරිහරණ රටාව මත ස්වාභාවික ආපදා තත්ත්වයන් ඇති විම,පරිසර දූෂණ තත්ත්වයන් ඉහළ යාම,සමාජීය ගැටළුකාරි තත්වයන් ඇති වීම හඳුනා ගත හැක.

විධිමත් සැලසුම් සහගත භූමි පරිහරණ රාටාවක් තුළින් සුව පහසු පරිසරයක් නිර්මාණය කළ හැකි අතර ඒ මඟින් තිරසාර සංවර්ධනයක් කරා පහසුවෙන් ගමන් කිරිමේ හැකියාවද ලැබෙනු ඇත. සැලසුම් සහගත භූමී පරිහරණයක් ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීයකරණ සැලැස්මක් අවශ්‍ය වන අතර,මෙහිදි වෙන් වෙන් වූ කලාප සඳහා රෙගුලාසි හඳුන්වා දීම තුලින් විධිමත් භූමි පරිහරණ ක්‍රමවේදයක් ස්ථාපනය කර ඇත.

**<u>වෙරළබඩ ප්‍රදේශ තුළ පවතින සංවර්ධනය රට අභ්‍යන්තර ප්‍රදේශ තුළට ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය</u>**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙරළාසන්න ප්‍රදේශවල සංවර්ධන කටයුතු වැඩි වශයෙන් ව්‍යාප්ත වීමක් දැකිය හැකිය. 2022 ජන සංඛ්‍යා ලේඛනවලට අනුව වෙරළාසන්න ප්‍රදේශවල ජනගහනය අනෙක් ප්‍රදේශ හා සැසඳීමේදී වැඩි ඝනත්වයක් පෙන්නුම් කරන බවට හඳුනාගත හැකිය. මේ නිසා වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කැලිකසල බැහැර කිරීමේ ගැටළු, අනවසර ඉදි කිරිම් හා මුහුදු ඛාදනය දැක් විය

හැකිය. ඒ තුලින් දර්ශනීය වෙරළ අහිමි වීම හා සංචාරක ආකර්ෂනීය බව අඩුවීම ප්‍රදේශයේ ආර්ථිකයට සෘණාත්මක බලපෑමක් එල්ල විය හැකිය. එබැවින් අධ්‍යයන ප්‍රදේශය පුරා විහිදුනු තුළනාත්මක සංවර්ධනයක් ඇති කිරීම සඳහා විධිමත් නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවයක් පවතී.

## 3.2. හඳුනාගත් ගැටළු

### 3.2.1. සංචාරක කර්මාන්තය ආශ්‍රිත වෙරළ පිවිසුම් මාර්ග පටු වීම

සංවර්ධන බල ප්‍රදේශය තුළ සංචාරක ආකර්ෂණය සහිත පුළුල් වෙරළ තීරයක් පිහිටා ඇති අතර කඹුරුගමුව, තල්අරඹ, මිරිස්ස, පැලෑන, මිදිගම ප්‍රදේශවල පිහිටා ඇති වෙරළ පිවිසුම් මාර්ග පටු වීම හා පෞද්ගලික ඉඩම් හිමියන් විසින් මෙම මාර්ග අවහිර කිරීම සංචාරක කර්මාන්තයේදී මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන් වෙරළ කලාපය සඳහා සංචාරකයන්ගේ දැඩි ආකර්ශනයක් ඇති අතර පවතින වෙරළ මාර්ග වල පටු බව හේතුවෙන් සංචාරකයන්ට වාහන මගින් එම ප්‍රදේශයන්ට ඇතුළු වීමේ ගැටළු මතු වී ඇත.

මිරිස්ස ධීවර වරායේ ඇති ප්‍රවේශ මාර්ගයේ පවතින පටු බව හේතුවෙන් තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් දැඩි අපහසුතවයකට ලක්වනු දක්නට ලැබේ. තවද , වෙරළ තීරය තුළ පෞද්ගලික හෝටල් හිමියන් විසින් වැට මායිම් ගසා වෙරළ වෙන් කර ගැනීම හේතුවෙන් වෙරළ දර්ශන පථයට බාධා පමුණුවන අතර පිවිසුම් මාර්ගද අවහිර වීමක් දැකිය හැක.

**ඡායාරූප අංක 2 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - පටු වෙරළ පිවිසුම් මාර්ග**




**මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය**

### 3.2.2. ප්‍රධාන මාර්ග දෙපස විධිමත්ව සංවර්ධනය නොවීම.

සංවර්ධන බල ප්‍රදේශයේ සමස්ථයක් ලෙස ගත්විට එකිනෙකට සම්බන්ධ මාර්ග ජාලයක් පැවතියද ප්‍රධාන මාර්ග දෙපස පදික මංතීරු නොමැති වීම, (විශේෂයෙන් සංචාරක කලාපය තුළ) හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයින් විවිධ ගැටළු වලට මුහුණපායි. මිරිස්ස, පැළැන.වැලිගම, කඹුරුගමුව වැනි සංචාරකයින් බහුලව ගැවසෙන ප්‍රදේශයේ පදික මංතීරු නිසි පරිදි සංවර්ධනය නොවීම, ප්‍රධාන මාර්ග දෙපස රාත්‍රී කාලයේදී ආලෝකමත් නොවීම, ජලය බැසයාමේ ක්‍රමවත් කාණු පද්ධතියක් නොමැති වීම හේතුවෙන් සංචාරක ආකර්ශනීයත්වය අඩු වීමෙන් ප්‍රදේශයේ ආර්ථිකයට සෘණාත්මක බලපෑමක් එල්ල වී ඇත.

**ඡායාරූප අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - විධිමත් ලෙස සංවර්ධනය නොවූ මාර්ග.**



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 3.2.3. තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පොදු පහසුකම් නොමැති වීම

දකුණු ලක තල්මසුන් නැරඹීම සඳහා ප්‍රධාන ප්‍රවේශකත්වය සපයන මිරිස්ස ධීවර වරාය ආශ්‍රිත පරිශ්‍රය තුළ සංචාරකයින්ට අවශ්‍ය ආපනශාලා, වැසිකිළි, තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන, විවේක පහසුකම්, පොදු පහසුකම් නොමැති වීම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට අහිතකර ලෙස බලපා ඇති අතර මිරිස්ස ධීවර වරාය සඳහා පවතින ප්‍රවේශ මාර්ගය පටු වීම රථවාහන නැවතුම් ඉඩපහසුකම් ප්‍රමාණවත් නොවීමද ගැටළු ලෙස හඳුනාගෙන ඇත.

**ඡායාරූප අංක 4 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පොදු පහසුකම් නොමැති වීම**




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 3.2.4. කොටවිල නව නගරය ආශ්‍රිත යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

කොටවිල නව නගර සැලැස්ම යටතේ කොටවිල ලැබීම මහරෝහලට හා උසාවි සංකීර්ණයට සේවය ලබා ගැනීම සඳහා පැමිණෙ මහ ජනතාවට අවශ්‍ය පොදු ප්‍රවාහන සේවා ප්‍රමාණවත් නොවීම හා බස් නැවතුම්පොළක් නොමැති වීමෙන් එම සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාව දැඩි අපහසුතාවයකට ලක් වී ඇත. තවද , එම ප්‍රදේශය තුළ වාණිජ පහසුකම් සහ අනෙකුත් යටිතල පහසුකම් නොමැති වීමද නව නගර සංවර්ධන සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් තවදුරටත් ඌණ භාවිතයේ පැවතීමද ප්‍රදේශයේ පවතින ගැටළු ලෙස හඳුනාගත හැක.

### 3.2.5. විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයන් නොමැති වීම

ක්‍රමවත් ලෙස ඝණ අපද්‍රව්‍ය බැහැර කිරිමේ ස්ථානයක් නොමැති වීම නාගරික ප්‍රදේශයේ පවතින ප්‍රබල ගැටළුවක් ලෙස හඳුනා ගත හැකි අතර මේ වන විට කොටවිල නව නගර මධ්‍ය තුළ මාතර මහා නගර සභාව මගින් පවත්වාගෙන යන කැලිකසල අංගනය හේතුවෙන් ප්‍රදේශයේ පාරිසරික, සමාජයීය ගැටළු රාශියක් ඇති කිරීමට හේතු වී ඇත. තවද , ගරාඩුව කලපුව වැනි අධික පාරිසරික සංවේදි ස්ථානයන්ට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම පරිසර පද්ධතියට හානිදායක ලෙස බලපා ඇත.

**ඡායාරූප අංක 5 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - අවිධිමත් ඝණ අපද්‍රව්‍ය බැහැර කිරීම**



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 3.2.6. කුඩා සේවා මංසන්ධි ආශ්‍රිත යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

සංවර්ධන ප්‍රදේශය තුළ දෙනිපිටිය, වැලිපිටිය, කනංකේ වැනි මංසන්ධි ආශ්‍රිතව සේවා මධ්‍යස්ථාන පිහිටා ඇති අතර මෙම මධ්‍යස්ථාන ක්‍රමිකව වර්ධනය වීමක් දක්නට ලැබේ. නමුත් මෙම සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව විධිමත් වාණිජ පහසුකම් නොමැති වීමත් , මංසන්ධි පටු වීම, රථ වාහන පහසුකම් නොමැති වීමත් , සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව පවතින මහජන පොළ ඌන භාවිතයේ පැවතීම වැනි ගැටළු පවතී.

**ඡායාරූප අංක 6 : අවිධිමත්ව සංවර්ධනය වී ඇති උප සේවා මධ්‍යස්ථාන**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

දෙනිපිටිය මංසන්ධිය වැලිපිටිය මංසන්ධිය



මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 3.2.7. සංචාරක කර්මාන්තය ආශ්‍රිත වෙරළ කලාපයේ අවිධිමත් ඉදිකිරීම්

සංචාරක කර්මාන්තය ආශ්‍රිත වෙරළ කලාපයේ අවිධිමත් ඉදිකිරීම් ඉහල යාමත් එම ඉදිකිරීම් පාරිසරික සංවේදී ස්ථාන ආශ්‍රිතව දැකිය හැක. විශේෂයෙන්ම පොල්වතුමෝදර ගහ රක්ෂිත ප්‍රදේශය, ගරඬුව කලපුව ආශ්‍රිත ප්‍රදේශය හා කඩොලාන සහිත වෙරළ වගුරු සහිත ස්ථානවල මෙම අවිධිමත් ඉදිකිරීම් දක්නට ලැබේ. මේ හේතුවෙන් සුලු වර්ෂාවකදී පවා ප්‍රදේශයේ ස්ථාන රැසක් ජලයෙන් යට වීමත්, පරිසර සංවේදී ප්‍රදේශවල පාරිසරික සමතුලිතතාවය බිඳ වැටීම, ගරාඬුව කලපුව හා සම්බන්ධිත ඇළ මාර්ග දෙපස ඉදිකිරීම් හේතුවෙන් ස්වභාවික ජල බැසයාම අවහිර වීම සිදු වී ඇත. තවද මෙම ඉදිකිරීම් තුලින් ස්වභාවික දර්ශන පථයන් ද අවහිර වී ඇත.

**ඡායාරූප අංක 7 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - වෙරළ කලාපයේ අවිධිමත් ඉදිකිරීම්**




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

## 3.3. හඳුනාගත් විභවතා

### 3.3.1. සංචාරක කර්මාන්තයට මනා විභවතාවයක් පැවතීම

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්ළ කඹුරුගමුව සිට මිදිගම දක්වා වන කි. මී. 18 ක් දිගු වෙරළ තීරය දර්ශනීය කඩතොළු සහිත වෙරළ තීරයක් වේ. තවද වැලිගම ආශ්‍රිත මුහුද රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාවට මනා ප්‍රවේශකත්වයක් සැපයීම , පොල්වතුමෝදර ගංගාව සැලසුම් බල ප්‍රදේශයේ එක් කොටසකින් ගලාගෙන යාම, මිරිස්ස වෙරළ තීරය ආශ්‍රිත ගැවසෙන තල්මසුන්, ජෛව විවිධත්වයෙන් යුත් ගරාඩුව කලපුව හා කඩොලාන පරිසර පද්ධතියක පිහිටීම හා ආකර්ශනීය පාරම්පරික රිටි පන්න ධීවර ක්‍රම මෙම සැලසුම් බල ප්‍රදේශය තුළ පිහිටා තිබීම මත දෙස් විදෙස් සංචාරකයින් ඇද ගැනීමට හේතු වී ඇත. විශේෂයෙන්ම මිරිස්ස, ගිරාගල වැනි ප්‍රදේශ ආශ්‍රිතව පවතින සංචාරක කර්මාන්තය මගින් ජාතික ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දෙන අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මිරිස්ස ප්‍රදේශය ප්‍රධාන සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

ඡායාරූප අංක 8: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - සංචාරක කර්මාන්තය සම්බන්ධ විභවතා

මිරිස්ස වෙරළ තීරයේ තල්මසුන්





ගිරාගල වෙරළ

රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාව -

ැස්





කොකනට් ට්‍රී හිල් නැරඹුම් ස්ථානය



කැස්බෑ නැරඹුම් - මිදිගම/



රිටිපන්න ධීවර කර්මාන්තය මිදිගම





ගරාඬුව කලපුව





බොරාල වැව





මලබාර් හිල් හෝටලය



බාබේරියන් හෝටලය



**තරු පන්තියට අයත් සංචාරක හෝටල්**

**සර්ෆ් හෝටලය**



**මන්දරා හෝටලය**



**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර සහ අන්තර් ජාලය**

### 3.3.2. දක්ෂිණ අධිවේගී මාර්ගය, වෙරළබඩ දුම්රිය මාර්ගය සහ මාතර කොළඹ ප්‍රධාන මාර්ගය සමග සෘජුව සම්බන්ධවීම සහ කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානය පිහිටා තිබීම.

වැලිගම ප්‍රදෙශීය සභා බල ප්‍රදේශය අන්තර් කලාපීය වැදගත්කමක් ඇති A ශ්‍රේණියේ මහා මාර්ගයක් වන කොළඹ වැල්ලවාය මාර්ගයෙන්ද දුම්රිය නැවතුම් ස්ථාන 06කින් යුත් කොළඹ - බෙලිඅත්ත දුම්රිය මාර්ගයෙන්ද , කොක්මාදුව පිවිසුමෙන් යුත් දක්ෂිණ අධිවේගී මාර්ගය හා මනාව සම්බන්ධව පිහිටා ඇත.

ඡායාරූප අංක9:වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - බහුවිධ ප්‍රවාහන සේවයක් පැවතීම



**මාතර කොළඹ ප්‍රධාන**



**දුම්රිය**



**දක්ෂිණ අධිවේගී**

**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර සහ අන්තර් ජාලය**

### 3.3.3. කොටවිල නව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නව උසාවි සංකීර්ණය හා ලැබීම මහා රෝහල ස්ථාපිත කිරීම

මාතර නගරයේ දකුණු පළාතේ ප්‍රධාන වාණිජ හා සේවා මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමත් නගරය පුරා විසිරී ඇති රජයේ ගොඩනැගිලි එක් ස්ථානයකට ඒකරාශී කොට ජනතාවට ඉතා උසස් සේවාවක් ලබාදීමත් විසල් මාතර සංවර්ධන සැලැස්මේ එක් අරමුණක් වී ඇත. එම අරමුණින් මාතර නගරයේ සිට කි.මී. 10.5 ක පමණ දුරින් පිහිටි වැලිගම ප්‍රාදේශීය සභාවට අයත් කොටවිල ප්‍රදේශයේ කොටවිල උතුර, කඹුරුගමුව උතුර හා කඹුරුගමුව දකුණ යන ග්‍රාම නිලධාරී වසම්වල පිහිටි අක්කර 142.0 බිම් ප්‍රමාණයක් රජයට අත්පත් කරගෙන නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරන ලද සැලැස්මකට අනුව නව නගර සංවර්ධනයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ.

මේ යටතේ දැනටමත් මාතර මහ රෝහලේ එක් කොටසක් කොරියානු ආධාර යටතේ ඉදිකර ඇති අතර, කොටවිල පොලීසිය, සුරාබදු කාර්යාලය, ක්‍රීඩා සංකීර්ණය, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කොටසක් හා මාතර අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් අවසන් කර කාර්යාල ගොඩනැගිල්ලද ඉදිකිරීමට යෝජිතය. මීට අමතරව මෙම භූමිය තුළ නව බස් නැවතුම්පොල, වාණිජ සංකීර්ණය, රජයේ නිල නිවාස, උද්භිද උද්‍යානය, අංග සම්පූර්ණ පුහුණු මධ්‍යස්ථානයක් හා නව පාසලක් ඉදිකිරීමට යෝජිතය.

**ඡායාරූප අංක 10 :** වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - **කොටවිල නව නගර සැලැස්ම**




**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර**

### 3.3.4. අනාගත සංවර්ධනය සඳහා යොදාගත හැකි හිස් ඉඩම් පැවතීම සහ කර්මාන්තපුර දෙකක් පැවතීම.

සංවර්ධන බල ප්‍රදේශය තුළ වෙරළ කලාපයේ අභ්‍යන්තරයට යන විට අනාගත සංවර්ධනය සඳහා යොදා ගත හැකි ඉඩම් හඳුනාගත හැකිය. විශේෂයෙන් කොටවිල, වාලි මවුන්ට්, උඩුකාව වැනි ප්‍රදේශවල අනාගත සංවර්ධනයට යොදාගත හැකි ඉඩම් පවතී. සංවර්ධන බල ප්‍රදේශයේ ඉඩම් පරිභෝග රටාව අනුව හිස් ඉඩම් හෙක්ටයාර 148ක් පවතින අතර ඒවා අනාගත සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි වේ.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යටතේ පාලනය වන වාලි මවුන්ට් හා උඩුකාව කර්මාන්තපුර දෙකක් පවතින අතර රබර් ආශ්‍රිත ප්‍රධාන නිෂ්පාදන කර්මාන්තශාලාවක් වන ලෝඩ්ස්ටාර් මෙම ප්‍රදේශයේ ස්ථානගත වී ඇත.

**ඡායාරූප අංක 11 :** වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - **සංවර්ධනය සඳහා යොදාගත හැකි ඉඩම්**



**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර**

**ඡායාරූප අංක 12 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ලෝඩ්ස්ටා කර්මාන්ත ශාලාව**



**මූලාශ්‍රය : නාගරික සංවර්ධන හා අන්තර් අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර**

**3.3.4.1. සැලසුම් බල ප්‍රදේශය තුළ සංවර්ධනය වෙමින් පවතින කුඩා සේවා මධ්‍යස්ථාන පැවතීම.**

සැලසුම් බල ප්‍රදේශය තුළ දෙනිපිටිය, වැලිපිටිය , කනංකේ වැනි මංසන්ධි ආශ්‍රිතව සේවා සපයන මධ්‍යස්ථාන පිහිටා ඇති අතර මෙම මධ්‍යස්ථාන ක්‍රමිකව සංවර්ධනය වීම ද ප්‍රදේශයේ ප්‍රධාන විභවතාවයක් වේ .

# 04 වන පරිච්ඡේදය

# සංවර්ධන සැලසුම් රාමුව

## 4.1 දැක්ම

*"The Alluminative City of Matara"*

***"මාතර පුරවරයේ නොනිදන සංචාරක නාගරිකය"***




***පවත්නා ස්වාභාවික පරිසරය ප්‍රශස්ත භාවිතයට යොමු කරමින් සංචාරක හා ආර්ථික නවෝදය තුලින් නොනිදන සංචාරක නාගරිකයක් ලෙස සංවර්ධනය කිරීමයි.***

## 4.2 දැක්මේ ප්‍රකාශය

මාතර දිස්ත්‍රික්කයේ ආරම්භය වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දර්ශනීය ගොයියපාන කලපුව අසලින් පටන්ගන්නා අතර මිදිගම , පැලැන , මිරිස්ස හා කඹුරුගමුව යන කඩතොළු හා දූපත් සහිත ඉතා දර්ශනීය වෙරළ තීරයන්ගෙන් සමන්විත වේ. මුහුදු තීරයේ සුන්දරත්වය මෙන්ම වටිනාකම වැඩිකිරීම සඳහා මිරිස්ස ආශ්‍රිත මුහුදෙහි ගැවසෙන නිල් තල්මසුන්, ඩොල්ෆින්, කැස්බෑවන්ද, රළමත ලිස්සායාමේ ක්‍රීඩාව පුහුණු වීමට උචිත පැලැන මුහුදු තීරය සහ වෙරළ ක්‍රියාකාරකම් සිදු කිරීමට උචිත පළල් වෙරළ ද ඉවහල් වී ඇත. වෙරළ කලාපයෙන් ගොඩබිම දෙසට ජෛව විවිධත්වයෙන් යුත් වැව්, තෙත් බිම් , කලපු වන රක්ෂිත වලින් සමන්විත ස්වාභාවික පරිසර පද්ධතියක් මෙම ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතී. මෙම ආකර්ශනීය සුන්දරත්වය අත්විඳීමට දෙස් විදෙස් සංචාරකයින් ප්‍රදේශයට විශාල වශයෙන් පැමිණීම හේතුවෙන් මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ගමනාන්තයක් ලෙස ජාත්‍යන්තර වශයෙන්ද ප්‍රසිද්ධියට පත්ව ඇත.

එබැවින් ප්‍රදේශයේ පවතින ආකර්ශනීය වෙරළ කලාපයන් හා රට අභ්‍යන්තරයේ පවතින ජෛව විවිධත්වයෙන් යුතු පාරිසරික ස්ථාන සංරක්ෂණය කරමින් සංචාරක ගමනාන්තයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් සංචාරකයින් සඳහා බහුවිධ ක්‍රියාකාරකම් සහිත නොනිදන සංචාරක නාගරිකයක් කරා ගෙන යාමට මෙහිදී අපේක්ෂා කෙරේ.

තවද, වර්ෂ 2033 වන විට වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත ක්ෂේත්‍රයේ, පරිපාලන හා සේවා යන බහුවිධ ආර්ථික කටයුතු මනා ලෙස සංකලනය කර ගනිමින් ශක්තිමත් ප්‍රාදේශිය ආර්ථිකයක් සහිත නාගරිකයක් ගොඩනැන්වීමද මෙම සැලස්මේ අරමුණු වේ.

## 4.3 අරමුණු

සංවර්ධන ප්‍රදේශයෙහි පවත්නා ප්‍රධාන ප්‍රබලතා, දුබලතා, අවස්ථා හා අවහිරතා විශ්ලේශනය කිරීම තුලින් ගොඩනගා ගන්නා ලද අරමුණු දෙකක් ඔස්සේ සැලැස්මෙහි දැක්ම ලගා කර ගැනීම අපේක්ෂා කෙරේ. එනම්,

**අරමුණ 01** - **වසර 2033 වන විට පවත්නා පාරිසරික නියමයන් ආරක්ෂා කර ගනිමින් මාතර දිස්ත්‍රික්කයේ ආකර්ශනිය සංචාරක ප්‍රදේශයක්**

**අරමුණ 02** - **දිස්ත්‍රික්කයේ නේවාසික ජනතාවට අවශ්‍ය පරිපාලන සේවා පහසුකම් විධිමත්ව සංවර්ධනය කිරීම**

## 4.4 පරමාර්ථ

**අරමුණ 1** - වසර 2033 වන විට පවත්නා පාරිසරික සම්පත් ආරක්ෂා කර ගනිමින් මාතර දිස්ත්‍රික්කයේ ආකර්ශනීය සංචාරක පුරය බවට පත් කිරීම යන්න සාක්ෂාත් කර ගැනීම සඳහා පහත පරමාර්ථ ඔස්සේ ක්‍රියා කරනු ලැබේ.

**පරමාර්ථ**

1. 2033 වසර වනවිට මිරිස්ස, කඹුරුගමුව, මිදිගම යන වෙරළ තීරය බහුවිධ සංචාරක ක්‍රියාකාරකම් සහිත ආකර්ශනිය වෙරළ තීරයක් ලෙස සංවර්ධනය කිරීම හා ඊට අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම.

2. වර්ෂ 2033 වන විට දකුණු මුහුද කේන්ද්‍ර කොටගත් සංචාරක ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සඳහා මිරිස්ස ධීවර වරාය ආශ්‍රිත කලාපය සංවර්ධනය කිරීම.

3. සංවර්ධන ප්‍රදේශයේ අභ්‍යන්තරය තුළ පවතින ජලාශ්‍රිත ප්‍රදේශ වන පොල්වතුමෝදර ගඟ, ගරාඬුව කලපුව, කඹුරගමුව වැව, බොරාල

**අරමුණ 2** -

දිස්ත්‍රික්කයේ නේවාසික ජනතාවට අවශ්‍ය පරිපාලන හා සේවා පහසුකම් විධිමත්ව සංවර්ධනය කිරීම.

**පරමාර්ථ**

1. වසර 2033 වන විට කර්මාන්ත, පරිපාලන, සේවා කටයුතු පුලුල් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

2. වසර 2033 වනවිට මිදිගම දෙනිපිටිය, වැලිපිටිය, කනංකේ සහ කඹුරුගමුව වැනි මංසන්ධි උප නාගරික මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය

# 05 වන පරිච්ඡේදය

# ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබද විශ්ලේෂණය

## 5.1. සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය

උපාය මාර්ගික ශදුඅත විශ්ලේෂණය යනු දැක්ම පදනම් කරගත් මූලික ඇගයුමකි. එහිදී දැක්ම වෙත ළඟාවීමට වැලිගම නාගරික සංවර්ධන ප්‍රදේශය සතුව අභ්‍යන්තරව සහ බාහිරව පවත්නා අවස්ථා සහ තර්ජන පිළිබඳව සළකා බලා ඇත.

**අරමුණ 1 -** **වසර 2033 වන විට පවත්නා පාරිසරික නියමයන් ආරක්ෂා කර ගනිමින් මාතර දිස්ත්‍රික්කයේ ආකර්ශනීය සංචාරක ප්‍රදේශයක් බවට පත් කිරීම.**

| | | | |
|---|---|---|---|
| 1. සංචාරක සංවර්ධන අධිකාරිය මගින් හඳුනාගත් ඉතා ජනප්‍රිය සංචාරක ගමන් මාර්ගයේ පිහිටා තිබීම.<br>2. මිරිස්ස ධීවර වරාය පිහිටීම හා එය දකුණු ලක මසුන් නැරඹීම සඳහා ප්‍රසිද්ධ වීම.<br>3. කි.මී. 18 කින් යුත් කඩතොළු සහිත දර්ශනීය වෙරළ තීරයක් පිහිටීම.<br>4. රළමත ලිස්සා යාමේ ක්‍රීඩාව සඳහා සුදුසු මද රළ සහිත පුළුල් වෙරළ තීරය පිහිටීම.<br>5. සංචාරක ආකර්ශනය සහිත ජෛව විවිධත්වයෙන් යුත් ස්වභාවික ජල පද්ධති පිහිටා තිබීම.<br>6. බාබේරියන්, ද පැලස්, කේප්, මලබාර් හිල්, වැනි තරු පන්තියේ ප්‍රසිද්ධ හෝටල් පිහිටා තිබීම.<br>7. දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - වැල්ලවාය මාර්ගය, කොළඹ - බෙලිඅත්ත දුම්රිය මාර්ගය සමග සෘජුව සම්බන්ධ වීමට හැකිවීම.<br>8. රිටිපන්න ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් ඉසිලීම සහ විවිධාංගීකරණය කරන ලද මත්ස්‍ය නිෂ්පාදන අලෙවියට ඇති හැකියාව | ශ | දු | 1. වෙරළ තීරය අපිරිසිදු ස්වභාවයෙන් යුක්ත වීම හා වෙරළ පිවිසුම් මාර්ග පටුවීම.<br>2. රළමත ලිස්සායාමේ ක්‍රිඩාව සඳහා අවශ්‍ය පහසුකම් හා සුදුසුකම්ලත් පුහුණුකරුවන් නොමැතිවීම.<br>3. ප්‍රමාණවත් රථගාල් පහසුකම් නොමැතිවීම සහ ප්‍රධාන මාර්ග දෙපස පදික වේදිකා නොමැතිවීම.<br>4. ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම සඳහා දැනුම නොමැතිවීම.<br>5. තල් මසුන් නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා පහසුකම් ප්‍රමාණවත් නොවීම. |
| 1. සංචාරකයින් මෙරටට පැමිණීම ක්‍රමිකව වර්ධනය වීම.<br>2. සංචාරක සංවර්ධන අධිකාරිය මගින් සකස් කරනු ලබන සංචාරක කලාප සැලැස්මට මිරිස්ස සහ මිදිගම ප්‍රදේශ හඳුනාගෙන තිබීම. | අ | ත | 1. උණවටුන, පොල්හේන, කොග්ගල වැනි සංචාරක ප්‍රදේශයන් පැවතීම. |

**අරමුණ 2** - **දිස්ත්‍රික්කයේ නේවාසික ජනතාවට අවශ්‍ය පරිපාලන හා සේවා පහසුකම් විධිමත්ව සංවර්ධනය කිරීම**

| | | | |
|---|---|---|---|
| 1. කොටවිල නව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නව උසාවි සංකීර්ණය හා කොටවිල මහ රෝහල ස්ථාපිත කිරීම.<br>2. අභ්‍යන්තර ප්‍රදේශ වෙරළ ප්‍රදේශයට සාපේක්ෂව ස්වභාවික ආපදා අවම කලාපයක් වීම.<br>3. අනාගත සංවර්ධනයට යොදාගත හැකි හිස් ඉඩම් පැවතීම.<br>4. සංවර්ධනය කළ හැකි ප්‍රදේශය පුරා විහිදුනු අභ්‍යන්තර මාර්ග පද්ධතියක් පැවතීම හා එම මාර්ග පද්ධතිය මගින් දක්ෂිණ අධිවේගී මාර්ගය හා කොළඹ බෙලිඅත්ත දුම්රිය මාර්ගය සමඟ කෙටි කාලයකින් සම්බන්ධ විය හැකි වීම.<br>5. සංවර්ධනය කළ හැකි ප්‍රදේශය පුරා විහිදුනු අභ්‍යන්තර මාර්ග පද්ධතියක් පැවතීම හා එම මාර්ග පද්ධතිය මගින් දක්ෂිණ අධිවේගී මාර්ගය හා කොළඹ බෙලිඅත්ත දුම්රිය මාර්ගය සමඟ කෙටි කාලයකින් සම්බන්ධ විය හැකි වීම.<br>6. සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින ඇතැම් මංසන්ධි දැනටමත් සේවා සපයන කුඩා මධ්‍යස්ථාන ලෙස වර්ධනයක් දක්නට ලැබීම.<br>7. ජල සම්පාදන මණ්ඩලය මගින් අදියර IV ව්‍යාපෘතිය යටතේ සංවර්ධන ප්‍රදේශය සඳහා නල ජල සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම. | ශ | දු | 1. නව උසාවි සංකීර්ණය හා ලැබීම නව මහ රෝහලට ප්‍රවේශය ලැබෙන ප්‍රධාන ප්‍රවේශ මාර්ග විධිමත් ලෙස සංවර්ධනය වී නොතාබීම.<br>2. කොටවිල ප්‍රදේශයේ අධිකරණ සංකීර්ණයට හා සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනිම සඳහා රෝහලට පැමිණෙන මහජනතාවට අවශ්‍ය පොදු ප්‍රවාහන සේවය ප්‍රමාණවත් නොවීම හා බස් නැවතුම් පොලක් නොමැති වීම.<br>3. කොටවිල ප්‍රදේශයේ උසාවි සංකීර්ණයට හා සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනිම සඳහා පැමිණෙන මහජනතාවට අවශ්‍ය වාණිජ සේවාවන් ප්‍රමාණවත් නොවීම.<br>4. අභ්‍යන්තර මාර්ග පටුවීම හා ප්‍රමාණවත් පරිදි සංවර්ධනය වී නොතිබීම.<br>5. විසල් මාතර නාගරික ප්‍රදේශය තුළ විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවීම. |
| 1. ගාල්ල පරිපාලන නගරය හා මාතර වාණිජ නගරය ආසන්නව පිහිටා තිබීම.<br>2. ගාල්ල හා හම්බන්තොට වරාය ගුවන්තොටුපල ආසන්නව පිහිටා තිබීම. | අ | ත | **1.** කොග්ගල කර්මාන්ත පුරය ආසන්නව පැවතීම. |

## 5.2. විස්තරාත්මක ශ . දු .අ . ත. විශ්ලේෂණය

අරමුණ 1 - වසර 2033 වන විට පවත්නා පාරිසරික නියමයන් ආරක්ෂා කර ගනිමින් මාතර දිස්ත්‍රික්කයේ ආකර්ශනීය සංචාරක ප්‍රදේශයක් බවට පත් කිරීම.

- **ශක්තීන්**

**1. සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් හඳුනාගත් ඉතා ජනප්‍රිය සංචාරක ගමන් මාර්ගයේ පිහිටා තිබීම.**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයින් දිවයිනේ රැඳී සිටින කාලය පදනම් කරගෙන හඳුන්වාදී ඇති දින 07, දින 11, දින 14 යන ගමන් මාර්ග ආවරණය වන ලෙස වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පිහිටා තිබීම මාතර දිස්ත්‍රික්කයේ ආකර්ශනීය සංචාරක පුරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ප්‍රබල ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

**සිතියම් අංක 4 : ශ්‍රී ලංකාවේ සංචාරක ගමන් මාර්ග**




මූලාශ්‍රය : සංචාරක සංවර්ධන අධිකාරිය, 2021

**2. මිරිස්ස ධීවර වරාය පිහිටීම හා එය දකුණුලක නිල් තල්මසුන් නැරඹීම සඳහා ප්‍රසිද්ධ වීම.**

මාතර දිස්ත්‍රික්කයේ ධීවර කටයුතු සඳහා ප්‍රසිද්ධ මිරිස්ස ධීවර වරාය සංවර්ධන බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අතර, ධීවර කටයුතු සඳහා පහසුවෙන් යෙදවිය හැකි ශ්‍රම බලකායක් සහිතවීමද වටිනා සම්පතකි. මිරිස්ස ධීවර වරාය තුළ බහුදින ධීවර යාත්‍රා 220 ක් නවතා තැබිය හැකි අතර, සංචාරක කර්මාන්තය සඳහා යොදාගන්නා යොට් යාත්‍රා 04 ක් සහ සංචාරකයින් ප්‍රවාහනය කරනු ලබන ධීවර යාත්‍රා 15 ක් පමණ පවතී. මිරිස්ස ධීවර වරාය ධීවර කර්මාන්තයට පමණක් නොව නිල් තල්මසුන් නැරඹීමේ මධ්‍යස්ථානයක් වශයෙන්ද ප්‍රසිද්ධය. මිරිස්ස ධීවර වරාය තුළට තල්මසුන් නරඹන කාල සීමාව තුළදී දෛනිකව සංචාරකයින් 500 – 600 ක් අතර ප්‍රමාණයක් පැමිණෙන අතර, 2019 වර්ෂයේ පැමිණි සංචාරකයින් ප්‍රමාණය 200,000 ඉක්මවා ගොස් ඇත.

**ඡායාරූප අංක 13 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - මිරිස්ස ධීවර වරාය**




**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර සහ අන්තර්ජාලය**

**3. කි.මී. 18.0 කින් යුත් කඩතොළු සහිත දර්ශනීය වෙරළ තීරයක් පිහිටීම.**

සංවර්ධන බල ප්‍රදේශය තුළ කි.මී. 18.0 ක දිගින් යුත් කඳු, බොකු, කලපු, තුඩු, වැලි මැටි දූපත් වැනි විවිධ භූ විෂමතා ලක්ෂණයන්ගෙන් යුතු වෙරළ තීරයක් පිහිටා ඇති අතර, කොකනට් හිල් නැමති නැරඹුම් ස්ථානයද (Viewing Point) පිහිටා ඇත. මෙම හේතුව මත කඹුරුගමුව, මිරිස්ස, මිදිගම පැලෑන ආදී වෙරළ තීරයට දැඩි ලෙස ඇළුම් කරනු ලබයි. එමනිසා මාතර දිස්ත්‍රික්කයේ ආකර්ශනීය සංචාරක පුරය බවට පත්කර ගැනීමට මෙම වෙරළ තීරය තුළ විවේක හා විනෝද පහසුකම් සංවර්ධනය, සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් පත්කර ගැනීමට හැකිවීම ශක්තියක් වේ.

ඡායාරූප අංක 14 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

**භූ විෂමතා ලක්ෂණයන්ගෙන් යුතු වෙරළ තීරය**





**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර සහ අන්තර්ජාලය**

4. **රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා සුදුසු මද රළ සහිත පුළුල් වෙරළ තීරයක් පිහිටා තිබීම.**

ලංකාවට පැමිණෙන සංචාරකයින් වඩාත් කැමැත්තක් දක්වනුයේ මුහුදට හා වෙරළ තීරයටයි. විශේෂයෙන්ම දියමත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා දෙස් විදෙස් සංචාරකයින් යොමුවීමේ ප්‍රවණතාවය වැඩි වී ඇත. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කඹුරුගමුව, මිරිස්ස, පැලැන වැනි මදරළ, පුළුල් වැල්ල සහිත වෙරළ තීරය දියමත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා ඉතා යෝග්‍ය වන අතර, සංචාරක පැමිණීමද දිනෙන් දින වැඩි වී ඇත. මෙම වෙරළ තීරය සංවර්ධන ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා ප්‍රබල ශක්තියක් වේ.

5. **සංචාරක ආකර්ශනය සහිත ජෛව විවිධත්වයෙන් යුත් ස්වාභාවික ජල පද්ධති පිහිටා තිබීම.**

වර්තමානය වන විට වෙරළ කලාපයෙන් පිටතටද සංචාරකයින්ගේ ආකර්ශනය හා අවධානය වැඩි වී ඇත. ජෛව විවිධත්වයෙන් යුත් පරිසර පද්ධති අධ්‍යයනය කිරීමට හා නවාතැන් ගැනීමට සංචාරකයින් වඩාත් කැමැත්තක් දක්වන බැවින් සංවර්ධන බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පොල්වත්ත ගඟ, ගරාඩුව කලපුව, බොරාල වැව, කඹුරුගමුව වැව වැනි ජෛව විවිධත්වයෙන් යුතු ස්වභාවික ජල පද්ධති පිහිටා තිබීම සංචාරක පුරවරයක් ලෙස අනාගතයේ සංවර්ධනය කිරීමට ප්‍රබල ශක්තියක් වේ.

**ඡායාරූප අංක 15 : ජෛව විවිධත්වයෙන් යුත් ගරාඩුව කලපුව හා බොරාල වැව**
**වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**




**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර**

**6. තරු පන්තියේ හෝටල් පිහිටා තිබීම.**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය දිවයිනේ සංචාරක ගමනාන්ත පදනම් කරගෙන සංචාරක කලාප 06ක් ප්‍රකාශයට පත්කර ඇත. එම කලාපවල සංචාරක නවාතැන් සඳහා කාමර පහසුකම් ලබාගැනීමේ අනුපාතය වසර 2005 සිට ක්‍රමිකව ඉහල ගොස් ඇති බව හඳුනාගෙන ඇත. වර්තමානයේදී දකුණු කලාපය තුළ කාමර 74.24% ක් ප්‍රතිශතයක් සංචාරකයින් විසින් භාවිතයට ගෙන ඇත. විශේෂයෙන්ම වැලිගම, මිරිස්ස යනාදී ප්‍රදේශවල සංචාරක නවාතැන් පහසුකම් සැපයීම වර්ධනය වී ඇත. සංවර්ධන ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය වෙරළ ආශ්‍රිතව මෙන්ම ඊට අභ්‍යන්තරය තුළද ව්‍යාප්ත වී ඇත. බල ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා විවිධ තරු පන්තීන්ට අයත් හෝටල් ලැගුම්හල්, තානායම් හා ආපන ශාලා ආදිය ඉදිකර ඇත. සංචාරකයින් සඳහා සේවා සපයන ආයතන අතර හෝටල් සඳහා ප්‍රමුඛතාවයක් හිමි වී ඇත. ප්‍රදේශයේ පවතින සමස්ථ සංචාරක කටයුතු සඳහා භාවිතා වී ඇති කාමර සංඛ්‍යාවෙන් 60% ක ප්‍රතිශතයක් සංචාරක හෝටල් සතු වන අතර, බාබරින්, ජොජෝබා, ද පැලස්, පැරඩයිස් බීච් වැනි හෝටල් ඒ අතර වේ.

**ඡායාරූප අංක 16: තරු පන්තියට අයත් සංචාරක හෝටල්**
**වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**


මලබාර් හිල්


බාබේරියන් හොටෙල්

**මූලාශ්‍රය : අන්තර්ජාලය**

**7. දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - වැල්ලවාය මාර්ගය, කොළඹ - බෙලිඅත්ත දුම්රිය මාර්ගය සමඟ ඍජුව සම්බන්ධ වීම.**

සංවර්ධන බල ප්‍රදේශය මනා සම්බන්ධිත බහුවිධ මාර්ග පද්ධතියක් මඟින් මනාව සම්බන්ධ වී ඇත. දක්ෂිණ අධිවේගී මාර්ගය සංවර්ධන බල ප්‍රදේශය හරහා ගමන් කිරීම හා කොක්මාදුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය පිහිටා තිබීම සහ ගොඩගම හුවමාරු මධ්‍යස්ථානය කි.මී. 3.0 ක් දුරින් පිහිටා තිබීම ද ගුණාත්මක ප්‍රවාහන සේවාවක් ලබාදීමට හැකිවී ඇත. එසේම, කොළඹ - වැල්ලවාය ප්‍රධාන මාර්ගය සමඟ ඍජුව සම්බන්ධ වීමද කොළඹ - බෙලිඅත්ත දක්වා වූ දුම්රිය මාර්ගයත් මිදිගම, වැලිගම, පොල්වතුමෝදර, මිරිස්ස හා කඹුරුගමුව යන දුම්රිය ස්ථාන පිහිටා තිබීමද සංචාරක කර්මාන්තයේ දියුණුවට හේතු වී ඇත. එයට හේතුව ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සිට සංවර්ධන බල ප්‍රදේශයට පහසුවෙන් ළඟාවීමේ හැකියාව ලැබෙන බැවිනි.

**8. රිටිපන්න ධීවර කර්මාන්තයට ප්‍රසිද්ධියක් ඉසිලීම සහ විවිධාංගීකරණය කරන ලද මත්ස්‍ය නිෂ්පාදන අලෙවියට ඇති හැකියාව.**

වැලිගම ප්‍රදේශය අතීතයේ සිට රිටිපන්න ධීවර කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලා තිබෙන බැවින් එය සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා යොදාගත හැක. සංචාරකයින්ට රිටිපන්න ධීවර කර්මාන්තය මඟින් මාළුබෑම සඳහා අවස්ථාව උදාකරදීම තුලින් අමතර ආදායමක් උපයාගත හැකි අතර, සංචාරකයින්හට නව අත්දැකීම් අත්විඳීමටද අවස්ථාව සැලසීම වැදගත් වේ. මේ වන විට වැලිගම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් පැයකට රු. 500 – 1000 අතර මුදලක් ගෙවා රිටිපන්න ධීවර කර්මාන්තයේ නියැලෙන අතර, මිදිගම ප්‍රදේශය මේ සඳහා වඩාත් ප්‍රසිද්ධියක් උසුලයි. එසේ අල්ලා ගන්නා ලද නැවුම් මාළු විවිධ ක්‍රමවලට සකස් කර ආහාරයට ගැනීමටද ඔවුහු මනා කැමැත්තක් දක්වයි.

**ඡායාරූප අංක 17: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - රිටිපන්න ධීවර කර්මාන්තය**



**මූලාශ්‍රය : අන්තර්ජාලය**

- **දුර්වලතා**

**1. වෙරළ පිවිසුම් මාර්ග පටුවීම.**

කි.මී. 22ක විහිදෙන පුළුල් වෙරළ තීරය සැලසුම් බල ප්‍රදේශයට ඉහළ වටිනාකමක් ලබාදුන්නද වෙරළට ප්‍රවේශය ලබාගන්නා ප්‍රවේශ මාර්ග පටුවීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය. වෙරළ පිවිසුම් මාර්ග නිසි ප්‍රමිතීන්ට අනුව ඉදිකර නොමැතිවීම වෙරළ කලාපය තුළ ගොඩනැගිලි අවිධිමත් ලෙස ඉදිකිරීම මෙන්ම ඉඩම් හිමියන් විසින් ගොඩනැගිලි සීමා උල්ලංගණය කරමින් මායිම් තාප්ප ඉදිකිරීම ආදිය මඟින් පවතින මාර්ගද පටුවීමට හේතු වී ඇත. මේ තුලින් සංචාරකයින්ට ඍජුව වෙරළ කරා පිවිසීමේ අපහසුතා ඇතිවන අතර සංචාරක කර්මාන්තය ආශ්‍රිත ඉදිකිරීම් සඳහා ඉල්ලුම අඩුවීමටද මෙය හේතු වී ඇත.

**2. රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව සඳහා අවශ්‍ය පහසුකම් හා සුදුසුකම්ලත් පුහුණුකරුවන් නොමැතිවීම.**

වැලිගම, පැලැන, මිදිගම හා මිරිස්ස මුහුදු තීරය වක්‍රාකාරව පිහිටීම, රළමත ලිස්සායාමේ ක්‍රීඩාව පුහුණුවීම සඳහා මනා විභවතාවයකි. ක්ෂේත්‍ර සමීක්ෂණ වලට අනුව සංචාරක කාල සීමාව තුළ දිනකට දෙස් විදෙස් සංචාරකයින් 200 ක් පමණ මෙම ක්‍රීඩාව පුහුණුවීම සහ විනෝදාංශයක් ලෙස ක්‍රීඩා කිරීම සඳහා මෙම වෙරළ තීරයට පැමිණේ. නමුත් එම සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් අවම වේ. ඔවුන්ට අවශ්‍ය නාන කුටි හා ඇඳුම් මාරුකිරීමේ කුටි (Changing Room) ක්‍රීඩාව පුහුණු කිරීම සඳහා විධිමත් පුහුණුවක් ලැබූ පුහුණුකරුවන් නොමැති අතර නුපුහුණු පුහුණුකරුවන් දැනට රළ මත ලිස්සායාමේ ක්‍රීඩාව පුහුණු කිරීමේ නිරතව සිටී.

**3. ප්‍රමාණවත් රථගාල් පහසුකම් නොමැතිකම සහ ප්‍රධාන මාර්ගය දෙපස පදික වේදිකා නොමැතිවීම.**

මිදිගම, පැලැන, මිරිස්ස ආදී සංචාරකයින් බහුල ප්‍රදේශයන්හි ප්‍රධාන මාර්ග දෙපස පදික වේදිකා නොමැතිවිම, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග දෙපස දැකිය හැකි පොදු දුර්වලතාවයකි. විදේශ සංචාරකයින් බොහෝ විට පවුල් පිටින් සංචාරය සඳහා පැමිණෙන අතර, ඔවුන්ගේ කුඩා දරුවන් රැගෙන යනුයේ ළදරු කරත්ත වලින් වන අතර, ඔවුන් බොහෝ අවස්ථාවල පයින් ගමන් කරනු ලබයි. මෙම ප්‍රධාන මාර්ග දෙපස සුදුසු පරිදි පදික වේදිකා සංවර්ධනය නොවීම, විදුලි පහන් ආලෝක නොමැතිවීම ආදිය හේතුවෙන් ඔවුන් දැඩි අපහසුතාවයන්ට ලක්වේ. එසේම, සංචාරක කලාපය ආශ්‍රිත පොදු රථවාහන නැවතුම් ඉඩකඩ නොමැති වීමද දුර්වලතාවයකි.

**4. තල් මසුන් නැරඹීම සඳහා වෙරළට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා පහසුකම් ප්‍රමාණවත් නොවීම.**

තල්මසුන් නැරඹීමට දිනකට පැමිණෙන 500 – 700 අතර වූ සංචාරකයින් සඳහා මිරිස්ස ධීවර වරාය තුළ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවේ. විශේෂයෙන් මාර්ග පටුවීම, රථවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම, විවේක ස්ථාන, ආපනශාලා නොමැතිවිම උපදෙස් ලබාගැනීම සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක නොවීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

- අවස්ථා

**1. සංචාරකයින් මෙරටට පැමිණීමේ ක්‍රමිකව වර්ධනය වීම.**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංචාරක හෝටල් පිළිබඳ කරන ලද සමීක්ෂණය අනුව කොරෝනා වසංගතය ලොව ව්‍යාප්තවීමට පෙර ඔක්තෝබර් සිට මාර්තු මාසය දක්වා කාල සීමාව තුළදී සංචාරක හෝටල්වල කාමර භාවිත ප්‍රතිශතය සියයට 95 ක් පමණ විය. නමුත් කොරෝනා වසංගතයත් සමඟ මෙරට සංචාරකයින්ගේ පැමිණීම අඩාල වූ අතර, 2022 – 2023 වසර වන විට සංචාරකයන්ගේ පැමිණීමේ සැලකිය යුතු වර්ධනයක් සිදුවෙමින් පවතී. මෙය ප්‍රදේශයේ සංවර්ධනයට විශේෂ අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

2016 වර්ෂයේ වැඩි සංචාරකයින් පැමිණීමක් වැලිගම ප්‍රදේශය වෙත පැවතියද 2019 වර්ෂය වන විට එය ක්‍රමිකව මිරිස්ස ප්‍රදේශය වෙත යොමු වී ඇත. මෙම සංසිද්ධිය සඳහා ප්‍රධාන ලෙසම බලපා ඇත්තේ මිරිස්ස වරාය ඔස්සේ තල්මසුන් නැරඹීම ආරම්භ කිරීමත්, සංචාරකයින් ඒ සඳහා වැඩි රුචිකත්වයක් දැක්වීමත්ය. එමෙන්ම සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධනයත් සමග ප්‍රදේශවාසීන් තල්මසුන් නැරඹීමේ මෙන්ම සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වෙමින් සංචාරක කර්මාන්තය ඉහල නැංවීමට කටයුතු කරමින් සිටී.විශේෂයෙන්ම ධීවර කර්මාන්තයේ නියුතු පිරිස ද මේ වන විට සංචාරක කර්මාන්තය සඳහා යොමුවී තිබීම විශේෂ කරුණක් ලෙස පෙන්වා දිය හැකිය

ප්‍රස්ථාර අංක 1: සංචාරක පැමිණීම 2016-2022




**මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (2022)**

**2. සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරනු ලබන සංචාරක කලාප සැලැස්මට මිරිස්ස සහ මිදිගම ප්‍රදේශ හඳුනාගෙන තිබීම**

සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් ශ්‍රී ලංකාව සඳහා සකස් කරනු ලබන සංචාරක කලාප සැලැස්මට මිරිස්ස සහ මිදිගම යන ප්‍රදේශද ඇතුළත්ව තිබීම සංචාරක කර්මාන්තයේ අනාගතය සඳහා අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. එයට හේතුව මෙම ප්‍රදේශ සංචාරක විභවතාවයක් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබීම.

තවද මොරටුව විශ්වවිද්‍යාලය හා සංචාරක සංවර්ධන අධිකාරිය එක්ව සකස් කරමින් පවතින වෙරළ කලාපයේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඝනත්වය පදනම් කරගත් සංචාරක අකර්ශණීය ප්‍රදේශ හඳුනාගෙන ඇත. මෙම වැඩසටහන යටතේ වෙරළ කලාපයේ පවතින අපරවායුහ පහසුකම් හා සේවා ව්‍යාප්තිය පිළිබඳ තක්සේරුවක්, පවතින පාරිසරික පද්ධතිවල සංවේදීතාවය පිළිබඳ විශ්ලේෂණයක් හා දැනට ක්‍රියාත්මක හා යෝජිත සංවර්ධන කටයුතු යන කරුණු පිළිබඳව අධ්‍යනයක් සිදු කර ඉහත ප්‍රතිපත්ති සකස් කිරීමට කටයුතු කරමින් පවතී. මේ යටතේ මිරිස්ස සහ වැලිගම ප්‍රදේශ සඳහා වැඩි බර තැබීමක් සිදු කර ඇත.

සිතියම් අංක 5 : **වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : සංචාරක කටයුතු සඳහා සංවර්ධන නැමියාව.**




මූලාශ්‍රය : වෙරළ තීරයේ ගොඩනැගිලි සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - මොරටුව විශ්ව විද්‍යාලය 2025

- **තර්ජන**

1. **උණවටුන, පොල්හේන, කොග්ගල වැනි සංචාරක ප්‍රදේශයන් පැවතීම.**

   දකුණු පළාතේ සංචාරක ආකර්ෂණය සහිත උණවටුන, පොල්හේන, කොග්ගල වැනි සංචාරක ප්‍රදේශයන් සංවර්ධන බලප්‍රදේශයට ආසන්නව පැවතීම හේතුවෙන් සංචාරකයන් එම ප්‍රදේශයන් කෙරෙහි ආකර්ෂණය වීමක් දක්නට ඇත. එය සංවර්ධන බල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයට තර්ජනයක් වී ඇත.

**අරමුණ 02 -** දිස්ත්‍රික්කයේ නේවාසික ජනතාවට අවශ්‍ය පරිපාලන හා සේවා පහසුකම් විධිමත්ව සංවර්ධනය කිරීම

- **ශක්තීන්**

1. **කොටවිල නව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නව අධිකරණ සංකීර්ණය හා ලැබීම මහ රෝහල ස්ථාපිත කිරීම**

   මාතර නගරයේ පරිපාලන නගරය ලෙස කොටවිල නගරය සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇති අතර, මාතර නගරය තුළ පැවති අධිකරණ සංකීර්ණය හා මාතර මහ රෝහල කොටසක් මේ වන විට කොටවිල ලැබීම ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇත. දැනට අක්කර 142 ක් භූමි ප්‍රමාණයකට කොටවිල නව නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, මාතර නගරය වාණිජ නගරය ලෙස ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික්කයේ පරිපාලන හා සේවා මධ්‍යස්ථානය වශයෙන් කොටවිල නගරය සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

**ඡායාරූප අංක 18 : - වැලිගම ප්‍රා. ස. බල ප්‍රදේශය - කොටවිල උසාවි සංකීර්ණය**





**ඡායාරූප අංක 19: කොටවිල නව රෝහල - වැලිගම ප්‍රා. ස. බල ප්‍රදේශය**



**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කාර්යාලය, මාතර**

**2. අභ්‍යන්තර ප්‍රදේශ වෙරළ ප්‍රදේශයට සාපේක්ෂව ස්වාභාවික ආපදා අවම කලාපයක් වීම.**

සංවර්ධන බල ප්‍රදේශය සම්පූර්ණ වශයෙන් ගත්කළ ස්වභාවික ආපදා අවම කලාපයක් වශයෙන් හඳුනාගත හැකිය. වෙරළ කලාපය සුනාමි උවදුරට ලක්වන කලාපයක් ලෙස හඳුනාගත්තද රට අභ්‍යන්තරයට යන විට නාය යාම්, ගංවතුර වැනි ස්වාභාවික ආපදා අවම කලාපයක් ලෙස හඳුනාගත හැකිය.

**සිතියම් අංක 6 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : ආපදා ව්‍යාප්ත ප්‍රදේශ**




මූලාශ්‍රය : ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (2020)

**3. අනාගත සංවර්ධනයට යොදාගත හැකි හිස් ඉඩම් පැවතීම**

සංවර්ධන බල ප්‍රදේශය තුළ වෙරළ කලාපයේ අභ්‍යන්තරයට යන විට අනාගත සංවර්ධනය සඳහා යොදාගත හැකි ඉඩම් බහුල වශයෙන් හඳුනාගත හැකිය. විශේෂයෙන් කොටවිල, වාලිමවුන්ට්, උඩුකාව වැනි ප්‍රදේශ තුළ අනාගත සංවර්ධනයට යොදාගත හැකි ඉඩම් විශාල වශයෙන් පවතින අතර, සංවර්ධන බල ප්‍රදේශයේ ඉඩම් පරිභෝග රටාව අනුව හිස් ඉඩම් හෙක්ටයාර් 148 ක් පමණ පැවතීම.

**ඡායාරූප අංක 20 : වැලිගම ප්‍රා. ස. බල ප්‍රදේශය - අනාගත සංවර්ධනයට යොදාගත හැකි ඉඩම්**





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

**4. සංවර්ධනය කළ හැකි ප්‍රදේශය පුරා විහිදුනු අභ්‍යන්තර මාර්ග පද්ධතියක් පැවතීම හා එම මාර්ග පද්ධතිය මඟින් දක්ෂිණ අධිවේගී මාර්ගය හා කොළඹ බෙලිඅත්ත දුම්රිය මාර්ග සමඟ කෙටි කාලයකින් සම්බන්ධ විය හැකිවීම.**

සිතියම් අංක 7 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : අභ්‍යන්තර මාර්ග පද්ධතිය




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

**5. මාතර - කතරගම දුම්රිය මාර්ගයෙහි නැවතුම් ස්ථාන 04 ක් සහ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොක්මාදුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය සංවර්ධන ප්‍රදේශය තුළ පිහිටා තිබීම.**

මෙම සැලසුම් බල ප්‍රදේශය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පාලනය වන කොළඹ - කතරගම මාර්ගය, වැලිගම - අකුරැස්ස මාර්ගය, ගාල්ල - මාදම්පා මාර්ගය පවතින අතර, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පාලනය වන මාර්ග හා ප්‍රාදේශීය සභාව සතු මාර්ග ජාලයක්ද සමස්ථ සැලසුම් බල ප්‍රදේශය පුරාම විහිදී ඇති අතර, මෙම ජාලගත මාර්ග පද්ධතිය මගින් ඉතා කෙටි කාලයකින් රටේ අනෙකුත් ප්‍රදේශ සමඟ සම්බන්ධ වීමේ හැකියාව පැවතීම සුවිශේෂී විභවතාවයකි.

ඡායාරූප අංක 21 : **වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**

**දක්ෂිණ අධිවේගී මාර්ගය කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානය**



**මූලාශය: අන්තර්ජාලයෙනි**

**6. සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින ඇතැම් මංසන්ධි දැනටමත් සේවා සපයන කුඩා මධ්‍යස්ථාන ලෙස වර්ධනයක් දක්නට ලැබීම.**

සංවර්ධන ප්‍රදේශය තුළ දෙනිපිටිය, වැලිපිටිය, මිදිගම කනංකේ වැනි මංසන්ධි ආශ්‍රිතව සේවා සපයන මධ්‍යස්ථාන පිහිටා ඇති අතර, මෙම මධ්‍යස්ථාන ක්‍රමිකව සංවර්ධනය වීම ප්‍රබලතාවයකි.

**7. ජල සම්පාදන මණ්ඩලය මගින් අදියර IV ව්‍යාපෘතිය යටතේ සංවර්ධන ප්‍රදේශය සඳහා නල ජල සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.**

සැලසුම් බල ප්‍රදේශය තුළ මුළු පවුල් සංඛ්‍යාවෙන් 68% ක් පමණ නල ජලය භාවිතා කරන අතර, ඉතිරි 32% ප්‍රමාණය පානීය ජලය සපයා ගැනීම සඳහා ළිං හා වෙනත් ජල මූලාශ්‍ර භාවිතා කරනු ලබයි. නල ජල සැපයුමේදී විවිධ ගැටළු පවතින අතර, මාතර දිස්ත්‍රික්කයට නල ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන මෙගා ව්‍යාපෘතියක් වන අදියර IV ව්‍යාපෘතිය යටතේ මුළු සැලසුම් බල ප්‍රදේශය සඳහාම ජලය සැපයීමට සැලසුම් කර තිබීම ශක්තියක් ලෙස හඳුනාගත හැකිය.

- **දුර්වලතා**

**1. නව අධිකරණ සංකීර්ණයට හා නව ලැබීම මහ රෝහලට ප්‍රවේශය ලැබෙන ප්‍රධාන ප්‍රවේශ මාර්ග විධිමත් ලෙස සංවර්ධනය නොවීම.**

මාතර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථානගත වී ඇති රාජ්‍ය ආයතන සියල්ල ස්ථානගත කරමින් පරිපාලන නගරය ලෙස කොටවිල ප්‍රදේශය සංවර්ධනය කිරීමට ආරම්භ කර ඇති අතර, ඒ යටතේ අධිකරණ සංකීර්ණය සහ කොටවිල ලැබීම නව රෝහල මේ වන විට ක්‍රියාත්මක වෙමින් පැවතියද ප්‍රවේශය ලබාගන්නා ප්‍රධාන මාර්ග මේ වන තෙක් නිසි පරිදි සංවර්ධනය නොවීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන් කඹුරුගමුව හන්දිය සිට ලැබීම හන්දිය දක්වා මාර්ගය, ලැබීම සුල්තානාගොඩ මාර්ගය, ලැබීම - හේන්වල මාර්ගය ආදිය ප්‍රධාන ප්‍රවේශ මාර්ග නිසි පරිදි සංවර්ධනය නොවීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

**ඡායාරූප අංක 22 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - නිසි පරිදි සංවර්ධනය නොවූ මාර්ග**






**මූලාශය: නාගරික සංවර්ධන අධිකාරිය**

**2. නව අධිකරණ සංකීර්ණයට හා නව රෝහලට සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවට අවශ්‍ය පොදු ප්‍රවාහන සේවා ප්‍රමාණවත් නොවීම හා බස් නැවතුම්පොලක් නොමැතිවීම.**

මාතර අධිකරණ සංකීර්ණය හා මාතර මහ රෝහලෙහි කොටසක් මේ වන විට පරිපාලන නගරය තුළ ක්‍රියාත්මක වුවද පොදු ප්‍රවාහන සේවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වර්තමානය වන විට ගැටළු රාශියක් පැන නැගී ඇත. පොදු ප්‍රවාහන සේවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම කොටවිල ප්‍රදේශයේ බස් නැවතුම්පොලක් නොමැතිවීමද දුර්වලතාවයක් වේ. මාතර දිස්ත්‍රික් අධිකරණ සංකීර්ණය සඳහා දිනකට විශාල පිරිසක් සේවා ලබාගැනීමට පැමිණෙන අතර, පොදු ප්‍රවාහන සේවා විධිමත් පරිදි ක්‍රියාත්මක නොවීමෙන් සේවා ලබාගැනීමට පැමිණෙන ජනතාව දැඩි අපහසුතාවයන්ට ලක් කරයි. තවද, එම ප්‍රදේශය තුළ බස් නැවතුම්පොලක් නොමැතිවීම ද හඳුනාගත හැකි දුර්වලතාවයකි.

**3. කොටවිල ප්‍රදේශයේ ස්ථාපිත අධිකරණ සංකීර්ණයට හා සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනීම සඳහා රෝහලට පැමිණෙන මහජනතාවට අවශ්‍ය වාණිජ සේවාවන් ප්‍රමාණවත් නොවීම.**

නව පරිපාලන නගරය කොටවිල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමේ මුල් අදියර යටතේ මාතර මහ රෝහලේ කොටසක් මාතර දිස්ත්‍රික් අධිකරණ සංකීර්ණය, පොලිස් ස්ථානය, ක්‍රීඩා සංකීර්ණය, පුරාවිද්‍යා කාර්යාලය ආදිය ස්ථාපිත කර තිබුණද පොදු වාණිජ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් දැනට ස්ථානගත වී නොමැත. විශේෂයෙන්ම බැංකු පහසුකම්, නීතිඥ කාර්යාල, ඔසු සැල්, රසායනාගාර, ආපනශාලා, කොමියුනිකේෂන් ආදී පොදු වාණිජ පහසුකම් හි සංවර්ධනයක් වී නොමැති බැවින් එම සේවා ලබාගැනීම සඳහා නැවත මාතර නගරය කරා පැමිණීමට සිදුවීම ප්‍රධාන දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

**4. අභ්‍යන්තර මාර්ග පටුවීම හා ප්‍රමාණවත් පරිදි සංවර්ධනය නොවීම.**

කොටවිල ප්‍රදේශයට පැමිණීම සඳහා ඇති අභ්‍යන්තර මාර්ග ජාලය (හේන්වල - මිරිස්ස මාර්ගය, කොටවිල - මාලිම්බඩ මාර්ගය, කොටවිල - වැවහමන්දුව මාර්ගය) පටුවීම හා අවශ්‍ය පරිදි කාණු, පදික මංතීරු සහිතව සංවර්ධනය නොවීම ද හඳුනාගත හැකි දුර්වලතාවයකි.

**5. නිසි කළමනාකරණ ක්‍රමවේදයකින් තොරව පවත්වාගෙන යන කැලි කසල අංගනය තුළ මතු වී ඇති පාරිසරික හා සමාජීය ගැටළු**

කොටවිල පරිපාලන නගරය තුළට මාතර මහ නගර සභාව ස්ථාපිත කිරීම සඳහා ලබාදෙන ලද අක්කර 14 රූඩ් 02 පර්චස් 32.0 පමණ වන භූමිය තුළ කොටස කැලි කසල කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා යොදාගෙන ඇති අතර, මේ වන විට එම ව්‍යාපෘති ප්‍රදේශයේ පාරිසරික හා සාමාජීය ගැටළු රාශියක් ඇතිකිරීමට හේතුවී ඇත. නව පරිපාලන නගරයක් මධ්‍යයේ අක්‍රමවත්ව ක්‍රියාත්මක මෙම කසල ව්‍යාපෘතිය මඟින් ප්‍රදේශය පුරා අධික දුර්ගන්ධයක් පැතිරෙන අතර, සෞඛ්‍ය ගැටළු ද වර්තමානය වන විට පැන නැඟී ඇත.

- **අවස්ථා**

**1. ගාල්ල පරිපාලන නගරය හා මාතර වාණිජ නගරය ආසන්නව පිහිටා තිබීම.**

සංවර්ධන බල ප්‍රදේශයේ පිහිටීම සලකා බැලීමේදී ගාල්ල පරිපාලන නගරයට හා මාතර වාණිජ නගරයට මැදිව පිහිටා තිබීම විශේෂ අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. සංවර්ධන ප්‍රදේශයේ සිට ගාල්ල පාරිපාලන නගරයට කි.මී. 31.0 ක් පමණ දුරක් ඇති අතර, මාතර නගරයට කි.මී. 17.0 ක දුරකින්ද මායිම්ව ඇත. සංවර්ධන බල ප්‍රදේශයේ නේවාසික හා සංසරණ ජනතාවට තම සේවා හා අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීමට මේ නිසා හැකියාව ලැබේ. තවද, විශේෂයෙන්ම මාතර නගරය තුළ සංවර්ධනයේ ධනාත්මක බලපෑම සංවර්ධන ප්‍රදේශයට වාසිසහගත වේ.

ඡායාරූප අංක 23 : **සංවර්ධන බල ප්‍රදේශය ගාල්ල පරිපාලන නගරයට හා මාතර වාණිජ නගරයට මැදිව පිහිටා තිබීම**




**මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය**

**2. ගාල්ල හා හම්බන්තොට වරාය, ගුවන්තොටුපල ආසන්නව පිහිටා තිබීම.**

සංවර්ධන බල ප්‍රදේශය හරහා දක්ෂිණ අධිවේගී මාර්ගයත් කොක්මාදූව පිවිසුම පිහිටා ඇති අතර ඒ තුලින් ඉතා ඉක්මනින් ගාල්ල හම්බන්තොට වැනි ප්‍රදේශ කරා ගමන් කිරීමේ හැකියාව ලැබී ඇත. විසල් හම්බන්තොට සැලැස්ම යටතේ සංවර්ධන වූ මත්තල ගුවන්තොටුපල හා හම්බන්තොට වරාය කි.මී. 80.0 ක දුරින් පිහිට තිබීමත් ගාල්ල වරාය හා කොග්ගල ගුවන්තොටුපල කි.මී. 30.0 වැනි ආසන්න දුරකින් පිහිට තිබීමත් සංවර්ධන බල ප්‍රදේශයට වටිනා අවස්ථාවක් ලෙස හදුනාගත හැකිය. විශේෂයෙන්ම අධ්‍යන ප්‍රදේශය තුළ හදුනාගෙන ඇති කර්මාන්ත කලාපය මගින් බිහිවෙන නිමි ද්‍රව්‍ය හා කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය වඩාත් පහසුවෙන් ප්‍රවාහනය කිරීම මෙන්ම අපනයනය කිරීම සදහාද මහගු අවස්ථාවක මේ තුලින් ලැබේ. අධ්‍යයන ප්‍රදේශයේ පිහිටා ඇති ලොව ආකර්ශනීය ප්‍රදේශයක් ලෙස මිරිස්ස ප්‍රදේශය සදහා මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල හරහා සංචාරකයන්ට පහසුවෙන් පිවිසීමට හැකියාව ලැබීමද සංවර්ධන බල ප්‍රදේශයට මහගු අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය.

- **තර්ජන**

**1. කොග්ගල කර්මාන්ත පුරය ආසන්නව පැවතීම.**

සංවර්ධන බල ප්‍රදේශයට ආසන්නව කොග්ගල නිදහස් වෙළඳ කලාපීය කර්මාන්තපුරය පිහිටා ඇති අතර එය සංවර්ධන බල ප්‍රදේශයේ කර්මාන්ත සඳහා පවත්නා තර්ජනයක් ලෙස හඳුනාගත හැකිය.

# 06 වන පරිච්ඡේදය

# සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

මෙහිදී මූලික වශයෙන් ඉදිරිපත් කරනුයේ සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය මගින් සැලසුම් බල ප්‍රදේශයක් තුළ හඳුනාගන්නා ලද සංවර්ධන ගැටළු විසඳීමත් සංවර්ධන විභවතා ප්‍රසස්ථ අයුරින් යොදා ගැනීමත් තුලින් අපේක්ෂිත අනාගත සංවර්ධන දැක්ම කෙබඳු දිශානතයක් කෙරෙහි යොමුවේද යන්න දළ රූප සටහනක් දැක්වීමයි.

විසල් මාතර සංවර්ධන සැලැස්මට අනුව එම සැලැස්මට ඇතුළත් එක් පළාත් පාලන ආයතනයක් වන වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය **"මාතර පුරවරයේ නොනිදන සංචාරක පුරවරය "** යන දැක්ම ඇතිව සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. ඒ අනුව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංචාරක , ධීවර , පරිපාලන , කර්මාන්ත හා නේවාසික යන අංශ ඔස්සේ සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

මිදිගම සිට කඹුරුගමුව දක්වා වන සුන්දර වෙරළ තීරය වර්තමානය වන විටද සර්ෆින් , තල්මසුන් නැරඹීම වැනි සංචාරක ක්‍රියාකාරකම් පවතින සක්‍රීය වෙරළ තීරයකි. ඒ අනුව ඉදිරි වසර 10ක කාලය තුළ මිදිගම සිට කඹුරුගමුව දක්වා වෙරළ තීරය දකුණු පළාතේ ආකර්ශනීය සහ බහුවිධ සංචාරක ක්‍රියාකාරකම් ඇතුළත් නොනිදන සංචාරක කොරිඩෝවක් ලෙස සංවර්ධනය කිරීම මෙම සංවර්ධන සැලැස්මේ අරමුණු වේ.

මෙයට අමතරව මිරිස්ස ධීවර වරාය සංචාරක කර්මාන්තයට යොදාගන්නා අතරතුරම ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. තවද සම්ප්‍රදායික රිටිපන්න ධීවර කර්මාන්තය සංචාරක කර්මාන්තය සමග බද්ධ කර ප්‍රවර්ධනය කරමින් ඒ ඔස්සේ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට සැලසුම් කර ඇත.

තවද , අධ්‍යයන ප්‍රදේශයේ කොටවිල ආශ්‍රිත ප්‍රදේශය, මාතර නගරයේ පරිපාලන ඇතුළු අනෙකුත් සේවා කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා විකල්ප නාගරික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. මේ යටතේ දැනටමත් අධිකරණ සංකීර්ණය, මාතර මහ රෝහලේ කොටසක්, සුරාබදු කාර්යාලය හා නව පොලිස් ස්ථානයක් ඇතුලු රාජ්‍ය ආයතන කිහිපයක් මෙම ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇත.

කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළු විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයේම අනාගත ආයෝජන අවස්ථා ඇති කරලීමේ අරමුණින් වැලිගම උඩුකාව චාර්ලිමවුන්ට් ප්‍රදේශයේ අධිවේගී මාර්ගයට ආසන්නව කර්මාන්ත කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. මේ සඳහා චාර්ලිමවුන්ට් ප්‍රදේශයේ අක්කර 350 ක ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් භූමියක් අත්පත් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ඊට අවශ්‍ය ජලය, විදුලිය, මාර්ග වැනි යටිතල පහසුකම් සංවර්ධනය කරමින් නව කාර්මික කලාපයක් ඇති කර ලීමට අපේක්ෂිතය. මෙමගින් නව ආයෝජකයන්ට ආයෝජන අවස්ථාද ප්‍රදේශයේ ජනතාවට සෘජු හා වක්‍ර රැකියා අවස්ථාද උදා කරදීමට අපේක්ෂිතයි.

වැලිගම ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ කොළඹ කතරගම ප්‍රධාන මාර්ගය හා දුම්රිය නැවතුම් ස්ථාන 04කින් සමන්විත කොළඹ - බෙලිඅත්ත දුම්රිය මාර්ගයකින්ද, අධිවේගී

පිවිසුම් මාර්ගයකින්ද සමන්විත මනා ප්‍රවාහන ජාලයකින් යුක්ත වන අතර මෙම ප්‍රදේශයන්ට අතරමැද විහිදුණු නාගරික ප්‍රදේශය මිශ්‍ර සංවර්ධිත ප්‍රදේශයක් ලෙස පවත්වාගෙන යාමට හඳුනාගෙන ඇති අතර එම ප්‍රදේශය තුළ නේවාසික කටයුතු ඇතුළු අනෙකුත් සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අවස්තාව ලබා දී ඇත.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු ප්‍රදේශය තුළ වී වගාව, කොරටු ගොවිතැන, රබර් හා කුරුඳු, පොල් යනාදී වගාවන් විහිදුණු කෘෂිකර්මික වගාවන්ගෙන් සමන්විත නේවාසික ප්‍රදේශකින් යුක්ත වේ. මෙම සංවර්ධන විභවතාවය සැලකිල්ලට ගෙන එම ප්‍රදේශය කෘෂිකර්මය ප්‍රමුඛ කරගත් මධ්‍ය ඝණත්ව නේවාසික ප්‍රදේශයක් ලෙස පවත්වා ගෙන යාමට අපේක්ෂිත අතර මේ තුලින් සැලසුම් ප්‍රදේශයේ දකුණු ප්‍රදේශය වන සංචාරක හා කර්මාන්ත ස්ථානගත වී ඇති ප්‍රදේශ සඳහා ආහාර භෝග සැපයීමට අපේක්ෂා කෙරේ. මේ තුලින් ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම අපේක්ෂිතයි.

උක්ත කරුණු සමෝධානය කරගත් සැලසුම් සංකල්පය තුලින් මාතර පුරවරයේ නොනිදන නගරය යන වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනාගත දැක්ම, ඒ තුලින් ඉටු කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු හා පරමාර්ථ කරා ගමන් කිරීමට අවශ්‍ය මූලික දල සැලැස්ම පිලිබඳ අවබෝධයක් පහත සඳහන් රූප සටහන මගින් දැක්වෙන සැලසුම් සංකල්ප සටහන මගින් ලබාගත හැකිය.

රූපසටහන් 02 : **වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - සංකල්පිත සැලැස්ම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

## 6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම

වර්ෂ 2023 සඳහා වන වැලිගම ප්‍රාදේශීය සභා සංවර්ධන සැලැස්මෙහි මාතර පුරවරයේ නොනිදන සංචාරක නාගරිකය යන දැක්ම සාක්ෂාත් කරගැනීමේ පරමාර්ථය පෙරදැරි කරගනිමින් සකස් කරන ලද යෝජිත ආර්ථික, පාරිසරික සහ අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා වන යෝජිත උපාය මාර්ගික ව්‍යාපෘති තුලින් බිහිවන අනාගත නාගරික ආකෘතිය කෙබඳුද යන්න පිළිබඳව යෝජිත භූමි පරිහරණ සැලැස්ම මගින් නිරූපනය කෙරේ.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා වැලිගම නගරය, ගාල්ල හා අනෙකුත් නාගරික ප්‍රදේශ හා සසදා බැලීමේදී අඩු සංවර්ධනයක් පවතින එහෙත් සංවර්ධනයට වැඩි විභවතාවයකින් යුත් නාගරික ප්‍රදේශක් බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව නගරයේ පවත්නා ශක්තීන්, අවස්ථා, දුර්වලතා හා බාධක පිළිබඳව අවධානය යොමුකර දැනට පවතින භූමිය ප්‍රශස්ථ භාවිතය සඳහා යොමුකර ජනයාගේ අදායම මට්ටම ඉහළ නැංවීමත් සංවර්ධන ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සැලසීමත් ප්‍රදේශයේ නේවාසික ජනයාට පහුසුකම් සැලසීමත් අරමුණු කරගෙන යෝජිත භූමි පරිහරණ සැලැස්ම සකස් කර ඇත.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් සහ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට එකතු වී සෑදී ඇත. කඹුරුගමුව සිට මිදිගම දක්වා වූ මුහුදු තීරය (වැලිගම නගර සභා බල ප්‍රදේශය හැර) ආශ්‍රිත ප්‍රදේශ සංචාරක හා ධීවර කටයුතු සඳහා ප්‍රමුඛතා ප්‍රදේශ ලෙස හඳුනාගන්නා ලදී. මෙම ප්‍රදේශය මූලිකව සංචාරක හා ධීවර කටයුතු සඳහා යොදාගැනීමට අපේක්ෂා කරන අතර උද්‍යාන හා වෙරළ විවෘත ප්‍රදේශ ඇතිකිරීම පදික වේදිකා සංවර්ධනය, පාරිසරික සංචාරක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සංචාරක පහසුකම් මධ්‍යස්ථාන ඉදිකිරීම හඳුනාගෙන ඇත. ඒ අනුව වෙරළ ඉම ප්‍රධාන සේවා සපයන ඉහළ සංචාරක ආකර්ශනයකින් යුත් සංචාරක හෝටල් සහිත මිරිස්ස, කඹුරුගමුව, මිදිගම වෙරළ කලාපය ඉහළ ගොඩනැගිලි ඝනත්වයකින් යුතුව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. තවද වෙරළ ඉම කේන්ද්‍ර කොටගත් සංවර්ධන රට අභ්‍යන්තරයේ ඇති උස්බිම්, තෙත්බිම්, වැව් හා කලපු සහිත ස්වාභාවික පරිසර පද්ධති වලට ආකර්ශනය කර ගැනීම තුලින් පාරිසරික සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමට මෙම සංවර්ධන සැලැස්ම තුලින් බලාපොරොත්තු වේ. ඒ අනුව සංවර්ධන රෙගුලාසි සකස් කිරීම, දක්ෂිණ අධිවේගී මාර්ගයට හා ගාලු පාරට සමාන්තරව එම ප්‍රදේශ සඳහා පහසුවෙන් ලගා විය හැකි පවතින අභ්‍යන්තර මාර්ග ජාලය පුලුල් කර සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබන අතර එම මාර්ග ජාලය හා මුහුදු බඩ ප්‍රදේශය යා කරමින් රට අභ්‍යන්තරයට විහිදෙන මාර්ග ජාලයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය.

කොටවිල ප්‍රදේශය මාතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නගරය ලෙස සංවර්ධනය කිරීමට යෝජිත අතර වැලිපිටිය, දෙනිපිටිය, කනංකේ යන හඳුනාගත මංසන්ධි එම ප්‍රදේශවලට අවේණික සංවර්ධන විභවතාවයන් අනුව කුඩානාගරික මධ්‍යස්ාන ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂ කෙරේ. මිරිස්ස මංසන්ධිය ධීවර හා සංචාරක කර්මාන්ත කේන්ද්‍ර කොටගත් කුඩා උප නාගරික ප්‍රදේශයක් ලෙසත් සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

එසේම ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ආර්ථික විභවතාවයක් වන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා සංවර්ධන ප්‍රදේශයේ වැලිපිටිය, චාර්ලිමවුන්ට් , මිදිගම යන ප්‍රදේශ හඳුනාගෙන ඇති අතර යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම ඒ සඳහා ඉඩ වෙන්කර ඇත.

විශේෂයෙන් ප්‍රදේශයේ අභ්‍යන්තරයට වන්නට පිහිටා ඇති පාරිසරික සංවේදී කලාපයන් ආරක්ෂා කරගනිමින් වෙරළ ඉම කේන්ද්‍ර කරගත් සංවර්ධන පීඩනය පාලනය කිරීම හා ප්‍රදේශයේ අභ්‍යන්තරව පිහිටි කුඩා සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර ඒ තුලින් සංවර්ධන බල ප්‍රදේශයේ නේවාසික හා කෘෂි කාර්මික සේවා සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීමට අපේක්ෂිතයි.

එමෙන්ම ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ආර්ථික විභවතාවයක් වන ධීවර හා සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ ඉම ප්‍රදේශය සංචාරක කොරිඩෝවක් ලෙස නිර්මාණය කිරීමත් ඒ තුලින් වර්ෂ 2033 වන විට වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මාතර පුරවරයේ නොනිදන සංචාරක නගරය බවට පත් කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හා ව්‍යාපෘති යෝජනා කර ඇත.

මෙසේ සකස් කරන ලද යෝජිත භූමි පරිහරණ සැලැස්ම සිතියම් අංක 8 මගින් පෙන්වා ඇත. ඒ අනුව වසර 2033 වන විට වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද කරන ලද කලාපීයකරණ සැලැස්මේ පෙන්වා ඇති ආකාරයට අනාගත සංවර්ධනය පෙන්නුම් කරන දික් කඩ කැපුම් ස්ථාන ද සළකුණු කර අංක 8 දරණ සිතියම හා රූප සටහන් අංක 3 දරණ හරස් කඩ මගින් පෙන්වා ඇත.

**සිතියම් අංක 8 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : යෝජිත භූමි පරිහරණ සැලැස්ම 2033**




මූලාශ්‍රය - නාගරික සංවර්ධන අධිකාරිය

රූප සටහන් අංක 3 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :
යෝජිත භූමි පරිහරණ සැලැස්ම හරස්කඩ




ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ආර්ථික විභවතාවයක් වන සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ ඉම ප්‍රදේශය සංචාරක කොරිඩෝවක් ලෙස නිර්මාණය කිරීමත් ඒ තුලින් වර්ෂ 2033 වන විට වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංචාරක පුරවරයක් බවට පත්කිරිම සඳහා අවශ්‍ය උපායමාර්ග හා ව්‍යාපෘති යෝජනා කෙරේ. A-A හරස්කඩ අනුව ඉහල සංචාරක ආකර්ශනයක් සහිත මිරිස්ස ප්‍රදේශයේ සිට රට අභ්‍යන්තර ප්‍රදේශය දක්වා සංවර්ධනය විකේන්ද්‍රණය කරනු ලබන ආකාරය නිරූපනය කර ඇත. ඒ තුළ දෙනිපිටිය නගරය තුළ වාණිජ කලාප ඇතිකිරීමත් පුළුල් මිශ්‍ර සංවර්ධන කලාපයක් ඇතිකිරීමටත් අපේක්ෂිතය. B-B හරස්කඩ තුලින් සංචාරක ආකර්ශනයක් ඇති වෙරළ කලාපයේ සිට රට අභ්‍යන්තරය තුළ මිශ්‍ර සංවර්ධන කලාප ඇතිකිරීමත්, අධිවේගී මාර්ගය ඇතුළු ඒ අවට කලාපවල අධි ඝණත්ව හා මධ්‍ය ඝණත්ව නේවාසික කලාප ඇතිකිරීමටද අපේක්ෂිතය. C-C හරස්කඩ තුලින් කොටවිල ආශ්‍රිත ප්‍රදේශයේ මිශ්‍ර සංවර්ධන කලාප ඇතිකිරීමත් කොටවිල නව නගරය මුල් කරගත් වාණිජ කලාපයක් ඇතිකිරීමටත් අපේක්ෂිතය. D-D හරස්කඩ රට අභ්‍යන්තර ප්‍රදේශවල කෘෂිකාර්මික ප්‍රදේශ ආරක්ෂා කරමින් නේවාසික භාවිතය ප්‍රමුඛ කරගත් අධි ඝණත්ව නේවාසික කලාපයක් ඇතිකිරීමටත් යෝජිතය.

## 6.3. සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග

### 6.3.1. සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග සැලැස්ම

වර්ෂ 2033 වන විට විසල් මාතර නාගරික බල ප්‍රදේශය සංචාරක, වානිජ, කෘෂිකර්මාන්තය, කර්මාන්ත, ධීවර යන විවිධ අංග ඔස්සේ සංවර්ධනය කිරීම තුලින් පරිසර හිතකාමී තිරසාර සමෘද්ධිමත් නාගරිකයක් බිහි කිරීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වන අතර, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන සැලසුම් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ඒ අනුව විසල් මාතර සංවර්ධන සැලැස්මේ එක් සැලසුම් බල ප්‍රදේශයක් වන වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා ද එහි දැක්ම වන සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කරගත් ආර්ථික නවෝදයක් තුලින් "මාතර පුරවරයේ නොනිඳන නාගරිකයක්'' බිහි කරලීම පෙරදැරි කරගෙන සකස් කරනු ලබන මෙම සංවර්ධන සැලැස්මට භෞතික හා සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන සැලසුම් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව මෙම සැලසුම් සකස් කිරිමේදි සාමාජීය වශයෙන් පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාල උපාය මාර්ගික සැලසුම් හා භෞතික වශයෙන් පවතින යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ උපාය මාර්ගික සැලසුම් වශයෙන් අංශ දෙකක් යටතේ සැලසුම් වර්ග කල අතර එම එක් එක් සැලසුම් පිලිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරි පරිච්ඡේදවලදී විමසා බැලේ.

සෞඛ්‍ය සේවා සැලැස්ම

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය සේවා පහසුම් සැපයිම සඳහා කඹුරුගමුව නව දිස්ත්‍රික් මහා රෝහල, මිරිස්ස ග්‍රාමීය රෝහල, මීදිගම ග්‍රාමීය රෝහල, මැදගොඩ කඹුරුගමුව ග්‍රාමීය රෝහල පිහිටා ඇත. මීට අමතරව වැලිපිටිය හා වට්ටක්ගොඩ ප්‍රදේශයේ ආයුර්වේද රෝහල් දෙකක් පිහිටා ඇත. එසේම හෙද පුහුණු පාසල කඹුරුගමුව රෝහල ආශ්‍රිතව පිහිටා ඇති අතර ප්‍රදේශය තුළ ඇති රජයේ රෝහල් තොරතුරු පහත වගු අංක 5මගින් දැක්වේ.

වගු අංක 5 : වැලිගම ප්‍රාදේශීය සභා සංවර්ධන බල ප්‍රදේශය :

රජයේ රෝහල් තොරතුරු 2022

| රෝහල | වාට්ටු සංඛ්‍යාව | දෛනික නේවාසික රෝගීන් සංඛ්‍යාව | දෛනික භාහිර රෝගීන් සංඛ්‍යාව | වෛද්‍යවරු සංඛ්‍යාව | හෙද නිලධාරි සංඛ්‍යාව | ඇඳන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| නව දිස්ත්‍රික් මහා රෝහල -කොටවිල | 13 | 35 | 176 | 56 | 263 | 359 |
| මිරිස්ස ග්‍රාමීය රෝහල | - | - | 250 | 03 | 01 | - |
| මිදිගම ග්‍රාමීය රෝහල | - | - | 180 | 03 | 01 | - |
| කඹුරුගමුව මැදගොඩ ග්‍රාමීය රෝහල | - | - | 150 | 02 | 01 | - |

මූලාශ්‍රය : රෝහල් ලේඛනාගාර තොරතුරු

ඉහත වගුවට අනුව ප්‍රදේශය තුළ පවත්නා රෝහල් 04හිම දෛනික බාහිර රෝගීන් සංඛ්‍යාව නේවාසික රෝගීන් සංඛ්‍යාවට වඩා ඉහල අගයක් ගනී. එසේම මෙහිදි අවධානය කල යුතු විශේෂිත කරුණක් වනුයේ කඹුරුගමුවේ *කොටවිල* පිහිටා ඇති නව දිස්ත්‍රික් මහ රෝහල සඳහා අක්කර 53ක ඉඩම් ප්‍රමානයක් අත්පත් කරගෙන කොරියානු රජයේ අධාර ඇතිව එහි කොටසක මහ රෝහල ඉදි කර ඇත. එම නව රෝහල තුළ පරීක්ෂණ ගොඩනැගිලි , වාට්ටු සංකීර්ණය ,වෛද්‍ය නිල නිවාස, හෙද නිල නිවාස, නව පල්දෝරු පද්ධතියක් (Treatment Plant), මෘත ශරීරාගාරය, ඖෂධ ගබඩා, මුළුතැන්ගෙය, නව මාර්ග පද්ධතිය, රථවාහන නැවතුම් ස්ථාන ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සපයා ඇත.

2005 වසර සඳහා සකස් කරන ලද විසල් මාතර සංවර්ධන සැලැසුම් වාර්තාවට අනුව මාතර නගරයේ පිහිටා ඇති මහ රෝහල දැනටමත් ඉඩකඩ සීමිත ප්‍රදේශයක තදබදයෙන් යුතුව පවත්වා ගෙන යන බැවින් වඩා ඉඩකඩ පවතින සුවපහසු පරිසරයක් පවතින කොටවිල, නව රෝහල වෙත ප්‍රතිස්ථානගත කිරීමට යෝජනා කර ඇත. එම සැලැස්ම පරිදි දැනටමත් මාතර මහරෝහලේ ස්වසන රෝග ඒකකය, මාතෘ ඒකකය,

දන්ත සායනය, මානසික ඒකකය කොටවිල මහ රෝහල වෙත ප්‍රතිස්ථානගත කර ඇති අතර 2033 වසර වනවිට මාතර මහ රෝහල සම්පූර්ණයෙන්ම කොටවිල නව මහ රෝහල වෙත විතැන් කිරීමට යෝජනා කෙරේ. මාතර නගරය තුළ නාගරික රෝහලක් (city hospital) එකක් පමණක් පවත්වාගෙන යෑමට යෝජනා කර ඇත. ඒ සම්බන්ධව දැනටමත් සෞඛ්‍ය අමාත්‍යංශය සමග සාකච්ඡා කර එකගතාවය ලබා ගෙන ඇත.

රූප සටහන් අංක 4 : **කොටවිල නව රෝහල් පරිශ්‍රයේ පිහිටීම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

රූප සටහන් අංක 5 : **කොටවිල නව රෝහල් පරිශ්‍රය : වින්‍යාස සැලැස්ම**




මූලාශ්‍රය : අන්තර්ජාලය

ඡායාරූප අංක 24 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - කොටවිල නව රෝහල



මූලාශ්‍රය : අන්තර්ජාලය

සංවර්ධන බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය මධ්‍යස්ථානවල පිහිටීමේ සිට කිලෝමීටර් 2ක හා 4ක වපසරියක් තුළ සිදු කරන ලද විශලේෂණයට අනුව සැලසුම් බල ප්‍රදේශය පුරා විහිදුන සෞඛ්‍ය පහසුකම් වල ව්‍යාප්තියක් හඳුනා ගත හැකිය. ඒ අනුව වර්ථමාන ජනගහනය සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථාන ප්‍රමාණවත් මට්ටමක පැවතිය ද අනාගතයේදී නේවාසික ජනගහනය හා ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් සැලකිමේදී සෞඛ්‍ය මධ්‍යස්ථාන තුළ පවතින පොදු පහසුකම්වල හිගතාවයක් හඳුනාගත හැකිය.

විශේෂයෙන්ම මැදගොඩ ග්‍රාමීය රෝහල, මිරිස්ස ග්‍රාමිය රෝහල හා මිදිගම ග්‍රාමිය රෝහල දැනට ඌණ භාවිතයේ පවතින අතර මිරිස්ස රෝහලෙහි ගොඩනැගිලි ගාරාවැටී ඇති අතර නිල නිවාසයද අබලන් තත්වයේ ඇත. එසේම මෙම ගොඩනැගිලි වල වහල අබලන් මට්ටමක පවතී. මිදිගම රෝහලේ තත්වයද ඇත්තේ මීට සමාන තත්වයක් වන අතර එහිදි පැරණි ගොඩනැගිලි සියල්ල අළුත්වැඩියා කල යුතුව ඇත. මිරිස්ස හා මිදිගම රෝහල පිහිටා ඇත්තේ අධිසනත්ව සංචාරක කලාපයේ බැවින් සංචාරකයින්ට හා ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සැපයිම සඳහා මෙම රෝහල් නවීකරණය කළ යුතුව ඇත.

වැලිගම ප්‍රාදේශිය සභ බල ප්‍රදේශයට අයත් වැලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාමිය රෝහලක් හෝ මධ්‍යම බෙහෙත් ශාලාවක් නොමැති අතර එම සේවා ලබා ගැනීමට ප්‍රදේශයේ ජනතාව වෙනත් ප්‍රදේශ කරා ගමන් කිරීමට සිදුවී ඇත. එම නිසා එම ප්‍රදේශයට මධ්‍යම බෙහෙත් ශාලාවක් හෝ ආරම්භ කිරීම සුදුසු බවට යෝජනා කෙරේ.

මීට අමතරව වැලිපිටිය හා වට්ටක්ගොඩ ප්‍රදේශය ආශ්‍රිතව දේශිය ආයුර්වේද රෝහල් පවතින අතර මෙම රෝහල් වල සේවා සංචාරක කර්මාන්තය සමග සම්බන්ධ කොට

නූතන ආයුර්වේද ක්‍රම සහිත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම ට හඳුනා ගෙන ඇත.

**ඡායාරූප අංක 25 : සංචාරක කර්මාන්තය ප්‍රමුඛ කරගත් නූතන ආයුර්වේද ක්‍රම**



මූලාශ්‍රය : අන්තර්ජාලය

අධ්‍යාපනික සේවා සැලැස්ම

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ අධ්‍යාපන පහසුකම් පිළිබඳව අවධානය යොමු කිරිමේදි පාසල් වර්ගීකරණය අනුව ජාතික හා පළාත් සභා පාසැල් ඇතුළු මුළු පාසල් 48ක් පිහිටා ඇති අතර ඉන් 1AB පාසල් කාණ්ඩයට අයත් පාසල් 03ක්ද මහා විද්‍යාල 13ක්ද, කණිෂ්ඨ විද්‍යාල 19ක්ද, ප්‍රාථමික විද්‍යාල 13ක් ද වශයෙන් පිහිටා ඇත. 2011 ජන හා නිවාස සංසණනයට අනුව වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සාක්ෂරතා මට්ටම 98%ක් පමණ වන අතර එය දිස්ත්‍රික්කයේ සාක්ෂරතා මට්ටම සමාන අගයක් ගනී. මේ අනුව වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සාක්ෂරතාවය සතුටුදායක මට්ටමක පවතින බව හඳුනා ගත හැකිය. ප්‍රදේශයේ ගුරු ශිෂ්‍ය අනුපාතය 1:18 ක් වන අතර මෙහි සම්මත තත්වය එක් ගුරුවරයකු සදහා සිසුන් 19ක් වන බැවින් ප්‍රදේශයේ පාසල් තුළ ගුරු සිසු අනුපාතය සතුටුදායක මට්ටමක පවති.

වර්තමානය වන විට 21,150ක ශිෂ්‍ය සංඛ්‍යාවක් මෙම ප්‍රදේශයේ පාසල් තුළ අධ්‍යාපනය ලබන අතර සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකටම අයත් පාසල් ප්‍රදේශය තුළ දක්නට ලැබේ. වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පාසල්වල පිහිටිම අනුව කිලෝමීටර් එකක හා කිලෝමීටර් දෙකක පරිධියක් යටතේ සිදු කල අධ්‍යාපන සේවා පහසුකම් විශ්ලේෂණය යටතේ සමස්ථ සැලසුම් බල ප්‍රදේශය පුරා විහිදී පැතුරුනු අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තියක් හඳුනාගත හැකිය. එම අධ්‍යාපන පහසුකම්වල ව්‍යාප්තිය පහත අංක 9 සිතියමෙහි දැක්වේ.

**සිතියම් අංක 9 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

තවද මාර්ග සංවර්ධන සැලැස්ම මගින් පවත්නා මාර්ගයන්හි තත්වය වැඩි දියුණු කිරීමත් , නව මාර්ග හඳුන්වා දීමත් යනාදිය මගින් අභ්‍යන්තර ප්‍රදේශවල සිසුන්හට නාගරික පාසල් වෙත ප්‍රවේශවීමේ පහසුකම් තවදුරටත් ඇති කෙරේ. මෙම දත්ත අනුව වර්තමාන හා අනාගත ජනගහනයට අවශ්‍ය අධ්‍යාපනික පහසුකම් ලබාදීම සඳහා වන පාසැල්වල පිහිටීම සතුටුදායක මට්ටමක පවතින බව තහවුරු කල හැකිය. නමුත් මෙම පාසල්වල ක්‍රීඩා පිටි සහ සනීපාරක්ෂක පහසුකම් වැඩි කළ යුතුය.

එමෙන්ම වර්ෂ 2033 වන විට වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අපේක්ෂිත සංචාරකයන්ගේ පැමිණීම වසරකට 35000ක් පමණ වේ. ලෝකයේ වර්තමානය වන විට සංචාරකයින් ආකර්ෂණය කිරීමේ නව ක්‍රමෝපායන් ලෙස පාරම්පරික ආයුර්වේද ක්‍රම, දේශීය ආහාර රටාවන් ප්‍රවර්ධනය කිරීම , සංචාරක ආකර්ශනය දිනාගත හැකි ආගන්තුක සත්කාර පිලිබඳව ගවේශනය ඉගැන්වීම සහිත සංචාරක පාසල් ආරම්භ කිරීමේ අවශ්‍යතාවයක් පවති. එමගින් ප්‍රදේශයේ තරුණ තරුණයින්ට නව අධ්‍යාපන අවස්ථාවන් ලබාදෙන අතර එමගින් ප්‍රදේශය තුළ සංචාරක කාර්මාන්තය ආශ්‍රිත රැකියා විශාල ප්‍රමාණයක් ජනනය කිරීමටද ඉඩ අවස්ථා සැලසේ.

**නේවාසික සැලැස්ම**

**සංවර්ධන උපාය මාර්ග 01**

**සණත්වය හා භාවිතය පදනම් කරගත් නේවාසික කලාප ස්ථාපිත කිරීම.**

2022 වර්ෂයෙහි වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මුළු ජනගහනය 106,920ක් වන අතර එම වසරෙහි නිවාස තොගය 29632ක් වේ. වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙහි 2022 වර්ෂය වන විට පවුල් සංඛ්‍යාව 32620ක් වේ. ඒ අනුව 2022 වර්ෂය තුළ ප්‍රදේශයේ නිවාස හිගය 2988ක් වන අතර 2033 වර්ෂය වන විට නිවාස අවශ්‍යතාවය පහත වගු අංක 6 මගින් දක්වා ඇත.

වගු අංක 6 : වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය - නිවාස අවශ්‍යතාවය 2033

| වර්ෂය | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පවත්නා නිවාස | නිවාස අවශ්‍යතාවය |
|---|---|---|---|---|
| 2012 | 102564 | | | |
| 2018 | 105278 | | | |
| 2022 | 106920 | 32620 | 29632 | 2988 |
| 2025 | 109114 | 34107 | 29632 | 2475 |
| 2033 | 113113 | 35348 | 29632 | 5716 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

**2033 වනවිටද පවතින නිවාස තොගය හා තාවකාලික නිවාස ප්‍රමාණයෙහි වෙනසක් සිදු නොවේ යැයි උපකල්පනය කරන ලදී.*

මේ අනුව 2033 වර්ෂය වන විට වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ නිවාස අවශ්‍යතාවය 5716 වේ. මෙම සංවර්ධන සැලැස්ම තුලින් නාගරික බල ප්‍රදේශය තුළ මධ්‍යම ඝනත්ව නේවාසික කලාප ඇති කිරීම, කර්මාන්ත කලාපය තුළ කාර්මික නිවාස සංවර්ධන ව්‍යාපෘති ඇති කිරීම හඳුනා ගෙන ඇත.

සිතියම් අංක 10 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - යෝජිත ජනාවාස සැලැස්ම 2033




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

## සංස්කෘතික, ආගමික උරුම කළමණාකරණ සැලැස්ම

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් ස්ථාන කිහිපයක් හදුනා ගත හැකිය.

### 1. නදී තීරාරාමය

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රාදේශයේ හමුවන ඓතිහාසික වශයෙන් වැදගත් බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස ගරාඩුවේ නදී තීරාරාමය හැදින්විය හැකිය. මෙම බෞද්ධ සිද්ධස්ථානයේ ඉතිහාසය පොළොන්නරු යුගය තරම් ඈතට විහිදී යයි. මහවිරු විජයබාහු රජතුමාගේ ළමා කාලදී චෝලයන්ගෙන් ආරක්ෂාවීම සඳහා මෙම විහාරභූමියේ ජීවත්වී ඇති බවට පුරාවිද්‍යා සාක්ෂි හදුනාගෙන ඇත.විජයබාහු රජතුමා පසු කලක ප්‍රාදේශිය පාලකයන් ලවා මෙම විහාරය ගොඩනංවා ඇත. ප්‍රදේශයේ පැරණිතම පැවිදි පරපුර ආරම්භවී ඇත්තේ මෙම නදී තීරාරාමය ආශ්‍රිතවය. පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් පැරණි සංඝාවාස ගොඩනැගිලි, පැරණි චිත්‍ර, විහාර භූමිය තුළ අදටත් පවති.

ඡායාරූප අංක 26 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - නදී තීරාරාමය





මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 2. සමුද්‍රතීරාරාමය

කඹුරුගමුව සමුද්‍රතීරාරාමය පුරාණ විහාරයකි. මෙම විහාරය සඳහා ගොඩකන්ද පන්සල, තලකද විහාරය හෙවත් කදුරු ගහ පිට්ටනියේ විහාරය යනුවෙන්ද හදුන්වා ඇත. ඉතාමත් පැරණි සිතුවම්, පැරණි විහාරගෙයක්ද මෙහි දක්නට ලැබේ.

### 3. පුරාණ ඇත්කද මහා විහාරය

පුරාණ ඇත්කද මහා විහාරය වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. මෙම විහාරය සතුව පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ගඩොල්, උළු, කෙණි, මැටි බදුන් හා යබොර යනාදිය පුරාවිද්‍යාත්මක කැනීම් මගින් හදුනා ගෙන ඇත.

### 4. කෝවිල් කන්ද රජමහා විහාරය

මෙම විහාරය අනුරාධපුරයේ රජකල කුමරදාස නම් රජු විසින් ඉදිකරන ලදී. මෙහි භූමි ප්‍රමාණය අක්කර 6 ක් පමණ වන අතර මුහුදු මට්ටමේ සිට අඩි 250 ක් පමණ වේ . විහාර භූමිය සතුව ඉපැරණි සිතුවම් දක්නට ලැබේ .

ඡායාරූප අංක 27 : **වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - කෝවිල් කන්ද රජමහා විහාරය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

**උපාය මාර්ග**

❖ සංස්කෘතික ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ස්ථාන දේශීය විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය ඇතිවන පරිදි සංරක්ෂණය කිරීම.

❖ සංරක්ෂණය කරන ලද ස්ථාන නිසි පරිදි නඩත්තු කිරීම හා කළමණාකරණය කිරීම.

❖ මෙම ස්ථානවල ඓතිහාසික හා සංස්කෘතික පුරාවිද්‍යාත්මක වටිනාකම පිලිබඳව දැනුවත් කිරීම හා එමගින් ආර්ථිකමය වශයෙන් දායකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම සඳහා දේශිය හා විදේශිය සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

### 6.3.2. භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

මාර්ග සංවර්ධන සැලැස්ම

වත්මන් මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම ප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලියේදී වැදගත් සහ ප්‍රධාන මෙහෙයක් ඉටු කරනු ලබන අතර එය ප්‍රාදේශීය සංවර්ධනයටද සෘජුවම ඉවහල් වේ. එමනිසා මාර්ග හා ප්‍රවාහන සැලැස්ම වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපේක්ෂිත සංවර්ධනයේ මූලික අඩිතාලම වන අතර මෙම සැලසුම තුලින් මාර්ග සංවර්ධනය හා සබැඳුනු උපායමාර්ගික ව්‍යාපෘතීන් සහ ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත.

**පවතින මාර්ග පද්ධතිය**

අධ්‍යන ප්‍රදේශයේ දැනට පවතින මාර්ග පද්ධතිය පිලිබඳව අවධානය යොමු කිරීමේදී එම මාර්ගයන්හි හිමිකාරත්වය අනුව පළමු පෙළ ප්‍රමුඛත්වයක් ඇති මාර්ගයන් වන මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති මාර්ග සංඛ්‍යාව 05 ක්ද , දෙවන පෙළ ප්‍රමුඛත්වය ඇති මාර්ගයන් වන පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත්වන මාර්ගයන් 20 ක්ද හා තෙවන පෙළ ප්‍රමුඛතාවයක් ඇති සියලුම මාර්ගයන් වන 380 ක්ද මේ යටතට අයත්වේ. මෙම සංවර්ධන බල ප්‍රදේශය තුළ මාර්ග සඳහා වෙන්වී ඇති මුළු බිම් ප්‍රමාණය 3.4% පමණි.

**යෝජිත මාර්ග සංවර්ධනය**

**සංවර්ධන උපාය මාර්ග 01**

**වැලිගම ප්‍රා දේශීය සභා බල ප්‍ර දේශයේ දැනට පවත්නා මාර්ග පද්ධතිය විධිමත් ලෙස සංවර්ධනය කිරීම.**

සැලසුම් බල ප්‍රදේශය පුරා නාගරික හර ප්‍රදේශ සමඟ අනෙකුත් ප්‍රදේශ එකිනෙකට ඒකාබද්ධ කරලමින් පැතිරුණු අභ්‍යන්තර මාර්ග ජාලය පුළුල් කිරීමට මෙම සැලැස්ම තුලින් යෝජනා කෙරේ. 2033 වන විට යෝජිත මාර්ග පද්ධතිය සිතියම් අංක 11 මගින් දැක්වේ.

**සිතියම් අංක 11: වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - යෝජිත මාර්ග පද්ධතිය**






මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

**මීටර් 24 (අඩි 80) දක්වා පුළුල් විය යුතු මාර්ග**

- **ගාල්ල - මාතර මාර්ගය නූපේ හන්දියේ සිට කඹුරුගමුව හන්දිය දක්වාත්, එතැන් සිට කඹුරුගමුව ලැබීම හේන්වල මාර්ගය කඹුරුගමුව හන්දියේ සිට ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය හමුවන ස්ථානය දක්වා (හේන්වල හන්දිය දක්වා)**

මෙම මාර්ගය කොටවිල නව පරිපාලන නගරය හරහා ගමන් කරන අතර කොටවිල නගරයේ ස්ථාපිත මහා රෝහල හා අධිකරණ සංකීර්ණයෙන් දෛනික සේවා ලබා ගැනීමට පැමිණෙන විශාල ජන සංඛ්‍යාවට සේවා ලබා දීමේ අරමුණින් **මීටර් 24** (අඩි 80) දක්වා පදික මංතීරු සහිතව පුළුල් කිරීමට සැලසුම්කර ඇත. ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයේ ගමන් ගන්නා සියළුම දුරගමන් බස් රථ එම මාර්ගය ඔස්සේ ගමන් කිරීමට යෝජනා කරන අතර මිරිස්ස ප්‍රදේශයේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයේ (කඹුරුගමුව සිට මෝදර දක්වා) වාහන ගමනාගමනය අඩු කිරීම මේ තුලින් ආරක්ෂා කෙරේ.

සිතියම් අංක 12 : **වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - මීටර් 24 (අඩි 80) ක් දක්වා පුළුල් විය යුතු මාර්ග**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

රූප සටහන් අංක 6 : මීටර් 24 (අඩි 80) පළල මාර්ග හරස්කඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

- ලැබීම - සුල්තානාගොඩ මාර්ගය ( ලැබීම හන්දියේ සිට සුල්තානාගොඩ හන්දිය දක්වා)

**මීටර් 20 (අඩි 66) දක්වා පුළුල් විය යුතු මාර්ග**

- වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය (වැලිගම නගරයේ සිට තෙලිජ්ජවිල මංසන්ධිය දක්වා)
- වැලිගම - කනංකෙ මාර්ගය (කඩේවත්ත පාලම සිට කනංකෙ හන්දිය දක්වා)
- ගාල්ල - මාදම්පේ මාර්ගය

රූප සටහන් අංක 7 : මීටර් 20 (අඩි 66) පළල මාර්ග හරස්කඩ



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

**මීටර් 15 (අඩි 50) දක්වා පුළුල් විය යුතු මාර්ග**

- ලැබීම - ගොඩගම - සුල්තානාගොඩ මාර්ගය
- ගාල්ල- මාතර ප්‍රධාන මාර්ගය (කඹුරුගමුව හන්දියේ සිට මිදිගම දක්වා)

**රූප සටහන් අංක 8 : මීටර් 15 (අඩි 50) පළල මාර්ග හරස්කඩ**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

**මීටර් 12 (අඩි 40) දක්වා පුළුල් විය යුතු මාර්ග**

- පැනැටියන මූණමල්පේ පාර (වැලිගම කනංකෙ මාර්ගයේ සිට වැලිගම තෙලිජ්ජවිල මාර්ගය දක්වා)
- මිරිස්ස වටරවුම් මාර්ගය
- උඩුකාව හල්ලල මාර්ගය
- මාලිම්බඩ- අකුරුගොඩ - වැලිහිද මාර්ගය
- කොටවිල කිරිමැටිමුල්ල මාර්ගය
- බටවල පාතෙගම මාර්ගය (වැල්ලක්ක හන්දියේ සිට අග්‍රබෝධි මාවත දක්වා)
- මිදිගම - ඉබ්බාවල මාර්ගය

**රූප සටහන් අංක 9 : මීටර් 12 (අඩි 40) පළල මාර්ග හරස්කඩ**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

**මීටර් 9 (අඩි 30) දක්වා පුළුල් විය යුතු මාර්ග**

- වැලිගම පංචාලිය මාර්ගය
- උඩුපිල මාර්ගය (උඩුපිල හන්දියේ සිට හේන්වල හන්දිය දක්වා)
- පොල්වතුමෝදර දෙනිපිටිය මාර්ගය (පොල්වතුමෝදර පාලම අසල සිට දෙනිපිටිය හන්දිය දක්වා)
- සුල්තානාගොඩ වරකපිටිය මාර්ගය (මාලිම්බඩ - අකුරුගොඩ මාර්ගයේ සිට ගොඩගම හන්දිය දක්වා)
- සුනන්ද මාර්ගය (මිරිස්ස) (ගාල්ල -මාතර මාර්ගයේ සිට ගුණසිරි නාහිමි මාවත දක්වා)
- ගරාඩුව මාර්ගය (උඩුපිල හන්දියේ සිට ගරාඩුව හන්දිය දක්වා)
- පලල්ල - බොරාල - කොලේදණ්ඩ මාර්ගය (වැලිගම කනංකෙ මාර්ගයේ සිට වැල්ලක්ක හන්දිය දක්වා)
- ගුණසිරි නාහිමි මාවත
- යටිපිල මාර්ගය

**රූප සටහන් අංක 10 : මීටර් 9 (අඩි 30) පළල මාර්ග හරස්කඩ**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

**වගු අංක 7 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - පුළුල් කිරීමට යෝජිත වෙරළ ප්‍රවේශ මාර්ග**

2033 වන විට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් දේශීය සහ විදේශීය සංචාරක ආකර්ෂණය ඉහල නැංවීමේ අරමුණින් වෙරළ ප්‍රවේශ මාර්ගයන් සහ සංචාරක ප්‍රදේශයන් සඳහා ප්‍රවේශ වන මාර්ගයන් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. එම පුළුල් කිරීමට අපේක්ෂිත මාර්ගයන් පිළිබඳව වගු අංක 06 මගින් දැක්වේ.

| | පුළුල් කිරීමට යෝජිත වෙරළ ප්‍රවේශ මාර්ගය | පවතින පළල (m) | යෝජිත පළල (m) |
|---|---|---|---|
| 01 | එපිටමුල්ල මාර්ගය | 4.5 | 7.0 |
| 02 | මිරිස්ස ගේට්වේ හෝටලය අසල මාර්ගය | 3.6 | 7.0 |
| 03 | මරදානවත්ත මාර්ගය 01 (ආතුලයා හෝටලය අසල) | 3.6 | 7.0 |
| 04 | කොකනට් ට්‍රී හිල් ප්‍රවේශ මාර්ගය | 3.0 | 7.0 |
| 05 | පෙම්උයන්වත්ත මාර්ගය | 4.5 | 7.0 |
| 06 | මීරාවැල්ල මාර්ගය | 4.5 | 7.0 |
| 07 | වෙහෙරගල පන්සල අසල මාර්ගය | 5.4 | 7.0 |
| 08 | මන්දාරා හෝටලය අසල මාර්ගය | 3.0 | 7.0 |
| 09 | 20 -20 හෝටලය අසල මාර්ගය | 4.5 | 7.0 |
| 10 | සහබන්දුවත්ත ප්‍රවේශ මාර්ගය | 4.5 | 7.0 |
| 11 | කල්දේරම්වත්ත ප්‍රවේශ මාර්ගය | 3.6 | 7.0 |
| 12 | ප්‍රාදේශීය සභාව ඉදිරිපිට වෙරළ ප්‍රවේශ මර්ගය | 3.6 | 7.0 |
| 13 | ජයසයුරුපුර මාර්ගය | 3.6 | 7.0 |
| 14 | අභිමානීගම කන්ද පාමුල මාර්ගය | 4.5 | 7.0 |
| 15 | සික්ස් මිදිගම හෝටලය අසල මාර්ගය | 3.0 | 7.0 |
| 16 | දේනුවල සාගර කරවල කඩය ඉදිරිපිට මාර්ගය | 4.5 | 7.0 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

## ප්‍රවාහන සංවර්ධන සැලැස්ම

### සංවර්ධන උපාය මාර්ග 01

**කාර්යක්ෂම ප්‍රවාහන සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රවාහන සැලැස්ම පිලිබඳ සලකා බැලීමේදී කොටවිල නව නගර ආශ්‍රිතව දැනට නව මහා රෝහල සහ අධිකරණ සංකීර්ණය ඇතුළු රාජ්‍ය ආයතන මගින් සේවා ලබා ගැනීම සඳහා දෛනිකව විශාල ජන සංඛ්‍යාවක් එම ප්‍රදේශය වෙතට පැමිණේ. නමුත් ඔවුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සහ රථගාල් පහසුකම් එම ප්‍රදේශය ආශ්‍රිතව දැනට නොපවතින අතර සියලු පහසුකම් සහිත නව බස් නැවතුම්පොළක් , රථ වාහන නැවතුම් ස්ථාන සංවර්ධනය කිරීමට යෝජිතව ඇත.

**රූප සටහන් අංක 11 :** වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය
**කොටවිල නව බස්නැවතුම්පොල ගෘහ නිර්මාණ සැලැස්ම**







මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ මිදිගම, පොල්වතුමෝදර , මිරිස්ස, කඹුරුගමුව යන දුම්රිය නැවතුම් ස්ථාන ඉතා පැරණි තත්වයේ පවතින අතර මගීන් සඳහා අවශ්‍ය පොදු පහසුකම් ප්‍රමාණවත් මට්ටමකින් නොමැත. පොල්වතුමෝදර දුම්රිය ස්ථානයට ළඟාවෙන ප්‍රවේශ මාර්ගයද දැනට පවතිනුයේ ඌන සංවර්ධිත මට්ටමකිනි. තවද එම දුම්රිය නැවතුම් ස්ථානවල ඇතැම් ගොඩනැගිලි අබලන් මට්ටමක පවතී. මිරිස්ස සහ පොලඅතුමෝදර දුම්රිය ස්ථානවල පිහිටීම අනුව මිරිස්ස , වැලිගම , පැලෑන වැනි ප්‍රසිද්ධ සංචාරක ප්‍රදේශ සඳහා පහසුවෙන් ළඟා විය හැකිය. විශේෂයෙන්ම සංචාරකයින් තමන්ගේ ගමනාගමන පහසුකම් සඳහා දුම්රිය මාර්ග වැඩි වශයෙන් යොදා ගන්නා අතර එම දුම්රිය නැවතුම්පොළවල් ප්‍රතිසංවර්ධනය කිරීම තුලින් වැලිගම ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට හේතු වේ. තවද දුම්රිය ස්ථාන නවීකරණය කිරීම තුලින් පොදු මහජනතාවට අවශ්‍ය පහසුකම් ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කෙරේ.

ඡායාරූප අංක 28 **: පොල්වතුමෝදර දුම්රිය නැවතුම් ස්ථානය පවත්නා තත්වය සහ යෝජිත පෙනුම**





යෝජිත තත්වය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

ඡායාරූප අංක 29 : **මිරිස්ස දුම්රිය නැවතුම් ස්ථානය පවත්නා තත්වය සහ යෝජිත පෙනුම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

## යෝජිත රථ වාහන නැවතුම් ස්ථාන

අධ්‍යයන ප්‍රදේශයේ උප නාගරික මධ්‍යස්ථාන සඳහා ද රථවාහන සැලැස්ම යටතේ රථවාහන නැවතුම් ස්ථාන හඳුනාගෙන ඇත. ඒ අනුව දෙනිපිටිය මංසන්ධිය ආශ්‍රිතව පිහිටා ඇති වැලිගම ප්‍රාදේශීය සභාව සතු පොළ භූමියේ කොටසක්ද , වැලිපිටිය පොළ භූමියේ කොටසක්ද පොල්වතුමෝදර පැරණි පාලම අසල ඇති භූමියද, රථවාහන නැවතුම් ස්ථාන ලෙස හඳුනාගෙන ඇත.

## යෝජිත ජල සැපයුම් සැලැස්ම

### සංවර්ධන උපාය මාර්ග 01

**ස්වාභාවික ජල මූලාශ්‍ර අසුරෙන් ගුණාත්මක හා ප්‍රමාණාත්මක ජල සැපයුමක් ලබා දීම**

වැලිගම ප්‍රදේශීය සභා බල ප්‍රදේශය සඳහා ජල සම්පාදන මණ්ඩලය මගින් නල ජලය බෙදාහැරීම සිදු කරනු ලබන අතර එම ජලය පරිභරණය කරනු ලබන්නේ සංවර්ධන බල ප්‍රදේශයේ මුළු ජනයාගෙන් 85%ක් තුළ වන අතර 17%ක් පමණ ළිං හා වෙනත් ජල මූලාශ්‍ර මගින් ජල අවශ්‍යතාවය සපයා ගනී. මෙම සංවර්ධන සැලැස්ම තුලින් 2033 වන විට අපේක්ෂිත ජනගහනය සහ ජල අවශ්‍යතවයේ ප්‍රමාණය පහත දක්වා ඇත.

වගු අංක 8 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - දෛනික ජල අවශ්‍යතාවය 2033

| වර්ෂ | දෛනික නේවාසික ජල අවශ්‍යතාවය (ඝණ මීටර්) | දෛනික සංසරණ ජනගහනය සඳහා ජල අවශ්‍යතාවය (ඝණ මීටර්) | එකතුව (ඝණ මීටර්) |
|---|---|---|---|
| **2012** | 13,846.1 | 208.0 | 14054.1 |
| **2018** | 14,212.5 | 220.8 | 14433.3 |
| **2021** | 14,434.2 | 170.0 | 14604.2 |
| **2033** | 15,270.2 | 340.0 | 15610.2 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය , මාතර දිස්ත්‍රික් කාර්යාලය

ඉහත වගුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සම්මත අගයන්ට අනුව නේවාසික ජනගහනය සඳහා දෛනික ඒක පුද්ගල ජල අවශ්‍යතාවය ලීටර් 135.0 යන අගය අනුව ගොඩනගා තිබේ. ජාතික ජල සම්පාධන හා ජලාපවහන මණ්ඩලයේ සම්මත අගයන්ට අනුව දෛනික සංසරණ ජනගහනය සඳහා ඒක පුද්ගල ජල අවශ්‍යතාවය ලීටර් 4ක් වේ.

2033 වර්ෂය වනවිට වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි සංචාරක හා අනෙකුත් ආර්ථික කටයුතු වල ඇතිවන සංවර්ධනය අනුව අධික ජල ඉල්ලුමක් පවතින අතර එය ඝන මීටර 15,270.2 වේ. විශේෂයෙන්ම යෝජිත කර්මාන්තපුරයේ කර්මාන්ත කටයුතු ආරම්භ වුවහොත් ජලය සඳහා අධික ඉල්ලුමක් ඇතිවන අතර මේ සඳහා ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරමින් පවතින විසල් මාතර අදියර vi ජල ව්‍යාපෘතිය යටතේ මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි ජල සැපයුම ලබා දීමට සැලසුම් කර ඇත.

## යෝජිත විදුලි සැලැස්ම

ජාතික විදුලි බල පද්ධතයේ දකුණු පළාතට විදුලිය සපයනු ලබන්නනේ මතුගම, ගාල්ල දෙනියාය, ඇඹිලිපිටිය හා බලංගොඩ පිහිටි උප පොළවල් හරහා ඒ අනුව මෙම ප්‍රදේශයට විදුලිය සැපයිම සඳහා මෙගා ඇම්පියර් 231.5 ධාරිතාවයකින් යුතු ග්‍රිඩ් උපපොළක් හරහා මාතර, ගොඩගම, මැද්දවත්ත හා කඹුරුපිටිය යන ස්ථානවල පිහිටා ඇති අධිවේගී මාර්ග හරහා සම්බන්ධිත උපපොලවල් මගින් සිදු කෙරේ.

වැලිගම ප්‍රාදේශිය සභ බල ප්‍රදේශය තුළ වානිජ, කාර්මික හා ආගමික ස්ථාන සඳහා විදුලිබලය සපයා ඇති අතර, පවත්නා නිවාස සංඛාවෙන් 98%කට විදුලි බලය සපයා ඇත. ඒ අනුව විදුලිය නොමැති නිවාස 2%ක් ලෙස ගණන් බලා ඇත. එම නිවාස තාවකාලික නිවාස ලෙස හඳුනා

ගන්නා ලදි. වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඉදිරි සංවර්ධන කටයුතු වලදි ඉහල විදුලි ධාරිතාවයක් ලබා දීමට අවශ්‍ය වන අතර එම අවශ්‍යතාව සම්පූර්ණ කිරිමේ හැකියාව ජාතික විදුලි බල මණ්ඩලයට හැකියාව ඇත. යෝජිත කර්මාන්ත උද්‍යානය, සංචාරක, නේවාසික, පරිපාලන යන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි වැඩි විදුලි බෙදා හැරීමේ ධාරිතාවකින් යුක්තව කාර්යක්ෂමව විදුලි සැපයුම වැඩි කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව සූර්ය බලය හා විකල්ප බල ශක්ති පදනම් කර ගනිමින් විදුලි බල සැපයුම සංවර්ධනය කිරීමට අවශ්‍ය වේ.

**සිතියම් අංක 13 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : විදුලි සැපයුම**




මූලාශ්‍රය : ලංකා විදුලි බල මණ්ඩලය

### ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ හා මලපවාහන සැලැස්ම

සංචාරක කටයුතු ධීවර වෙළඳ හා වානිජ කටයුතු, කාර්මික හා කෘෂි කාර්මික කටයුතු වලදී මෙන්ම අනෙකුත් පොදු කටයුතු වලදී ජනනය වන අපද්‍රව්‍ය ඝණ අපද්‍රව්‍ය ලෙස සලකනු ලැබේ. සංචාරක හෝටල් වලින් ඉවත්වන අපද්‍රව්‍ය මිරිස්ස ධීවර වරාය මගින් ඉවතලන දිරාපත්වන අපද්‍රව්‍ය ආහාර අපද්‍රව්‍ය ඇසුරුම් වශයෙන් ඉවත්කරන කඩදාසි, ලෝහ, ප්ලාස්ටික්, වීදුරු ඉවතලන රෙදි කර්මාන්ත ශාලාවලින් ඉවතලන දෑ යනාදි කොටස්වලින් යුක්ත වේ.

වැලිගම ප්‍රාදේශිය සභාව විසින් සපයන ලද දත්තයන්ට අනුව දෛනිකව ජනනය වන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය දළ වශයෙන් ටොන් 18ක් පමණ වෙ. මෙම ප්‍රමාණයට ධීවර වරාය මගින් ඉවතලද ෆයිබර්, රිජිෆෝම් වැනි නොදිරන අපද්‍රව්‍ය අයත් නොවේ. වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කසල එකතු කිරීම ප්‍රාදේශිය සභාව මගින් දිනපතා සිදු කරන අතර එක් එක් ප්‍රදේශ වලට දින වෙන් කර ඇත අතර මිරිස්ස සිට කඹුරුගමුව දක්වා වන සංචාරක කලාපය තුළ සතියට දින 06ක් ට්‍රැක්ටර් 02ක් යොදා කසල එකතු කිරීම සිදු කරයි.

ප්‍රදේශයේ එක්රැස්වන කසල එකතු කිරිමේ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශිය සභාව සතුව අත්ට්‍රැක්ටර් 01ක් ලොකු ටිපර් රථ 01ක් යොදා සිදුකරනු ලබන අතර එකතුවන ඝණ අපද්‍රව්‍යයන්හි සංයුතිය වගු අංක 9 මගින් දක්වා ඇත.

**වගු අංක 9 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ඝණ අපද්‍රව්‍ය සංයුතිය -2022**

| ඝණ අපද්‍රව්‍ය සංයුතිය | ප්‍රතිශතය (%) |
|---|---|
| දිරාපත්වන ශාක හා සත්ව කොටස් | 77% |
| දිරාපත් නොවන ද්‍රව්‍ය | 12% |
| ඉහත වර්ග දෙකම අයත් නොවන | 11% |

මූලාශ්‍රය - වැලිගම ප්‍රාදේශිය සභාව 2022

ප්‍රදේශය තුළ ජනනය වන කැලිකසල වලින් ඉහල ප්‍රතිශතයක් අන්තර්ගතය දිරාපත්වන ශාඛ හා සත්ව කොටස් වේ. එම ප්‍රමාණය 77%කි. මෙසේ එකතුවන දිරාපත් වන සහ දිරාපත්නෙවන කසල වැලිගම ප්‍රාදේශිය සභාව සතු ගරාඩුව ප්‍රදේශයේ පවතින කසල ප්‍රතිචක්‍රිය කරණය සිදු කරන ස්ථානයට බැහැර කරන අතර දිරාපත්වන ද්‍රව්‍ය තෝරා කොම්පෝස්ට් නිෂ්පාදනය කරනු ලබන අතර දිරාපත් නොවන ද්‍රව්‍ය ඒ අසල විවෘත භූමියතුට බැහැර කිරීම සිදු කරයි. මේ තුලින් ගරාඩුව කලපුව ආශ්‍රිත සංවේදි පරිසර

පද්ධතිය දූෂණය වෙමින් පවතී. ඒ අනුව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා විධිමත් කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොමැත.

එසේම වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මලපවාහන සහ අපජලය බැහැර කිරීමේ විධිමත් ක්‍රමවේදයක්ද නොමැත . විශේෂයෙන්ම වෙරළ කලාපය තුළ පවතින සංචාරක හෝටල් ඇතුළු අනෙකුත් වාණිජ ගොඩනැගිලි වල ව්‍යාප්තිය වැඩිවීමත් සමග ම කලාපය මුහුදු මට්ටමට වඩා පහතින් පිහිටීම මත මලපවාහන හා අපජලය බැසයාමේ ගැටළුවකට මුහුණ පා සිටී. මේ නිසා ප්‍රදේශය තුළ ආයෝජනය කරනු ලබන ආයෝජකයන් හට විකල්ප මලපවාහන පද්ධති ස්ථාපිත කිරීම සඳහා විශාල මුදලක් යෙදවීමට සිදු වන අතර මේ නිසා ඇතැම් යෝජනා අවස්ථා ද මග හැරී ගොස් ඇත.

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ග සැලැස්ම**

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය පමණක් නොව විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයේ පළාත් පාළන ආයතන 7කට පොදු ගැටළුවක් වන ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම සඳහා අක්කර 50කින් සමන්විත භූමියක් වැලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වාලිමවුන්ට් ප්‍රදේශයේ හඳුනා ගෙන ඇති අතර මෙම භූමියේ අක්කර 40 පමණ ප්‍රමාණයක් ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය කිරීම සඳහා අක්කර 10ක පමණ භූමි ප්‍රමාණයක් මළාපවාහන හා අපජල පිරිපහදු කිරිමේ ඒකකයක් ස්ථාපිත කිරීමට ද හඳුනා ගෙන ඇත. ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරීම තුලින් විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයෙන්ම කැලි කසල සහ මළාපවාහන ගැටළුවට විසඳුමක් ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතියට අදාල භූමිය ඡායාරූප අංක 30 මගින් පෙන්වා ඇත

**ඡායාරූප අංක 30 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාල භූමිය**






මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

## 6.4. ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

**හැදින්වීම**

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඉදිරි දැක්ම පිළිබඳව බලපවත්නාවූ ප්‍රබලතම අංගයක් වනුයේ එම ප්‍රදේශයේ පවත්නා ආර්ථික තත්ත්වය සහ ඉදිරි අනාගත සංවර්ධන ව්‍යාපෘතින්ය. ඒ අනුව වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ආර්ථිකය ප්‍රධාන වශයෙන් සංචාරක, කාර්මික, වානිජ්‍ය සේවා පහසුකම්, ධීවර හා කෘෂි කර්මාන්තය යන ප්‍රධාන අංශ මත පදනම්ව සැකසි ඇති අතර මෙම ආර්ථික විභවතාවයන් ප්‍රශස්ථ ලෙස භාවිතා කරමින් ප්‍රදේශයේ පවතින ආර්ථික විවිධාංගීකරණයෙහි ප්‍රතිලාභ ප්‍රදේශය පුරා ව්‍යප්ත කරලිම සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනිම ආර්ථික සංවර්ධන සැලැස්ම මගින් සිදුවේ. මෙහිදි ප්‍රධාන වශයෙන්,

1. සංචාරක සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම
2. වාණිජ සහ සේවා සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම
3. කර්මාන්ත සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

යන ප්‍රධාන අංශ තුනක් ඔස්සේ සළකා බලා ඇත.

### 6.4.1. සංචාරක සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

**සංවර්ධන උපාය මාර්ග 01**

**වැලිගම ප්‍රදේශය තුළ වෙරළ ආශ්‍රිත සංචාරක ක්‍රියාකරකම් වර්ධනයට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම.**

**සංවර්ධන උපාය මාර්ග 02**

**වැලිගම පවතින ස්වාභාවික පාරිසරික ස්ථාන සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනිම.**

**සංවර්ධන උපාය මාර්ග 01**

**වැලිගම ප්‍රදේශය තුළ වෙරළ ආශ්‍රිත සංචාරක ක්‍රියාකරකම් ප්‍රවර්ධනයට අවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම.**

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය කි. මී. 18.0 තෙක් විහිදී ගිය මුහුදු තීරයකින්, මුහුදු දූපත්, කලපු සහිත ස්වාභාවික පිහිටිමක් හේතුකොටගෙන සංචාරක කර්මාන්තය මැනවින් ස්ථානගත වී ඇත. විශේෂයෙන් පැලැන, මිරිස්ස, ගිරාගල , මෝදර වෙරළ තීරයේ පවතින මද රළ සහිත ස්වභාවය දෙස් විදෙස් සංචාරකයින් සඳහා රළ මත ලිස්සායාමේ ක්‍රිඩාව සඳහා මනා ප්‍රවේශකත්වයක් සැපයේ. මෙරටට සංචාරකයින් වැඩි වශයෙන් පැමිණෙන කාලසීමාවේදී දෛනිකව සංචාරකයින් 50-100 පමණ මිරිස්ස වෙරළ තීරය ආශ්‍රිතව රළ මත ලිස්සා යාමේ ක්‍රිඩාවේ නිරතවන අතර මේ තුලින් දිනකට එම ක්‍රිඩා පුහුණු කරුවන් සැළකිය යුතු ආදායමක් උපයාගනී.

**ඡායාරූප අංක 31 : වෙරළ ආශ්‍රිත සංචාරක ක්‍රියාකරකම්**



මූලාශ්‍රය : අන්තර්ජාලය ආශ්‍රයෙන්

ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් බහුතරයක් නිල් තල්මසුන් නැරඹීමට ඉමහත් රුචිකත්වයක් දක්වන අතර මිරිස්ස වරාය තුළ ඉතා සීමිත පහසුකම් සහිතව ඒ සඳහා අවස්ථා ලබා දී ඇත. මිරිස්ස වෙරළ තීරය ආශ්‍රිතව තල්මසුන් වර්ග 08ක් හා ඩොල්ෆින් වර්ග 07ක් එකවර සුලබව නැරබිය හැකි සුවිශේෂී මුහුදු ප්‍රදේශයක් ලෙස ප්‍රචලිතව පවතින අතර මෙහි *Blue Whale, Byrd's Whale, Sperm Whale, Humpback Whale, Omura's Whale, Killer Whale, Melon Headed Whale , Short Finned Pilot Whale* යන තල්මසුන් විශේෂ මෙහි වාසය කරයි. සංචාරකයන් බහුතරයක් ගැවසෙන දෙසැම්බර් සිට මාර්තු කාලසීමාව තුළ මගී යාත්‍රා 44ක් පමණ මේ සඳහා යොදා ගනියි. දෛනිකව සංචාරක මගී යාත්‍රා 20ක් පමණ තල් මසුන් නැරඹීම සඳහා වරායෙන් පිටත් වන අතර එම එක් යාත්‍රාවක මගින් 50ක් පමණ ගමන් කිරීමට ඉඩපහසුකම් පවතී. යාත්‍රා හිමිකරුවන් මේ තුලින් සැළකිය යුතු ආදායමක් උපයා ගනී. එසේම මිරිස්ස ධීවර වරාය හා වන ජීවි දෙපාර්තමේන්තුව ඒ තුළින් විශාල ආදායමක් උපයා ගනු ලබයි.

වගු අංක 10 : වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය

**මිරිස්ස සමුද්‍රීය කලාපයෙහි තල්මසුන් නැරඹීම පිළිබඳ සංචාරක ආකර්ෂණය සඳහා සංචාරකයින් පැමිණීම හා ආදායම (2019 සිට 2023 දක්වා)**

| වර්ෂය | සංචාරකයන් පැමිණීම (දේශීය හා විදේශීය) | අදායම (රු.මි.) |
|---|---|---|
| **2019** | 110,556 | 245 |
| **2020** | 46,660 | 114 |
| **2021** | 12,755 | 17 |
| **2022** | 48,475 | 97 |
| **2023 අගෝස්තු දක්වා** | 45,579 | 105 |
| **2023 අපේක්ෂිත** | 68,368 | 157 |

මූලාශ්‍රය : වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මිරිස්ස

ඡායාරූප අංක 32 : නිල් තල්මසුන් නැරඹීම



මූලාශ්‍රය : අන්තර්ජාලය

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ වෙරළ ආශ්‍රිතව පවතින සංචාරක කර්මාන්තය පමණක් නොව ප්‍රාදේශයේ අභ්‍යන්තරයේ පවතින ජෛව විවිධත්වයෙන් යුත් ගරාඩුව කලපුව හා අවට ප්‍රදේශය, බොරාල වැව, වන රක්ෂිතයක් පිහිටීම පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා මනා විභවතාවයක් පවති.

සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණය මගින් වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවත්නා හෝටල්, ඒවායේ සේවය කරන සේවකයින් පිලිබඳව තොරතුරු පහත වගුව මගින් දක්වා ඇත.

**වගු අංක 11 : වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය - පවත්නා හෝටල් සහ ඒවායේ සේවය කරන සේවකයින් පිලිබඳ තොරතුරු**

| හෝටල් වර්ග | සංඛ්‍යාව | | සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2012 | 2018 | 2012 | 2018 |
| හෝටල් | 10 | 35 | 100 | 350 |
| තරුපහ (තරු. පන්තියේ) | 05 | 15 | 200 | 600 |
| ලැගුම්හල් | 15 | 48 | 30 | 98 |
| ආගන්තුක නිවාස | 18 | 25 | 45 | 150 |
| නිවාසය සමඟ ලැගුම්හල (Home Stay) | 25 | 95 | 50 | 190 |
| එකතුව | **73** | **218** | **425** | **1388** |

*මුලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ තොරතුරු*

ඉහත වගුවට අනුව 2012, වර්ෂයේ 73ක්ව පවතින හෝටල් සංඛ්‍යාව 2018 වර්ෂය වන විට 218 දක්වා වර්ධනයවී ඇත. එසේම 2012 වසරේ මේ ආශ්‍රිතව සේවා නියුක්තින් 425 වි ඇති අතර 2018 වර්ෂය වන විට ප්‍රමාණය 1388 කින් වර්ධනය වි ඇත. ඒ අනුව වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන අතර එසේම දේශිය ආර්ථිකයට ලැබෙන දායකත්වයද වර්ධනය වී ඇත. තවද සංචාරක කේෂ්ත්‍රයේ රැකියා නියුක්තියේ කැපි පෙණෙන වර්ධනයක් පෙන්නුම් කරන බැවින් පවතින රැකියා වියුක්තිය අවම කිරීමටද මෙම කර්මාන්තය මනා පිටුවහලක් වී ඇත. මෙම කර්මාන්තය ආශ්‍රිතව වක්‍ර රැකියා අවස්ථා 2500 ක් පමණ ඇතිවී ඇත. එම නිසා සැලසුම් බල ප්‍රදේශයේ මිදිගම, මිරිස්ස, කඹුරුගමුව දක්වා වෙරළ තීරය ආශ්‍රිතව සංචාරක කර්මාන්තයේ පහසුකම් වැඩිදියුණු කිරීමට යෝජනා කෙරේ. මේ සඳහා ප්‍රදේශයේ පවතින සංචාරක විභවතාවයක් සහිත ස්ථාන සැලකිල්ලට ගෙන අධ්‍යන ප්‍රදේශය ප්‍රධාන කොටස් 02ක් යටතේ සංවර්ධනය කිරීමට යෝජිතය.

1. මිදිගම, මිරිස්ස සිට කඹුරුගමුව දක්වා වෙරළ තීරය ප්‍රමුඛ ප්‍රදේශය සංචාරක කොරිඩොවක් ලෙස නිර්මාණය කිරීම.

2. ප්‍රදේශයේ අභ්‍යන්තරයේ පවතින කලපුව, වැව් හා තෙත්බිම් පද්ධතියේ පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා යොදා ගැනීම

යන ද්විත්වය සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා යොදා ගත් ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස දැක්විය හැකිය. තවද සංචාරක කර්මාන්තය සංවර්ධන උපායමාර්ගික සැලැස්ම යටතේ බලාත්මක කිරීම සඳහා වන නීති හා රෙගුලාසි දෙවන කොටසින් වැඩිදුරටත් විස්තර කෙරේ.

මිදිගම, මිරිස්ස, කඹුරුගමුව වෙරළ තීරය ප්‍රමුඛ ප්‍රදේශය සංචාරක කොරිඩොවක් ලෙස නිර්මාණය කිරීම මේ යටතේ කොටස් 05ක් හඳුනා ගන්නා ලදි. එනම්

I. මිරිස්ස මුහුදු තීරය ආශ්‍රිතව ගැවසෙන නිල් තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන දේශිය/ විදේශිය සංචාරකයන් සඳහා පොදු පහසුකම් සංවර්ධනය කිරිමේ අරමුණින් මිරිස්ස ධීවර වරාය ආශ්‍රිතව පොදු පහසුකම් මධ්‍යස්ථානයක් (Facility Center) ඇති කිරීම.

මේ යටතේ තල්මසුන් නැරඹීමට එන සංචාරකයින් සඳහා ආපනශාලා පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, රථවාහාන පහසුකම්, විවේකාගාර හා සෞඛ්‍ය පහසුකම් ඇතුළු සියළුම පහසුකම් ඇති කිරීමත් ඒ සඳහා පවතින ප්‍රවේශමාර්ගය විධිමත් ලෙස සංවර්ධනය කිරීමත් අපේක්ෂා කරන අතර ඒ තුළින් සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට අපේක්ෂා කරයි.

ඡායාරූප අංක 33 : වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය - තල්මසුන් නැරඹීමේ පහසුකම් මධ්‍යස්ථානය දළ සැලැස්ම




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

ඡායාරූප අංක 34 : **වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය - තල්මසුන් නැරඹීමේ පහසුකම් මධ්‍යස්ථානයේ ඉදිරිපස පෙනුම**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

II. ගිරාගල සිට මිරිස්ස දක්වා වෙරළ තීරය පාරිසරික විනෝදාත්මක කොරිඩෝවක් ලෙස (Sea Green Recreational Corridor) සංවර්ධනය කිරීමට හදුනාගෙන ඇති අතර විශේෂයෙන් වෙරළ තීරයේ පවතින සුන්දරත්වය ආරක්ෂා කර ගනිමින් රාත්‍රි කාලයේදි පවා සංචාරකයින් එහි සුන්දරත්වය විදගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට මෙහිදී අපේක්ෂා කෙරේ. මෙසේ ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස ආලෝකකරණය කිරීමටත් බලාපොරොත්තුවෙ. වර්ථමානය වන විට මිරිස්ස වෙරළ තීර ආශ්‍රිතව සංචාරකයන් බහුතරයක් ගැවසෙන බැවින් ආරක්ෂිතව ඔවුන්ට ගමන් කිරීම සදහා අවශ්‍ය පොදු පහසුකම් සම්පාදනය කල යුතුය.

ඡායාරූප අංක 35 : **ගිරාගල සිට මිරිස්ස දක්වා වෙරළ තීරය පාරිසරික විනෝදාත්මක කොරිඩෝවක් ලෙස සංවර්ධනය කිරීම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

ගිරාගල සිට මිරිස්ස ප්‍රධාන මාර්ගය දෙපස භූ දර්ශනය කිරීම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

III. මිරිස්ස නගර මධ්‍යයේ වාණිජ වටිනාකමින් ඉහල වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් රූඩ් 02ක ප්‍රමාණයකින් යුත් භූමිය සංචාරක ආකර්ෂණය ඇති වන පරිදි දේශිය අත්කම් භාණ්ඩ නිෂ්පාදන අලෙවිසැලක් හා ප්‍රදේශයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් හට කාමර සහ අනෙකුත් පහසුකම් සැපයිමට හැකිවන පරිදි මහල් 05කින් යුත් පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමටද හඳුනාගෙන ඇත. මෙසේ සංචාරකයින්ට පහසුවෙන් දේශිය අත්කම් භාන්ඩ මිලදීගැනීමටත් තමන්ට කැමති රුචිකත්වයෙන් ප්‍රසිද්ධ සාප්පු සවාරියේ යෙදීමටත් මෙමගින් හැකියාව ලැබෙන අතර රාත්‍රි කාලයේ සංචාරකයින් හට නව අත්දැකිමක් එක් කරමින් දේශිය සංස්කෘතිකාංග නැරඹිය හැකි සංස්කෘතික රංගනශාලාවක් ඉදිකිරීමටද අපේක්ෂා කෙරේ. මේ තුලින් ප්‍රදේශයට ආවේනිකව පවතින බලි තොවිල්, ශාන්තිකර්ම වැනි එහි දුර්ලභ සංස්කෘතිකාංග විදේශිකයින්ට නැරඹිමට හැකියාව ලැබෙන අතර ඒ තුලින් අපේ පාරම්පරික නැටුම් කලාවේ යෙදී සිටින කලාකරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

IV. වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පිහිටි මිදිගම වෙරළ තීරයද සංචාරක ආකර්ශනය නොමදව දිනාගත් ස්ථානයක් ලෙස දැක්විය හැකිය. මෙම ප්‍රදේශය තුළ ශ්‍රී ලංකාවට ආවේනික ධීවර ක්‍රමයක් වන රිටිපන්න ධීවර ක්‍රමය පවතින අතර එය නැරඹීම සඳහා සංචාරකයින් වැඩි වශයෙන් මෙම ප්‍රදේශය වෙත පැමිණෙති. එසේම කැස්බෑවන් බිත්තර දැමීමද මෙම වෙරළ තීරය ආශ්‍රිතව සිදුවන බැවින් එම සතුන් නැරඹීමට සංචාරකයින් රුචිකත්වයක් දක්වයි. එබැවින් වෙරළ තීරයේ පවතින මෙම විභවතාවය සැලකිල්ලට ගෙන සංචාරක ආකර්ෂණය වැඩි දියුණු වන පරිදි මිදිගම වෙරළ තීරය වෙරළ උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගෙන ඇත. දැනට මෙම ඌන උපයෝගී තත්වයක පවතින අතර සංචාරක ආකර්ශනය දිනා ගත හැකි පරිදි භූදර්ශනය කර අලංකරණය කිරීමත්, ඇවිදිනමංතීරු, කුඩා ආහාරපාන සැල්, රථවාහන නැවතුම් ස්ථාන අපේක්ෂා

කරයි. තව ද රිටිපන්න ධීවර කර්මාන්තය විනෝදාස්වාද ක්‍රීඩාවක් ලෙස සංචාරකයින් අතර ප්‍රචලිත කිරීම තුළින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඡායාරූප අංක 36 **:යෝජිත මිදිගම වෙරළ උද්‍යානය**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

V. එසේම පොල්වතුමෝදර ගඟෙහි පැරණි පාලමද මේ වන විට කිසිදු කටයුත්තකට යොදා ගෙන නොමැති අතර එම පාලම නවීකරණය කර සංචාරකයින් සඳහා නැවුම් අත්දැකීමක් එක් කරමින් අවන්හලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

ඡායාරූප අංක 37 : පොල්වතුමෝදර පැරණි පාලම හා යෝජිත සංචාරක අවන්හල





මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය.

සංචාරක කර්මාන්තය සංවර්ධනය උදෙසා හඳුනාගෙන තිබෙන වෙරළ තීරය ප්‍රමුඛ සංචාරක කොරිඩෝවක් ලෙස නිර්මාණය කිරීම තුලින් දෙස් විදෙස් සංචාරකයින් දකුණු වෙරළ තීරයට ආකර්ශනය කරගෙන එමගින් ආර්ථික සංවර්ධනයක් ලඟා කර ගැනීම මෙම සැලසුම් තුලින් අපේක්ෂිත අරමුණුවේ.

## සංවර්ධන උපාය මාර්ග 02

***වැලිගම පවතින ස්වාභාවික පාරිසරික ස්ථාන සංචාරක කර්මාන්තය ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීම.***

ප්‍රදේශයේ අභ්‍යාන්තරයේ පවතින කලපු, වැව් හා ස්වාභාවික රක්ෂිත ප්‍රදේශ පාරිසරික සංචාරක කාර්මාන්තය සඳහා යොදා ගැනීම

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ජෛව විවිධත්වයකින් යුත් ස්වාභාව සෞන්දර්යයෙන් අනුන දර්ශනීය පොල්වත්ත ගඟ , ගරාඩුව කලපුව, බොරාල වැව , කුඩේගල රක්ෂිතයේද පිහිටා ඇත. එම විශේෂ පරිසර පද්ධතින් එහි පවතින විවිධත්වය එලෙසම ආරක්ෂා කරමින් සංවර්ධනය කිරීම මෙම සැලැස්ම තුලින් අපේක්ෂා කෙරේ.

ඒ අනුව ගරාඩුව කලපුව තුළ එහි කුරුල්ලන් නැරඹීමට අවස්ථාව සැලසීම, එහි පවතින ඇළ මාර්ග පද්ධතිය මනාව නඩත්තු කර එම ඇළ මාර්ගය හා කලපුව සම්බන්ධ කරමින් බෝට්ටු සේවාවක් ආරම්භ කිරීමත් එහි දෙපස පවතින කඩොලාන පරිසරය ආරක්ෂා කරමින් ස්වාභාවික මංතීරු නිරික්ෂණ කුටි ඉදි කිරීම, පාරිසර හිතකාමී භෝජන ශාලා හා සංචාරකයින්ට අවශ්‍ය අනෙකුත් අපරවයුහ පහසුකම් ඇති කිරීමටද මෙම සැලැස්ම තුලින් හඳුනා ගෙන ඇත. එමෙන්ම දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා නැවුම් අත්දැකීමක් ඇතිකිරීම සඳහා ප්‍රදේශයේ පවතින පොල්වත්ත ගඟෙහි ස්ථාන කිහිපයක් , බොරාල වැව පාදක කරගත් sea plane ගොඩබැස්සවීම සඳහා පහසුකම් සැපයීමට මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

ඡායාරූප අංක 38 **: ගරාඩුව කලපුව**






මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය.

ඡායාරූප අංක 39 **: සංචාරක නැරඹුම් ස්ථාන**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය - 2024.

බොරාල වැව හා කුඩේගල රක්ෂිතය ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරිමේදී යෝජනා කරනු ලබන්නේ ස්වභාවික සංචාරක කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම, කුරුල්ලන් නැරඹීම, කඳවුරු බැඳීම හා ඡායාරූප ගැනීම සඳහා අවස්ථාවක් සැලසීම යන අංශයන් අන්තර්ගත වන පරිදි එම කලාපයන් සංවර්ධනය කිරීමයි. මෙමගින් පාරිසරික, සංචාරක කර්මාන්තයට වැඩි කැමැත්තක් දක්වන සංචාරකයින් මෙම ප්‍රදේශය වෙත ආකර්ශනය කර ගැනීම මේ තුලින් අපේක්ෂිත අතර එමගින් සංචාරක කර්මාන්තය ඔස්සේ ලැබෙන ආදායම වර්ධනය කිරීමට සහ ප්‍රදේශවාසින්ට රැකියා අවස්ථා විවර වීමට ඉඩ ප්‍රස්ථාව ලැබේ.

ඡායාරූප අංක 40 : **කුරුල්ලන් නැරඹීමත් කඳවුරු බැඳීම හා ඡායාරූප ගැනීම සඳහා අවස්ථාවක් සැලසීම.**



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය.

### 6.4.2. වාණිජ හා සේවා සංවර්ධන සැලැස්ම

**සංවර්ධන උපාය මාර්ග 01**

***වාණිජ පහසුකම් සංවර්ධනය සඳහා වාණිජ හා මිශ්‍ර සංවර්ධන කලාප ස්ථාපනය කිරීම.***

**සංවර්ධන උපාය මාර්ග 02**

***උප මංසන්ධි ආශ්‍රිතව වාණිජ පහසුකම් සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම***

**සංවර්ධන උපාය මාර්ග 01**

***වාණිජ පහසුකම් සංවර්ධනය සඳහා වාණිජ හා මිශ්‍ර සංවර්ධන කලාප ස්ථාපනය කිරීම සේවා සැලැස්ම***

මාතර නගරය දකුණු කලාපයේ ප්‍රධාන වානිජ හා සේවා මධ්‍යස්ථානයක් වශයෙන් තවදුරටත් ව්‍යාප්ත කරලීමේ අරමුණින්ද, සුනාමි ව්‍යසනයෙන් පසු නගරය පුරා විහිදි ඇති රජයේ ගොඩනැගලි ස්වාභාවික අපදා අවම ආරක්ෂිත එක් ස්ථානයක් කර ඒකරාශී කිරිමේ අරමුණින් මාතර නගරයේ සිට කි.මී. 10ක් පමණ දුරින් වැලිගම ප්‍රාදේශිය සභාවට අයත් කොටවිල ප්‍රදේශය තෝරාගෙන ඇත. කොටවිල ප්‍රදේශය මාතර මහ නගර සභා බල ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටීම ද සංවර්ධනයට යොදාගත හැකි වඩාත් සුදුසු භූමි ප්‍රදේශයන් පැවතිම ද මනාව විහිදුනු අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග හා දක්ෂිණ අධිවේගී මාර්ගයට ආසන්නව පිහිටීමද නව නාගරික ප්‍රදේශ සැලසුම් කිරීමේදී අවධානය යොමු කරන ලද සාධක වේ. මේ සඳහා කොටවිල උතුර, කඹුරුගමුව උතුර හා කඹුරුගමුව දකුණ යන ග්‍රාම නිලධාරි වසම් වලට අයත්

අක්කර 142ක බිම් ප්‍රමාණයක් රජයට අත්පත් කරගෙන නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කරන ලද සැලැස්මට අනුව නව නාගරික ප්‍රදේශයක් ඇති කිරීමට සැලසුම් කර ඇත.

මෙය යටතේ මාතර මහරෝහලේ කොටසක්, මාතර අධිකරණ සංකීර්ණය, කොටවිල පොලීසිය, සුරාබදු කාර්යාලය, ක්‍රීඩා සංකීර්ණය, හෙද විදුහල, නීතිඥ කාර්යාල සංකිර්ණය දැනට ඉදිකර ඇති අතර ඉදිරි කාලය තුළදී කොටවිල නව බස් නැවතුම්පොළ ,වානිජ සංකිර්ණය, රජයේ නිල නිවාස, හරිත පරිපාලන ඒකකය, බන්ධනාගාරය හා වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීමට යෝජිතව ඇත. මේ තුලින් ජනතාව කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් ලබාදිමට අපේක්ෂිතය.

ඡායාරූප අංක 41 : **කොටවිල නව නගර වින්‍යාස සැලැස්ම**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

ඡායාරූප අංක 42 : **යෝජිත පරිපාලන සංකීර්ණය**



ඡායාරූප අංක 43 : **කොටවිල මහා රෝහල**



ඡායාරූප අංක 44 : අධිකරණ සංකීර්ණය



ඡායාරූප අංක 45 : ක්‍රීඩා සංකීර්ණය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

## සංවර්ධන උපාය මාර්ග 02

***උප මංසන්ධි ආශ්‍රිතව වාණිජ පහසුකම් සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.***

මීට අමතරව වාණිජ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දැනට වර්ධනය වෙමින් පවතින උපමංසන්ධි දෙකක්වන දෙනිපිටිය මංසද්ධිය හා වැලිපිටිය මංසන්ධිය හඳුනාගෙන ඇත.දෙනිපිටිය මංසන්දිය අකුරැස්ස වැලිගම මාර්ගයත්, අකුරැස්ස පොල්වතුමෝදර මාර්ගය හා කපුවත්ත මාර්ගය අතර පොල්වතුමෝදර ගඟට මායිමව පිහිටා ඇත. දෙනිපිටිය මංසන්ධිය ආශ්‍රිතව දැනට ප්‍රාදේශිය සභාව සතුව පවතින පොල භූමිය ඉතා අවධිමත් ආකාරයෙන් පවත්වාගෙන යන අතර මංසන්ධිය පටු වී වාහන තදබදයකින්ද යුක්ත වේ. ඒ අනුව මංසන්ධියේ මාර්ග පුළුල් කර අවට භූ දර්ශනය කිරීමත් ප්‍රාදේශිය සභාව සතු පොල භූමිය තුළ සතිපොල ප්‍රතිසංවර්ධනය කිරීමත් වානිජ ගොඩනැගිල්ල ඉදිකිරීම රථවාහන පහසුකම් සැපයිමටත් අපේක්ෂා කරයි.

වැලිපිටිය මංසන්ධියේ ඉහල වානිජ වටිනාකමක් සහිත ප්‍රාදේශිය සභාව සතු පොළ භූමිය දැනට ඌණ භාවිතයේ පවතින අතර, එහි පවතින පැරණි පොළ ප්‍රතිසංවර්ධනය කිරීම, රථවාහන නැවතුම් ඉඩකඩ ලබාදීම සහ සේවා පියසක් හා ප්‍රජා ශාලාවක් ඉදිකිරීමට අපේක්ෂිතය.

ඡායාරූප අංක 46 : වැලිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය



ඡායාරූප අංක 47 : දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

මීට අමතරව කලාපීකරණ සැලැස්ම මගින් මිශ්‍ර සංවර්ධන කලාප හා මධ්‍ය ඝණත්ව වාණිජ කලාප ඇති කිරීම තුලින් වාණිජ සංවර්ධන සඳහා ඉඩ ප්‍රස්ථා ඇති කර ඇත.

### 6.4.3 කර්මාන්ත සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

**සංවර්ධන උපාය මාර්ග 01**

***දෙස් විදෙස් අයෝජන අවස්ථා පුළුල් කර දේශිය ආර්ථිකය ශක්තිමත් කිරීමට කර්මාන්ත කලාප සංවර්ධනය කිරීම.***

**සංවර්ධන උපාය මාර්ග 02**

***දේශීය සම්ප්‍රදායික කර්මාන්ත සංචාරක කර්මාන්ත සමඟ බද්ධ කර සංවර්ධනය කිරීම තුළින් දේශිය ආර්ථිකය සවිමත් කිරීම***

## සංවර්ධන උපාය මාර්ග 01

***දෙස් විදෙස් අයෝජන අවස්ථා පුළුල් කර දේශිය ආර්ථිකය ශක්තිමත් කිරීමට කර්මාන්ත කලාප සංවර්ධනය කිරීම***

වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ සහ මාතර දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ප්‍රදේශ වල කර්මාන්තකරුවන් තම කර්මාන්ත පුළුල් කිරීම සඳහා යටිතල පහසුකම් සහිත සමාජ හා පාරිසරික ගැටළු අවම සුදුසු ඉඩම් ලබා ගැනීමට නොහැකි විම හේතුවෙන් දුෂ්කරතාවයට මුහුණපා ඇත. ඒ අනුව දිස්ත්‍රික්කයේ කර්මාන්ත කරුවන් විසින් කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සහිතව ඉඩම් ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

මීට විකල්පයක් ලෙස විසල් මාතර සංවර්ධන සැලැස්ම තුලින් කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානයේ සිට කි.මි.4.1 දුරින්ද ගොඩගම හුවමාරු මධ්‍යස්ථානයේ සිට කි.මී. 6.0ක දුරින් වැලිගම අකුරැස්ස ප්‍රධාන මාර්ගයෙන් ප්‍රවේශය ලබා ගැනීමට හැකි වන පරිදි පිහිටා ඇති වැලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාෂයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වාලීමවුන්ට් වත්ත ඉඩමෙන් අක්කර 350ක ඉඩම ප්‍රමාණයක් සියළු පහසුකම් සහිත කර්මාන්ත කලාපයක් පිහිටුවීම සඳහා හදුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය අක්කර 200ක භූමි ප්‍රමාණයක ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020 වසර තුළ ලැබී ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය හමුවේ අපනයන නිෂ්පාදන අඩුවීම හේතුවෙන් රටේ ජාතික ආදායම අඩු මට්ටමකට වැටී ඇති අතර එය නැවතත් පන ගැන්වීම සඳහා මෙවැනි කර්මාන්ත කලාප පිහිටුවීම තුලින් දේශිය නිෂ්පාදන වැඩි කිරීම රටේ අපනයන ආදායම වැඩි කිරීමට හැකියාව

ලැබේ. තවද සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 20,000ක් පමණ යෝජිත කර්මාන්ත කලාපය තුලින් බිහි කිරීම අපේක්ෂිතය.

මෙ සඳහා අවශ්‍යවන යටිතල පහසුකම් වන ජල පහසුකම් ජල සම්පාදන මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන අදියර IV ජල ව්‍යාප්තිය යටතේ සැපයෙන අතර විදුලිය සැපයිම විදුලි බල මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එසේම කර්මාන්තපුරය සඳහා පහසුවෙන් ලගාවීමට හැකිවීමට වැලිගම තෙලිජ්ජවිල මාර්ගය හා ඉමදුව මාර්ගය අඩි 66ක් ලෙස පුලුල් කර සංවර්ධනය කිරීමට යෝජිත අතර ඊට අමතරව මුණමල්පේ මාර්ගය අඩි 50ක් ලෙසද වැලිවත්ත කම්මල්ගොඩ මාර්ගය අඩි 30ක් ලෙස පුලුල් කිරීමට හදුනාගෙන ඇති අතර එම මාර්ග දෙකම කොක්මාදුව අධිවේගී පිවිසුමට පහසු ප්‍රවේශකත්වය ලබා දේ. මේ තුලින් කර්මාන්ත පුරවරයේ සේවකයන්ගේ ගමනාගමන කටයුතු සඳහා හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහාද පහසු ප්‍රවේෂකත්වයක් ලබා දේ.

මීට අමතරව වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මහා පරිමාණ කර්මාන්තශාලා 2ක් වන ලොඩ්ස්ටාර් කර්මාන්ත ශාලාව සහ නිපොන් පේන්ට් ආයතනය වැනි කර්මාන්තශාලා පිහිටා ඇති අතර ඒ තුලින් දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථා වර්ධනය කිරීමටද ප්‍රදේශයේ ආර්ථික වර්ධනයටද ඉවහල් වී ඇත.

ඡායාරූප අංක 48 : **යෝජිත වාර්ලි මවුන්ට් කර්මාන්තපුරය**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

## සංවර්ධන උපාය මාර්ග 02

***දේශීය සම්ප්‍රදායික කර්මාන්ත සංචාරක කර්මාන්ත සමඟ බද්ධ කර සංවර්ධනය කිරීම තුළින් දේශීය ආර්ථිකය සවිමත් කිරීම***

මීට අමතරව සාම්ප්‍රධායික කර්මාන්ත වන බීරළු හා බතික් කර්මාන්තය නගා සිටුවීම සඳහා වැලිපිටිය හා දෙනිපිටිය මංසන්දි ආශ්‍රිතව අලෙවි මධ්‍යස්ථානය පිහිටුවීම හඳුනාගෙන ඇති අතර මෙම කර්මාන්ත සංචාරක කර්මාන්තය සමග සම්බන්ධකර සංවර්ධනය කිරීම තුළින් ප්‍රදේශයේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ඉවහල් කරගත හැකිය.

ඡායාරූප අංක 49 : **බීරළු හා බතික් කර්මාන්තය නගා සිටුවීම සඳහා වැලිපිටිය හා දෙනිපිටිය මංසන්දි ආශ්‍රිතව අලෙවි මධ්‍යස්ථානය පිහිටුවීම**






*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මාතර*

## 6.5 තිරසර පාරිසරික ක්‍රමෝපායන්

### 6.5.1 සංරක්ෂිත ප්‍රදේශ

### 6.5.2 අරමුණු සහ ඉලක්කය

**(අ) ඉලක්කය :-**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ කලාපීකරණ ඉලක්කය වනුයේ

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා තෙත්බිම් සහ අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකීමට ගැනීමත් එමඟින් අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීමත් ය.

**(ආ) අරමුණු**

i. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ තුළ ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ගං වතුර බලපෑම් අවම කිරීම සහ පරිසර සංවේදී ප්‍රදේශ විධිමත් සැලසුම් මගින් කළමනාකරණය කර පරිසර හිතකාමී නගර ඇති කිරීම.

ii. විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපනික දැනුවත් කිරීම සඳහා තෙත්බිම්, වන රක්ෂිත, වෙරළ ආශ්‍රිත ප්‍රදේශ සහ ජල මූලාශ්‍ර යොදා ගැනීම.

iii. ජෛව විවිධත්වය ඉහල නංවමින් පාරිසරික, සංචාරක හා විනෝදාත්මක අවස්ථා වැඩි කිරීම සඳහා තෙත්බිම්, වන රක්ෂිත, කලපුව, වෙරළ ආශ්‍රිත ප්‍රදේශ සහ ජල මූලාශ්‍ර යොදා ගැනීම.

**වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ කලාපීකරණය**

i. අධි සංවේදී සංරක්ෂණ කලාපය
ii. මධ්‍ය සංවේදී සංරක්ෂණ කලාපය
iii. අඩු සංවේදී සංරක්ෂණ කලාපය

සිතියම් අංක 14 : **වැලිගම ප්‍රා. ස. බල ප්‍රදේශයේ පරිසර සංවේදී ප්‍රදේශ කලාපීකරණය**




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මාතර*

**අධි සංවේදී සංරක්ෂණ කලාපය - සංරක්‍ෂණ තෙත්බිම් සහ වන රක්ෂිත**

ගැසට් පත්‍රයක් මගින් ආරක්‍ෂක හෝ පරිසර සංවේදී විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති වන රක්ෂිත මෙම කලාපයට අයත් වේ.

**මධ්‍ය සංවේදී සංරක්ෂණ කලාපය - වගුරු බිම්,කලපු, වෙරළ තීරය සහ ජල ගැලීම් සිදුවන ප්‍රදේශ**

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ (වගුරු බිම්,කලපු, වෙරළ තීරය) සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

**අඩු සංවේදී සංරක්ෂණ කලාපය**

පවතින වගා කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය,ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෙත්බිම් ආශ්‍රිත කෘෂි කර්මාන්තය සිදු කෙරෙන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

### 6.5.3.1 කලාප සඳහා වූ මාර්ගෝපදේශ (තෙත්බිම් ආශ්‍රිත ප්‍රදේශ සඳහා)

අ. මෙම මාර්ගෝපදේශ වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සියළු තෙත් බිම් සඳහා පමණක් වලංගු වේ.

ආ. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත්බිම් වල සිදු කර ඇති ගොඩකිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු උපලේඛනයේ සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.

ඇ. පහත් බිමක්/පුරන්වූ කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සහ ඇමුණුම් අංක 08 හි සඳහන් අංක. 01, 03, 04 හා 10 දරණ ආයතන වලින් අනුමැතිය ලබා ගත යුතුයි. එසේම විවිධ පනත් මගින් තෙත්බිම් වල අයිතිය අදාළ ආයතන වල විෂය පථයට අයත් වන අවස්ථා වලදී උපලේඛනයේ සඳහන් ආයතන වලින් සහ අනෙකුත් අදාළ ආයතන වලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය.

ඇ. තෙත්බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා පහත උපලේඛනයේ සඳහන් අංක. 03 හා 05 දරණ ආයතන වලින් පරිසර නිරවුල් කිරීමේ සහතිකය හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු අතර නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

ඉ. ඇමුණුම් අංක 08 හි සඳහන් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් තෙත්බිමක් සංවර්ධන කාර්යයක් සඳහා ලබා දෙන නිර්දේශ/අනුමැතිය (අවසන් නිරවුල් සහතිකය) එම සැලසුම් කමිටු තීරණය පරිදි වාර්ෂිකව අළුත් කළ යුතුය.

ඊ. තෙත්බිම්වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් ශාක හා සතුන් ඉවත් නොකළ යුතුය.

උ. ජල රඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත්බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රඳවුම් ධාරිතාව අඩුවීම සහ පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා අදාළ ආයතනවල අනුමැතිය ලබාගත යුතුය.

ඌ. සාම්ප්‍රදායික ධීවර කටයුතු හැර මසුන් හෝ වෙනත් ජලජ ජීවීන් ඇල්ලීමේ ක්‍රියාවලියේදී යාන්ත්‍රික බෝට්ටු, ධීවර ආම්පන්න, ඉන්ධන හෝ වෙනත් යාත්‍රා භාවිතා නොකළ යුතුය.

එ. පැහැදිලිව හඳුනාගත හැකි ඉහල ජෛව විවිධත්වය ඇති තෙත්බිම් ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

ඒ. මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

ඔ. තෙත්බිම්වල කසළ බැහැර කිරීම සඳහා අවසර නොදිය යුතුය.(ගෘහස්ථ, ආයතනික, කාර්මික, වෙළඳ, විද්‍යුත්, සහ සායනික අපද්‍රව්‍ය)

**තෙත්බිම් කලාපයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් උපලේඛනයේ සඳහන් ආයතනයන් මගින් බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම මාර්ගෝපදේශයන් එම බලපත්‍රවල කොන්දේසි ලෙස ඇතුළත් කල යුතු අතර එකී කොන්දේසි කඩකිරීම එකී බලපත්‍රය අවලංගු කිරීමට හෝ දඩුවම් නියම කිරීමට හේතු වනු ඇත.**

**පරිසර සංරක්ෂණ කලාප සදහා අනුමත භාවිතයන්**

අධි සංවේදී සංරක්ෂණ කලාපය **- සංරක්‍ෂණ වන රක්ෂිත සහ කලපු ආශ්‍රිත ප්‍රදේශ (කුඩගල්කන්ද වන රක්ෂිත ප්‍රදේශය, ගරාඩුව කලපුව)**

- අ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයන්හි දැක්වෙන අනුමත භාවිතයන්
- ආ. වන වගා ව්‍යාපෘති (වාණිජ නොවන)
- ඇ. අධ්‍යයන හා පර්යේෂණ කටයුතු
- ඈ. ස්වභාවිකත්වය මත පදනම් වූ පරිසර සංචාරක කටයුතු
- ඉ. ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම (ඇකේසියා,වෙල් ආතා වැනි)
- ඊ. ජල රැදවුම් පොකුණු (ජල ගැලීම් පවතින ප්‍රදේශ සදහා)

**මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත.**

මධ්‍ය සංවේදී සංරක්ෂණ කලාපය **- වගුරු බිම්, වෙරළ තීරය සහ ජල ගැලීම් සිදුවන ප්‍රදේශ (වගුරු බිම්/ වෙරළ තීරය සහ ජල ගැලීම් සිදුවන ප්‍රදේශ)**

- අ. තෙත්බිම් ස්වභාවික උද්‍යාන
- ආ. පරිසර හිතකාමී අවන්හල්- වර්ග අඩි 1200 (කුළුණු මත ඉදිවූ)
- ඇ. කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන - (කුළුණු මත ඉදිවූ) වර්ග අඩි 1500 නොඉක්මවන,ආසන ධාරිතාවය - 75,වේදිකාව - 30’X 50’
- ඈ. එළිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන
- ඉ. තෙත්බිම් කෞතුකාගාර - වර්ග අඩි 1000 (කුළුණු මත ඉදිවූ)
- ඊ. කබානා (කුළුණු මත ඉදිවූ )
- උ. වියලි කාලගුණ තත්ත්වයේදී පමණක් ක්‍රීඩා කළ හැකි ස්ථාන (Dry weather Playgrounds)
- ඌ. සම්ප්‍රදායික ධීවර කර්මාන්තය
- ඉ. ජලාශ්‍රිත ගමනාගමනය
- ඊ. ජාතික වැදගත් කමක් සහිත රජයේ අනුමත පොදු අපරව්‍යුහ ව්‍යාපෘති
- එ. නව වාරිමාර්ග ඉදිකිරීම /ගංවතුර ආරක්‍ෂණ ඉදිකිරීම

**මෙම කලාපයේ වෙනත් කිසිදු භාවිතයක් සඳහා අවසර නොමැත. අඩු සංවේදී සංරක්ෂණ කලාපය**

අ. පවතින වගා කුඹුරු හා පුරන් කුඹුරු බිම් සහ තෙත්බිම් ආශ්‍රිතව සිදු කරන කෘෂිකර්මාන්තය

ආ. අපි ශාක වගාවන්

ඇ. අවිධිමත් භූමිය යථා තත්වයට පත් කිරීමේ කටයුතු වලට යටත්ව භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ කොන්දේසි වලට යටත්ව සිදුකරනු ලබන කැණීම් කටයුතු(මැටි වලවල් සහ පස් කැණීම්)

ඇ. පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු

**මෙම කලාපයේ කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර නොමැත.**

**ඉහත කලාපයන්හි අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි**

(අ). තෙත්බිම් කලාප ආශ්‍රිතව පවතින හෝ තෙත්බිම් තුළ පවතින උස්බිම් ප්‍රදේශ (Highland areas) පිහිටි අවස්ථාවේදී යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට පෙර සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා මිනුම්දෝරු සැලැස්ම (Survey Plan) සහ සංවර්ධනයට අදාළ යෝජිත භූමියේ වත්මන් භාවිතය/පවතින තත්වය සලකා බැලිය යුතුය.

(ආ). තෙත්බිම් කලාපීකරණයට අනුව යම් තෙත්බිම් කලාපයක මායිම අපහැදිලි හෝ අවිනිශ්චිත අවස්ථාවලදී මායිමේ සිට පිටතට/ඇතුළතට මීටර් 20 ක දුර ප්‍රමාණයක පවතින තෙත්බිම්, ආසන්න තෙත්බිම් කලාපයට අයත් වන අතර එම කලාපයේ අදාළ නීති රෙගුලාසි සහ අනුමත භාවිතයන්ට යටත්ව ක්‍රියාකල යුතුය.

(භූගෝලීය පිහිටුම් පද්ධතියට - GPS අනුව ස්ථානීය පිහිටීම නිවැරදිව නිර්ණය කරගැනීමේදී පවතින දෝෂ සහගත තත්ත්වය මගහරවා ගැනීම සඳහා)

**සැ.යු.**

(අ). අවශ්‍ය අවස්ථාවන්හිදී පරිසර පනත යටතේ පවතින “ නියමිත ව්‍යාපෘති “ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතනයන්ගේ අතිරේක වැඩ බිම් විශේෂිත තත්වයන් ආරෝපනය කල හැක.

කිසියම් තෙත්බිමක් සංවර්ධනය වීමේදී ඉහත කොන්දේසින් උල්ලංඝනය වීමක් සිදු වුවහොත් මධ්‍යම පරිසර අධිකාරිය, ගොවිජනසේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, වෙරළ සංරක්‍ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව *සහ* නාගරික සංවර්ධන අධිකාරිය ආයතන සතු බලතල යටතේ නීතිමය පියවර ගනු ලැබේ.

**සිතියම් අංක 13 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ආපදා අවදානම අවම කිරීමේ සැලැස්ම 2023 – 2033**




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මාතර*

**පවතින ආපදා තත්ත්වය**

වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් 105 ක් වන වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හඳුනාගත හැකි ආපදා තත්ත්ව ලෙස

(අ). ජල ගැලීම්

(ආ). සුනාමි

(ඇ). නායයෑම් අවදානම් ප්‍රදේශ දැක්විය හැක.

වැලිගම ප්‍රා.ස. බල ප්‍රදේශයෙහි ආපදා පිහිටි ප්‍රදේශ සඳහා උපාය මාර්ග

**(අ). ජල ගැලීම්**

1. පහත්බිම් ප්‍රදේශ වල ඉදි කිරීම් කටයුතු දැනට පවතින ඉදිකිරීම් වලට පමණක් සීමා කිරීම.
2. අඩු ජන ඝනත්වය සහිත ජනාවාස ප්‍රදේශ පවත්වාගෙන යාම සිදුවන ප්‍රදේශ සහ ජල රැඳවීමට මෙන්ම බැසයාම් ප්‍රදේශ ලෙස නම් කරන ලද පරිසර සංවේදී කලාපයට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 90 ක් ඇත.
3. ගංවතුර බාධක බැම් ඉදිකිරීම.

   3.1 හඳුනාගත් ඇළ මාර්ගවල නව ජල ගේට්ටු ඉදිකර දෙපස සිටින ජනතාවට සහ දේපල වලට සිදුවන හානිය වලක්වා ගැනීම.

   1. ජලගැලීම් වලට ඔරොත්තු දෙන අනුමත භාවිතයන් සඳහා අවදානම් ප්‍රදේශ භාවිතා කිරීම.
   2. ජල පෝෂක ප්‍රදේශයන්හි වන වගා වැඩි කිරීම (වන ගහනය වැඩි කිරීම)
   3. ගංවතුර අවදානම අඩු කිරීම සඳහා, ජලය රඳවා ගැනීම සහ ජලය බැසයාම සඳහා තෙත්බිම් ආරක්ෂා කිරීම.
   4. හදිසි ජල ගැලීම් තත්වයකදී ඊට මුහුණදීම සඳහා ආරක්ෂිත ස්ථාන හඳුනාගෙන තිබීම

**(ආ). නායයෑම් අවදානම් ප්‍රදේශ**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් හඳුනාගෙන ඇති නායයෑම් අවධානම් ප්‍රදේශ වල ඉදිකිරීම් කටයුතු සිදුකරන්නේනම් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිරවුල් සහතික ලබාගත යුතුය. නායයෑම් වලක්වා ගැනීම සහ ආරක්ෂා වීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පහත පරිදි වේ. (මූලාශ්‍රය - සුරක්ෂිත නිවසක් ඉදිකිරීම සඳහා උපදෙස් - ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය)

1. ඉඩම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම වලක්වා ගැනීම
2. හෙල්මළු ක්‍රමයට බිම් සකස් කොට වගා කිරීම

3. කෘෂිකාර්මික ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදාගැනීම පාලනය කිරීම
4. ඉඩම් වල පාංශු ඛාදනයට ලක්වන නුසුදුසු භෝග ව්‍යාප්තිය පාලනය කිරීම
5. ගොඩනැගිලි සැලසුම් කිරීමේදී පස් කපා ඉවත් කිරීම වෙනුවට භූමියේ ස්වභාවයට අනුකූල වෙමින් හෙල්මළු ක්‍රමයට ගොඩනැගිල්ල ඉදිකිරීම
6. යටිතල පහසුකම් සැපයීමේදී නිසි තාක්ෂණික උපදෙස් පිළිපැදීම
7. බැවුම් සංරක්ෂණය සඳහා ගල්වැටි හා ශාක ආවරණය යොදාගැනීම
8. හදිසි නායයෑම් තත්වයකදී ඊට මුහුණදීම සඳහා ආරක්ෂිත ස්ථාන හදුනාගෙන තිබීම

**(ඈ). සුනාමි**

1) මීටර් 100 වෘක්ෂලතා තීරුවේ සිට ( Vegetation Line)ප්‍රදේශයක් වෙරළ තීරය සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස වෙන් කිරීම,
2) කඩොලාන වගා ව්‍යාප්ත කිරීම,
3) විනෝද විවේක පහසුකම් වෙරළ තීරයේ ස්ථානගත කිරීම
4) වෙරළ කලාපයේ මීටර් 100 තුළ ඉදිකරන ඕනෑම ස්ථිර ගොඩනැගිල්ලක් මුහුදු මට්ටමෙන් මීටර් 3ක වත් ඉහළින් ඉදිකළ යුතුය.
5) වෙරළ කලාපය තුළ සිදු කරන ඉදිකිරීම් සඳහා ඉංජිනේරු විකල්පයන් භාවිතා කිරීම,
6) වෙරළ ඛාදන ආරක්ෂකයන් (Groins) යෙදීම,
7) ආරුක්කු බැම්ම (Revetments) යෙදීම,
8) වෙරළ පෝෂණය කිරීම (Beach Nourishments)
9) වෙරළ ආරක්ෂක බාධක (Coastal Protection Barriers) යෙදීමද සිදුකල හැකිය.
10) සුනාමි ආපදා හදිසි අනතුරු ඇගවීමේ පද්ධතියක් ස්ථාපිත කර තිබීම.
11) හදිසි සුනාමි තත්වයකදී ඊට මුහුණදීම සඳහා ආරක්ෂිත ස්ථාන හදුනාගෙන තිබීම සහ එම ස්ථාන කරා ළගාවන කෙටිම මග පෙන්වා දී තිබීම.

### *6.5.3 වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම*

**සිතියම් අංක 14 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම - 2033**




*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මාතර*

**වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශිය සැලැස්ම - 2033**

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1.4 ක් අවම වශයෙන් පොදු එළිමහන් විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේදී වෙන් කල යුතුය. විසල් මාතර නාගරික බල ප්‍රදේශයේ 2021 වසරට ජනගහනය 106,920 ක් ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2033 වන විට ජනගහනය 113,113 බවට පුරෝකථනය කර ඇත. ඒ අනුව 2033 වන විට පොදු එළිමහන් විවෘත භූමි ලෙස ඉඩම් හෙක්ටයාර් 158 ක් පමණ අවම වශයෙන් වෙන් කල යුතුය.

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පවතින තෙත්බිම් රක්ෂිත, වනරක්ෂිත, වෙරළ තීරය, ගංගා සහ වැව් මෙන්ම බල ප්‍රදේශය තුළ පවතින සංවර්ධනය වූ සහ සංවර්ධනය වෙමින් පවතින අවකාශයන්ට අනුව යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම වගු අංක 12 ඇමුණුම 01 සහ සිතියම් අංක 16හි පරිදි වේ.

වගු අංක 12 : **වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය -** යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම

| **අනු අංකය** | **වර්ගය** | **ප්‍රමාණය (හෙක්ටයාර්)** |
|---|---|---|
| 01 | යෝජිත කුඩා උද්‍යාන (Proposed Mini Park) | 0.27 |
| 02 | යෝජිත රේඛිය උද්‍යාන (Proposed Linear Parks) | 3.50 |
| 03 | යෝජිත වෙරළ උද්‍යාන(Proposed Beach Parks) | 9.15 |
| | **මුළු එකතුව** | **12.92** |

*මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, මාතර*

### 6.5.4. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග

**1. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා පිටි ප්‍රතිසංවර්ධනය කිරීම.**

පවතින සියලුම ක්‍රීඩා පිටි සහ ළමා උද්‍යාන ප්‍රමිතීන්ට අනුව ප්‍රතිසංවිධානය කිරීම මෙම සැලැස්ම මගින් යෝජනා කරනු ලැබේ. එම ක්‍රීඩාංගන වල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඒවා නඩත්තු කිරීමේ ක්‍රියා පිළිවෙත් සැකසීම, නිවැරදි දිශානතියෙන් යුත් නව ක්‍රීඩාගාර,ගෘහස්ථ ක්‍රීඩාගාර සහ යටිතල පහසුකම් ගොඩනැංවීම වැඩි දුරටත් සඳහන් කල හැක.

සියලුම ගඟ රක්ෂිත,වැව් රක්ෂිත,කලපු රක්ෂිත සහ වෙරළ රක්ෂිත, රේඛීය උද්‍යාන /වෙරළ උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමටද යෝජනා කෙරේ. එම රක්ෂිත සීමාවන් රේඛීය උද්‍යාන/වෙරළ උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම මගින් අනවසර ඉදිකිරීම් /ගොඩකිරීම් සීමාවන අතර විනෝද විවේක පහසුකම් ලබාගත හැකි බව වැඩි දුරටත් සඳහන් කළ හැකිය.

**2. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පවතින වැව්,ඇළ මාර්ග සහ කලපු ආශ්‍රිත ප්‍රදේශ ප්‍රතිසංවර්ධනය කිරීම.**

වැව් ආශ්‍රිත ස්වභාවික පරිසරය සමඟ සමගාමීව සැලසුම් කරන ලද විනෝද ස්ථාන ඇති කිරීම. මෙහි විනෝද පහසුකම් සඳහා වෙන් වූ ස්ථාන හා කඳවුරු ගැසීම, (Camping) පහසුකම් ඇතුළු ව්‍යායාම භූමි, ව්‍යායාම මංතීරු,ජලාශ්‍රිත ක්‍රීඩා වැනි දේ අනුමත කල හැක. තවද නගරයේ අනෙකුත් යෝජිත රේඛීය උද්‍යාන සඳහා ඉඩකඩ ඇති භූමි භාග පොදු ජනතාවගේ විවේක පහසුකම් ලබා ගැනීම සඳහා පරිසර හිතකාමී තිරසාර භූ දර්ශන සංකල්පයන්ට අනුව සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කෙරේ.

**3. සමාජීය විනෝද කටයුතු පහසුකම් වැඩි දියුණු කිරීම.**

දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාරක අවශ්‍යතා වලට ගැලපෙන ප්‍රමිතියෙන් යුතු ක්‍රීඩා සමාජ, සංචාරක හොටල්, නිවාඩු නිකේතන සහ සංචාරක බංගලා ස්ථාපිත විය යුතු බවට මෙම සැලැස්ම මගින් යෝජනා කරනු ලැබේ.

4. සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම.

දේශීය සංචාරකයන්ට පහසු මිළට නවාතැන් පහසුකම් සපයන ස්ථාන ඇති කිරීම මෙන්ම දේශීය විදේශීය සංචාරකයන්ට සහ පාරිසරික අධ්‍යනයන් සඳහා පැමිණෙන පර්යේෂකයන්හට (කුඩේගල වන රක්ෂිත ආශ්‍රිතව) අවශ්‍ය සහ ප්‍රයෝජනවත් ආකර්ශණීය ස්ථාන පරිසර හිතකාමී සංවර්ධනය ඔවුන්ගේ දීර්ඝ කාලීන නැවතීම් වලට හේතු විය හැක. ඒවාට අදාල අනෙකුත් ඍජු හා වක්‍ර පහසුකම් විශේෂයෙන් සංචාරක බංගලා,හෝටල්, පොදු ප්‍රවාහන පහසුකම්, ප්‍රදේශයට අවේනික සංස්කෘතික සංදර්ශන කටයුතු වැනි දෑ හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම විශේෂයෙන්ම මාතර වෙරළ තීරය,වැව් ආශ්‍රිතව ප්‍රදේශ මෙන්ම කලපු ප්‍රදේශ අවශ්‍ය පහසුකම් පාලනයක් සහිතව සංරක්ෂණය හා බැදුණු වැඩි දියුණු කිරීමකට මෙයින් යෝජනා කෙරේ.

උසස් ප්‍රමිතියෙන් යුතු සංචාරක බංගලා,හෝටල්,පොදු ප්‍රවාහන පහසුකම්,සෞඛ්‍ය මධ්‍යස්ථාන, අයුර්වේද මධ්‍යස්ථාන පිහිනුම් තටාක සහිත නිවාඩු නිකේතන (Resort) විදේශිකයින් සඳහා ස්ථාපිත කර සංවර්ධනය කිරීම තුලින් සංචාරක කර්මාන්තය දියුණු කර ආර්ථිකයට ඍජු දායකත්වයක් ලබාදිය හැකියි.

**5. රුක් තීරු**

ප්‍රධාන මාර්ග දෙපස ඇති ඉඩ ප්‍රමාණයන්ට ගැලපෙන හා දේශගුණයට ගැලපෙන ආවේණික ශාක විශේෂ රුක් රෝපණයට හඳුනාගෙන මේ සඳහා යොදා ගත හැක. නගරය කලාප කර එක් එක් කලාපයට අනන්‍යතාවය ලැබෙන සේ විවිධ ශාක වර්ග තෝරා ජෛව විවිධත්වය වැඩි දියුණු වන පරිදි රුක් රෝපණය කිරීම නගර අලංකරණයට හේතු වේ. මෙම ප්‍රදේශයේ රුක් රෝපණය සඳහා සුදුසු ශාක වර්ග පහත පරිදි දැක්විය හැකිය. එසේම රුක් රෝපනය කල හැකි මාර්ගයන් පහත පරිදි වේ.

මාර්ග සංවර්ධන කටයුතුවලදී නගර සංවර්ධන සංකල්ප අනුව විධිමත් හූ දර්ශන සැලසුම් තෝරාගෙන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතුය.

**රුක් රෝපණය කල හැකි මාර්ගයන්**

1. වැලිගම - ඉමදූව මාර්ගය. (කි.මී.05)
2. වැලිගම - කනංකේ මාර්ගය. (කි.මී.06)
3. වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය. (කි.මී.09)
4. ගාල්ල - මාදම්ප මාර්ගය
5. කඹුරුගමුව - ලැබීම මාර්ගය
   (යෝජිත මාර්ගයන් දෙපසම රුක් රෝපණය කරනු ලබයි)

**රුක් රෝපණය සඳහා සුදුසු ශාක වර්ග ඇමුණුම 03 සඳහන් කර ඇත.**

**6.5.4.1.** ඉඩම් සහ අනු බෙදීම්වලදී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් ඍජු විනෝද පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.

#### 6.5.4.2. 2033 වන විට උෂ්ණත්වය අඩු කිරීමේ ක්‍රමවේදය.

1. සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නිල හරිත ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.
2. සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුළ ජල විහිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.
3. ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබඳව දැනුවත් කිරීම.
4. යෝජිත සියළුම වාහන නැවතුම්හලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල් හරිත නැවතුම්පලවල් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම.
5. බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොළවට උරාගන්නා ක්‍රමවේදයන්ට පමණක් සීමා කිරීම (interlocking) සහ ඒවා ද ලා වර්ණයන්ට පමණක් සීමාකිරීම.
6. පවතින ක්‍රීඩා භූමි, උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මූලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

## 6.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

### 6.6.1 හැඳින්වීම

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මෙහි අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හඳුනාගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සිතියම් අංක 15 මගින් දක්වා ඇත.

**සිතියම් අංක 15 : වැලිගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය - යෝජිත සංවර්ධන ව්‍යාපෘති සිතියම - 2033**
**යෝජිත සංවර්ධන ව්‍යාපෘති**




1. කොටවිල නගර සංවර්ධනය
2. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
3. උඩුකාව යෝජිත කර්මාන්තපුරය සංවර්ධනය
4. මිරිස්ස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
5. තල්මසුන් නැරඹීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
6. ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස භූ දර්ශනය කිරීමේ ව්‍යාපෘතිය
7. සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය - පොල්වතුමෝදර පැරණි පාලම
8. මිදිගම වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය
9. ගරාඩුව කලපුව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය
10. බොරාල වැව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය.
11. දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය
12. වැලිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය
13. භූ දර්ශන ව්‍යාපෘතිය ( මිරිස්ස සිව්මුණි සැය ඉදිරිපිට පවතින මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය)
14. පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (මිරිස්ස වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව පවතින භූමියේ කොටසක)

**වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය**
**යෝජිත සංවර්ධන ව්‍යාපෘති සැලැස්ම**

සැකසුම
මාතර දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

### 6.6.2 ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

**යෝජිත සංවර්ධන ව්‍යාපෘති**

1. කොටවිල නගර සංවර්ධනය
2. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
3. උඩුකාව යෝජිත කර්මාන්තපුරය සංවර්ධනය
4. මිරිස්ස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
5. තල්මසුන් නැරඹීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
6. ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස භූ දර්ශනය කිරීමේ ව්‍යාපෘතිය
7. සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය - පොල්වතුමෝදර පැරණි පාලම
8. මිදිගම වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය
9. ගරාඩුව කලපුව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය
10. බොරාල වැව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය.
11. දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය
12. වැලිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය
13. භූ දර්ශන ව්‍යාපෘතිය(මිරිස්ස සිවමුණි සෑය ඉදිරිපිට පවතින මාර්ග සංවර්ධන අධිකාරියට අයත් භූමිය)
14. පොදු පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (මිරිස්ස වෙරළාරක්ෂණ දෙපාර්තමේන්තුව පවතින භූමිය කොටසක)

### 6.6.3 ව්‍යාපෘති පිලිබඳ විස්තර

**1. කොටවිල ලැබීම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය**

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කොටවිල ලැබීම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | නව නගර සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | මාතර නගරයේ පවතින සංවර්ධන පීඩනය අවම කිරීම සඳහා කොටවිල නව නගරය ඇති කිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රාදේශීය සභාව** |
| **ප්‍රවේශය** | කඹුරුගමුව - ලැබීම ප්‍රධාන මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  යෝජිත ව්‍යාපෘතිය සඳහා කොටවිල උතුර, කඹුරුගමුව උතුර හා කඹුරුගමුව දකුණ යන ග්‍රාම නිලධාරී වසම් වල පිහිටි අක්කර 142ක බිම් ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇති අතර දැනට රෝහල , උසාවි සංකීර්ණය ඉදිකර ඇති අතර අවට නේවාසික සංවර්ධනයක් පවතී. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල | |
| | | | | | | ✓ | ✓ | |
| ව්‍යාපෘති අංශ | පරිසරය | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ | | |
| **ව්‍යාපෘතියේ අරමුණු** | රජයේ ගොඩනැගිලි එක් ස්ථානයකට ඒකරාශී කොට ජනතාවට වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් ලබාදීම. | | | | | | | |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | විසල් මාතර සංවර්ධන සැලැස්ම යටතේ මාතර නගරය වාණිජ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. එසේම 2005 වර්ෂයේ සුනාමි උවදුර ඇති වීමත් සමග නගරය රට අභ්‍යන්තරයට ප්‍රතිස්ථානගත කිරීමේ අවශ්‍යතාවය ද පන නැගී ඇත. ඒ අනුව වැලිගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයට අයත් කොටවිල ප්‍රදේශයේ පැවති යටිතල පහසුකම් සලකා බලා නව නගරයක් එම ප්‍රදේශය තුළ ස්ථානගත කිරීම සුදුසු බව හඳුනාගෙන ඇත. ඒ අනුව පළමුව මාතර මහා රෝහලෙහි කොටසක් මෙම ප්‍රදේශය වෙත ප්‍රතිස්ථානගත කරන ලද අතර මේ වන විට මහාධිකරණ සංකීර්ණයද කොටවිල ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. අනාගතයේදී මාතර නගරයේ තැනින් තැන විසිරී ඇති සියලු රජයේ ආයතන මෙම ප්‍රදේශය වෙත රැගෙන යාමට යෝජිතව ඇත. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | වැලිගම ප්‍රදේශය ලේකම් | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | | දිගු කාලීන (වසර 3) | ✓ | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | |
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාරය | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** |  | | | | | | | |
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | ජලය<br>ජාතික ජල සම්පාදන මණ්ඩලය | | | | විදුලිය<br>ජාතික විදුලිබල මණ්ඩලය | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | | නැත. | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | | |
| **කලාපය** | මිශ්‍ර සංවර්ධන | | කලාපීය අනුකූලතාව | | ඔව් | ✓ | නැත | |
| වර්තමාන තත්ත්වය | | | | | | | | |
| පවත්නා තත්ත්වය<br>  | | | | | | | | |

අනුමත කරන ආයතන

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
| --- | --- | --- |
| | • වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• වැලිගම ප්‍රාදේශීය සභාව<br>• මධ්‍යම පරිසර අධිකාරිය<br>• ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>• නාගරික සංවර්ධන අධිකාරිය<br>• දකුණු පළාත් සභාව | • වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ප්‍රාදේශීය සභාව<br>• දකුණු පළාත් සභාව<br>• මධ්‍යම පරිසර අධිකාරිය<br>• ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>• නාගරික සංවර්ධන අධිකාරිය |

| | නීති රීති | මාර්ගෝපදේශ |
| --- | --- | --- |
| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | 1. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br>2. මධ්‍යම පරිසර අධිකාරියේ නීති හා රෙගුලාසි | 1. සංවර්ධන සැලැස්මේ විශේෂ රෙගු |

## 2. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය හා මළාපවාහන හා අපජල පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය, මළාපවාහන හා අපජල පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | විසල් මාතර සංවර්ධන ප්‍රදේශයේ විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සැකසීම සහ ක්‍රමවත් මළාපවහන හා අප ජල පිරිපහදු පද්ධතියක් ඉදිකිරීම මගින් ජනතාවට සෞඛ්‍යාරක්ෂිත ජීවන තත්වයක් උදාකරදීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිපිටිය** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රාදේශීය සභාව** |
| **ප්‍රවේශය** | වැලිහිඳ අකුරුගොඩ මාර්ගය සහ අකුරැස්ස වැලිගම මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  යෝජිත ඉඩම වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති අතර, අවට කලාපය තුළ පොල් , රබර් , කටුපොල් වගාව සහිත ඉඩම් පවතී. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල |
| | | | | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | පරිසරය | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | 1. විසල් මාතර සංවර්ධන ප්‍රදේශයේ විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය<br>2. ක්‍රමවත් මළාපවහන හා අප ජල පිරිපහදු පද්ධතියක් ඉදිකිරීම මගින් සෞඛ්‍යාරක්ෂිත ජීවන තත්වයක් උදාකරදීම. |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | විසල් මාතර සංවර්ධන ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හයෙහිම පොදු ගැටළුවක් ලෙස ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය හඳුනාගත හැකිය. දෙවිනුවර සිට වැලිගම දක්වා වෙරළ කලාපය වේගයෙන් සංචාරක කර්මාන්තයට විවර වීමත් සමග එක් රැස් වන කැලි කසල පාරිසරික සංවේදී ප්‍රදේශවලට බැහැර කිරීමට අදාල පළාත් පාලන ආයතන කටයුතු කරමින් පවතී. කොටවිල යෝජිත පරිපාලන සංකීර්ණය හා ඒ ආශ්‍රිත ව්‍යාපෘති ඉදිවීමත් සමගම මෙම අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටළුව වඩාත් උග්‍රවනු ඇත. එයට හේතුව දැනට කොටවිල ප්‍රදේශයේ මාතර මහ නගර සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන කසල කළමනාකරණ ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමයි. ඒ අනුව, මෙම ගැටළුව කඩිනමින් විසඳා සංවර්ධන ප්‍රදේශයේ ජනතාවට සෞඛ්‍ය සම්පන්නව ජීවත් වීමට අවශ්‍ය පරිසරයක් සකසා දීම විකල්ප අවශ්‍යතාවයකි. ඒ අනුව මෙම ගැටළුව විසඳා ගැනීම සඳහා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජයවික්‍රමපුර ග්‍රාම නිලධාරී වසමට අයත් වාලිමවුන්ට් දකුණ නැමති ඉඩමේ අක්කර 50 ක් අත්පත් කිරීම සුදුසු වේ. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව / නමුණුකුල වතු සමාගම | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | | දිගු කාලීන (වසර 3) | ✓ | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | |
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාරය | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ විස්තරය | වාලිමවුන්ට් දකුණ නැමැති ඉඩමේ අක්කර 50 ක භූමියක් අත්පත් කර ගෙන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ හා මළාපවාහන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. මෙම ඉඩමේ පිහිටීම අනුව වැලිගම, අකුරුගොඩ, මාලිම්බඩ මාර්ගය ඔස්සේ විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයේ ඕනෑම පළාත් පාලන ආයතනයක් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකිය.   | | | | | | |
| යටිතල පහසුකම් ලබා ගැනීම | ජලය<br>ජාතික ජල සම්පාදන මණ්ඩලය | | | විදුලිය<br>ජාතික විදුලිබල මණ්ඩලය | | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | | නැත. | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| කලාපය | මිශ්‍ර සංවර්ධන | | | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත |
| වර්තමාන තත්ත්වය - ඉඩම පවරා ගැනීමේ අදියරෙහි පවතී | | | | | | | |
| පවත්නා තත්ත්වය   | | | | | | | |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| | • වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• වැලිගම ප්‍රාදේශීය සභාව<br>• මධ්‍යම පරිසර අධිකාරිය<br>• ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>• නාගරික සංවර්ධන අධිකාරිය<br>• දකුණු පළාත් සභාව | • වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• වැලිගම ප්‍රාදේශීය සභාව<br>• දකුණු පළාත් සභාව<br>• මධ්‍යම පරිසර අධිකාරිය<br>• ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | 1. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br>2. මධ්‍යම පරිසර අධිකාරියේ නීති හා රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ විශේෂ රෙගුලාසි |

### 3. යෝජිත වාලිමවුන්ට් කර්මාන්තපුරය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | යෝජිත වාලි මවුන්ට් කර්මාන්තපුරය |
| **ව්‍යාපෘතිය** | කර්මාන්තපුරය |
| **ව්‍යාපෘති යෝජනාව** | විසල් මාතර සංවර්ධන බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත සඳහා අවශ්‍ය ඉඩම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිපිටිය** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රා.ස.** |
| **ප්‍රවේශය** | වැලිගම- අකුරැස්ස ප්‍රධාන මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  | වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය හා අධිවේගී මාර්ගයට ආසන්නව පිහිටා ඇත. අවට කර්මාන්ත , නේවාසික සංවර්ධනයක් පවතී. | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | | ✓ | | | | | | ✓ |
| ව්‍යාපෘති අංශ | පාරිසරික | | ආර්ථික | ✓ | සමාජ | | | |
| ව්‍යාපෘතියේ අරමුණු | 1. ජාතික ආර්ථිකයට කර්මාන්ත අංශයේ දායකත්වය වැඩි කිරීම.<br>2. ප්‍රදේශයේ සේවා නියුක්තිය ඉහළ නැංවීම.<br>3. ආයෝජකයන්ට අවශ්‍ය ඉඩම් හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | විසල් මාතර නාගරික බල ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ හා කර්මාන්ත වලින් වැඩි ප්‍රමාණයක් මාතර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථානගත වී ඇති අතර එම බල ප්‍රදේශය තුළ ඒ සඳහා පවතින භූමිය උපරිම වශයෙන් භාවිතයට යොදා ගෙන ඇත. මාතර මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඉඩම් සීමිත වීම හේතුවෙන් සංවර්ධන බල ප්‍රදේශයට පැමිණෙන නව ආයෝජකයන්ට හා පවතින කර්මාන්තකරුවන්ට තම කර්මාන්ත පුළුල් කිරීමට හා ආයෝජනා අවස්ථා සිදු කිරීමට භූමිය සීමිත වී ඇත. මේ හේතුව මත විසල් මාතර සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණක් වූයේ පවතින කර්මාන්ත පුළුල් කිරීම සඳහාත් නව ආයෝජකයන්ට අවස්ථාව ලබාදීම සඳහාත් අවශ්‍ය ඉඩම් සපයාදීමයි.<br><br>මීට විකල්පයක් ලෙස විසල් මාතර සංවර්ධන සැලැස්ම තුලින් කොක්මාදුව හුවමාරු මධ්‍යස්ථානයේ සිට කි.මී.4.1 දුරින්ද ගොඩගම හුවමාරු මධ්‍යස්ථානයේ සිට කි.මී. 6.0ක දුරින් වැලිගම අකුරැස්ස ප්‍රධාන මාර්ගයෙන් ප්‍රවේශය ලබා ගැනීමට හැකි වන පරිදි පිහිටා ඇති වැලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාෂයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වාලීමවුන්ට් වත්ත ඉඩමෙන් අක්කර 350ක ප්‍රමාණයක් සියළු පහසුකම් සහිත කර්මාන්ත කලාපයක් පිහිටුවීම සඳහා ඉඩම් හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය අක්කර 200ක භූමි ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2020 වසර තුළ ලැබී ඇත. | | | | | | | |
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | | දිගු කාලීන (වසර 3) | ✓ | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මි. 1000.0 |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** |   | | | | | | |
| **යටිතල පහසුකම් ලබා ගැනීම.** | **ජලය**<br><br>ජල අවශ්‍යතාවය දැනට ක්‍රියාත්මක වන විසල් මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් සැපයීමට යෝජිතය. | | | | **විදුලිය**<br><br>විදුලි බල මණ්ඩලය | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | ✓ | නැත | | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න |
| **කලාපය** | කර්මාන්ත කලාපය | | | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත |
| **පවත්නා තත්ත්වය** | | | | | | | |





**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | **පුද්ගලික** | | **රජයේ** | ✓ | **වෙනත්** | | |
| **හිමිකම පිළිබඳ විස්තර** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව- | | | | | | |
| **මැනුම් සැලැස්මේ විස්තර** | **පිඹුරු අංකය** | **මිනින්දෝරුවරයාගේ නම** | **දිනය** | **ඉඩම් ප්‍රමාණය** | | | |
| | ප්‍රගමන අනුරේකන අංක MR/WLP/2013/433B | ජ්‍යේෂ්ඨ මිනින්දෝරු අධිකාරී | 2013.12.31 | අක්. 350 | රූඩ්. 00 | පර්. 00 | |

අනුමත කරන ආයතන

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| කර්මාන්ත සංවර්ධනය | • කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය<br>• ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>• කම්කරු දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය සභාව වැලිගම<br>• මධ්‍යම පරිසර අධිකාරිය<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැලිපිටිය<br>• විදුලි බල මණ්ඩලය<br>• ජාතික ජලාපවාහන මණ්ඩලය<br>• නාගරික සංවර්ධන අධිකාරිය<br>• මාර්ග සංවර්ධන අධිකාරිය | • කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය<br>• ය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයවැලිපිටි<br>• ප්‍රාදේශීය සභාව වැලිගම<br>• මධ්‍යම පරිසර අධිකාරිය |

අදාල රෙගුලාසි

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | • කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය<br>• මධ්‍යම පරිසර අධිකාරිය රෙගුලාසි<br>• නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br>• මාර්ග සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි.<br>• කම්කරු දෙපාර්තමේන්තුවේ නීති හා රෙගුලාසි | • සංවර්ධන සැලැස්ම - නාගරික සංවර්ධන අධිකාරිය |

## 4. මිරිස්ස සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | **මිරිස්ස සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය** |
| **ව්‍යාපෘතිය** | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය හා සංචාරක පහසුකම් සැපයීම |
| **ව්‍යාපෘති යෝජනාව** | සංචාරකයින්ට අවශ්‍ය පොදු පහසුකම් හා විවේක විනෝද පහසුකම් සැපයීම |

ව්‍යාපෘති ස්ථානය

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රාදේශීය සභාව** |
| **ප්‍රවේශය** | ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  | මිරිස්ස මංසන්ධිය, ගාල්ල මාතර ප්‍රධාන මාර්ගයට යාබදව ප්‍රාදේශීය සභාවට අයත් භූමියකි. | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල |
| | | ✓ | ✓ | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | පරිසරය | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | 1. සංචාරකයන්ට විවේක හා විනෝද කටයුතු පහසුකම් සැපයීම<br>2. ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම. |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | වැලිගම, මිරිස්ස නාගරික ප්‍රදේශය තුළ තරු පන්තියේ හෝටල්, ආගන්තුක නිවාස, ලැගුම්හල්, ආපනශාලා විශාල ප්‍රමාණයක් සර්ෆින් ක්‍රීඩාවටත්, තල් මසුන් නැරඹීමට සහ ආකර්ශනීය වෙරළ තීරය හේතුවෙන් පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් වෙනුවෙන් ඉදිවෙමින් පවතී.<br><br>ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන් හට විවේක හා විනෝද කටයුතු සඳහා අවශ්‍ය ස්ථාන නොමැතිකමත් ඔවුන්ගේ වාණිජ අවශ්‍යතාවයන් සැපයීමට ප්‍රමාණවත් පහසුකම් නොමැතිකමින් සංචාරකයන් මිරිස්ස ප්‍රදේශයේ රැඳෙන සංචාරක රාත්‍රීන් ගණන අඩුවීමක් දක්නට ඇත.<br><br>ඒ අනුව, මිරිස්ස නගර මධ්‍යයේ වාණිජ වටිනාකමින් ඉහල ප්‍රාදේශීය සභාවට අයත් රූඩ් 02ක ප්‍රමාණයකින් යුත් භූමිය සංචාරක ආකර්ෂණය ඇති කරවන පරිදි දේශීය අත්කම් භාණ්ඩ නිෂ්පාදන අලෙවිසැලක් හා ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන් හට අඩු වියදමක් යටතේ විවිධ පහසුකම් සහිත කාමර පහසුකම් සැපයිමට හැකිවන පරිදි මහල් 05කින් යුත් පහසුකම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමටද හඳුනාගෙන ඇත. මෙසේ සංචාරකයින්ට පහසුවෙන් දේශිය අත්කම් භාන්ඩ මිලදීගැනීමටත් තමන්ට කැමති රුචිකත්වයෙන් ප්‍රසිද්ධ සාප්පු සවාරියේ යෙදීමටත් මෙමගින් හැකියාව ලැබෙන අතර රාත්‍රි කාලයේ සංචාරකයින් හට නව අත්දැකීමක් එක් කරමින් දේශිය සංස්කෘතිකාංග නැරඹිය හැකි සංස්කෘතික රංගනශාලාවක් ඉදිකිරීමටද අපේක්ෂා කෙරේ. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | | දිගු කාලීන (වසර 3) | ✓ | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 1000 |

<table>
<tr><td>මූල්‍ය ක්‍රමය</td><td colspan="8">භාණ්ඩාගාර අරමුදල් සහ පෞද්ගලික ආයෝජන</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)</td><td colspan="8">මිරිස්ස නගර මධ්‍යයේ වාණිජ වටිනාකමින් ඉහල ප්‍රාදේශීය සභාවට අයත් රූඩ් 02ක ප්‍රමාණයකින් යුත් භූමිය සංචාරක ආකර්ෂණය ඇති කරවන පරිදි දේශීය අත්කම් භාණ්ඩ නිෂ්පාදන අලෙවිසැලක් හා ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන් හට අඩු වියදමක් යටතේ විවිධ පහසුකම් සහිත කාමර පහසුකම් සැපයිමට හැකිවන පරිදි මහල් 05කින් යුත් පහසුකම් මධ්‍යස්ථානයක් ඉදි කිරීමටද හදුනාගෙන ඇත.<br>

<br>



</td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම</td><td colspan="4">ජලය<br>✓</td><td colspan="4">විදුලිය<br>✓</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td>✓</td><td>නැත.</td><td></td><td colspan="2">සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td><td></td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">සංචාරක කලාපය</td><td>කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
</table>

**වර්තමාන තත්ත්වය**

දැනට මෙම භූමිය ඌන භාවිතයේ පවතින අතර ඉදිරිපස කොටසෙහි ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන පෙර පාසලක් පවතී .

වයාපෘති අයවැය

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| 1. මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 700 |
| 2. පවතින පොළ ප්‍රතිසංවර්ධනය / මහජන පුස්තකාලය | 65 |
| 3. මිරිස්ස මංසන්ධිය පුළුල් කිරීම හා මාර්ග පුළුල් කිරීම | 150 |
| 4. සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ඉදිකිරීම | 85 |

අනුමත කරන ආයතන

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| | වැලිගම ප්‍රාදේශීය සභාව | වැලිගම ප්‍රාදේශීය සභාව |
| | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |
| | ධීවර දෙපාර්තමේන්තුව | |
| | නාගරික සංවර්ධන අධිකාරිය | |
| | වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | 1. නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු රෙගුලාසි | 1. සංවර්ධන සැලැස්මේ සංචාරක කලාපයට අයත් රෙගුලාසි<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ<br>3. මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ<br>4. මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශ |

## 5. තල්මසුන් නැරඹීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | තල්මසුන් නැරඹීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | තල්මසුන් නැරඹීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | සංචාරකයින්ට අවශ්‍ය පොදු හා විවේක විනෝද පහසුකම් සැපයීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රාදේශීය සභාව** |
| **ප්‍රවේශය** | ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය - මිරිස්ස ධීවර වරාය ප්‍රවේශ මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |   | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |   | මිරිස්ස ධීවර වරාය සහ ඒ අවට මිශ්‍ර සංවර්ධනයක් පවතී | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිත ල |
| | | ✓ | | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති අංශ** | පරිසරය | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | 1. නිල් තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන දේශිය/ විදේශිය සංචාරකයන් සඳහා පොදු පහසුකම් සංවර්ධනය කිරීම.<br>2. ප්‍රදේශයේ ජනතාවගේ ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම.<br>3. ධීවර වරායෙහි අදායම් මාර්ග උත්පාදනය කිරීම |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාව ය** | මිරිස්ස මුහුදු තීරය ආශ්‍රිතව ගැවසෙන නිල් තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන දේශිය/ විදේශිය සංචාරකයන් සඳහා පොදු පහසුකම් නොමැති බැවින් එම පහසුකම් සංවර්ධනය කිරිමේ අරමුණින තල්මසුන් නැරඹීමට එන සංචාරකයින් සඳහා ආපනශාලා පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, රථවාහාන පහසුකම්, විවේකාගාර හා සෞඛ්‍ය පහසුකම් ඇතුළු සියළුම පහසුකම් ඇති කිරීම අපේක්ෂිතය .මේ සඳහා පවතින ප්‍රවේශමාර්ගය විධිමත් ලෙස සංවර්ධනය කිරීමත් සංචාරක ආකර්ෂණය වැඩි කිරීමටත් යෝජනා කෙරේ. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | | දිගු කාලීන (වසර 3) | ✓ | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 175 |
| **මූල්‍ය ක්‍රමය** | භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |

<table>
<tr><td>ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)</td><td colspan="6">මිරිස්ස මුහුදු තීරය ආශ්‍රිතව ගැවසෙන නිල් තල්මසුන් නැරඹීම සඳහා පැමිණෙන දේශීය/ විදේශීය සංචාරකයන් සඳහා පොදු පහසුකම් නොමැති බැවින් එම පහසුකම් සංවර්ධනය කිරිමේ අරමුණින තල්මසුන් නැරඹීමට එන සංචාරකයින් සඳහා ආපනශාලා පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, රථවාහාන පහසුකම්, විවේකාගාර හා සෞඛ්‍ය පහසුකම් ඇතුළු සියළුම පහසුකම් ඇති කිරීම අපේක්ෂිතය .මේ සඳහා පවතින ප්‍රවේශමාර්ගය විධිමත් ලෙස සංවර්ධනය කිරීමත් සංචාරක ආකර්ෂණය වැඩි කිරීමටත් යෝජනා කෙරේ.<br><br><br>තල්මසුන් නැරඹීමේ පහසුකම් මධ්‍යස්ථානය දළ සැලැස්ම<br><br></td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම</td><td colspan="3">ජලය<br>✓</td><td colspan="3">විදුලිය<br>✓</td></tr>
<tr><td>කලාපය</td><td>සංචාරක කලාපය</td><td>කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
</table>

**වර්තමාන තත්ත්වය**





**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| | මිරිස්ස ධීවර වරාය | මිරිස්ස ධීවර වරාය |
| | වනජීවී දෙපාර්තමේන්තුව | වනජීවී දෙපාර්තමේන්තුව |
| | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |
| | වැලිගම ප්‍රාදේශීය සභාව | |
| | නාගරික සංවර්ධන අධිකාරිය | |
| | වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | 1. මිරිස්ස ධීවර වරාය<br>2. වනජීවී දෙපාර්තමේන්තු පනත<br>3. නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br>4. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු රෙගුලාසි | 1. සංවර්ධන සැලැස්මේ සංචාරක කලාපයට අයත් රෙගුලාසි<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ<br>3. වනජීවී දෙපාර්තමේන්තු පනත |

## 6 . ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස භූ දර්ශනය කිරීමේ ව්‍යාපෘතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස භූ දර්ශනය කිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | භූ දර්ශනය කිරීමේ ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
|---|---|---|---|---|
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රාදේශීය සභාව** |
| **ප්‍රවේශය** | ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |  | ප්‍රධාන මාර්ගය අවට සංචාරක, වාණිජ හා | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල | |
| | | | ✓ | | | | ✓ | |
| ව්‍යාපෘති අංශ | පරිසරය | ✓ | ආර්ථික | | සමාජ | ✓ | | |
| **ව්‍යාපෘතියේ අරමුණු** | 1. දෙස් විදෙස් සංචාරකයන්ට පහසුවෙන් ප්‍රවේශවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | | | | | | | |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | ගිරාගල සිට මිරිස්ස දක්වා වෙරළ තීරය පාරිසරික විනෝදාත්මක කොරිඩෝවක් ලෙස (Sea Green Recreational Corridor) සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇති අතර විශේෂයෙන් වෙරළ තීරයේ පවතින සුන්දරත්වය ආරක්ෂා කර ගනිමින් රාත්‍රී කාලයේදි පවා සංචාරකයින් එහි සුන්දරත්වය විඳගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම මෙහිදී අපේක්ෂා කෙරේ. මෙසේ ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස ආලෝකකරණය කිරීමටත් බලාපොරොත්තු වේ. වර්තමානය වන විට මිරිස්ස වෙරළ තීරය ආශ්‍රිතව සංචාරකයන් බහුතරයක් ගැවසෙන බැවින් රාත්‍රියේදී ආරක්ෂිතව ඔවුන්ගේ ගමන් කිරීම සඳහා මෙවැනි පොදු පහසුකම් සැපයිය යුතුය . | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | ✓ | රජයේ | ✓ | වෙනත් | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 100 |
| **මූල්‍ය ක්‍රමය** | භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** | ගිරාගල සිට මිරිස්ස දක්වා වෙරළ තීරය පාරිසරික විනෝදාත්මක කොරිඩෝවක් ලෙස (Sea Green Recreational Corridor) සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇති අතර විශේෂයෙන් වෙරළ තීරයේ පවතින සුන්දරත්වය ආරක්ෂා කර ගනිමින් රාත්‍රී කාලයේදි පවා සංචාරකයින් එහි සුන්දරත්වය විඳගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම මෙහිදී අපේක්ෂා කෙරේ. මෙසේ ගිරාගල සිට මිරිස්ස දක්වා ප්‍රධාන මාර්ගය දෙපස ආලෝකකරණය කිරීමටත් බලාපොරොත්තු වේ. වර්තමානය වන විට මිරිස්ස වෙරළතීර ආශ්‍රිතව සංචාරකයන් බහුතරයක් ගැවසෙන බැවින් රාත්‍රියේදී ආරක්ෂිතව ඔවුන්ගේ ගමන් කිරීම සඳහා මෙවැනි පොදු පහසුකම් සැපයිය යුතුය . | | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| |   | | | | | |
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | ජලය ✓ | | විදුලිය ✓ | | | |
| **කලාපය** | සංචාරක කලාපය | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත | |

වර්තමාන තත්ත්වය







**අනුමත කරන ආයතන**

| **ක්‍රියාකාරිත්වය** | **අදාල වන ආයතන** | **වගකිව යුතු ආයතන** |
|---|---|---|
| | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| | නාගරික සංවර්ධන අධිකාරිය | ප්‍රාදේශීය සභාව වැලිගම |
| | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |
| | ප්‍රාදේශීය සභාව වැලිගම | |
| | ලංකා විදුලි බල මණ්ඩලය | |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැලිගම | |

**7. සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය - පොල්වතුමෝදර පැරණි පාලම**

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | පොල්වතුමෝදර පැරණි පාලම නවීකරණය කිරීම. |
| ව්‍යාපෘතිය | සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| ව්‍යාපෘති යෝජනාව | පාලම නවීකරණය කර සංචාරකයින් සඳහා නැවුම් අත්දැකීමක් එක් කරමින් අවන්හලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. |

ව්‍යාපෘති ස්ථානය

<table>
<tr><td rowspan="2">ස්ථානය</td><td>පළාත</td><td>දකුණු පළාත</td><td>දිස්ත්‍රික්කය</td><td>මාතර</td></tr>
<tr><td>ප්‍රා.ලේ. කොට්ඨාශය</td><td>වැලිගම</td><td>පළාත් පාලන ආයතනය</td><td>වැලිගම ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">ගාල්ල මාතර ප්‍රධාන මාර්ගය</td></tr>
<tr><td>පිහිටීම සිතියම</td><td colspan="4"></td></tr>
<tr><td>යාබද ඉඩම් පරිහරණ</td><td colspan="4"><br>ප්‍රධාන මාර්ගය , පොල්අතුමෝදර ගඟ, දුම්රිය මාර්ගය පිහිටා ඇති අතර අවට නේවාසික හා වාණිජ සංවර්ධනයක් පිහිටා ඇත.</td></tr>
</table>

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල |
| | | ✓ | ✓ | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති අංශ** | පරිසරය | ✓ | ආර්ථික | | සමාජ | ✓ |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | පාලම නවීකරණය කර සංචාරකයින් සදහා නැවුම් අත්දැකීමක් එක් කරමින් අවන්හලක් ලෙස සංවර්ධනය කිරීම |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | සංචාරක කර්මාන්තය සංවර්ධනය උදෙසා පොල් අතුමෝදර ගහ පාදක කරගෙන විවෘත සංචාරක අවන්හලක් සහ අවට ප්‍රදේශය භූ දර්ශනය කිරීම තුලින් දෙස් විදෙස් සංචාරකයින් දකුණු වෙරළ තීරයට ආකර්ශනය කරගෙන එමගින් ආර්ථික සංවර්ධනයක් ලබා කර ගැනීම |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 50 |
| **මූල්‍ය ක්‍රමය** | භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** | පාලම නවීකරණය කර සංචාරකයින් සදහා නැවුම් අත්දැකීමක් එක් කරමින් අවන්හලක් ලෙස සංවර්ධනය කිරීම.    |

| | | |
|---|---|---|
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | ජලය ✓ | විදුලිය ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කලාපය** | සංචාරක කලාපය | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත | |

**වර්තමාන තත්ත්වය**




**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| | නාගරික සංවර්ධන අධිකාරිය | වැලිගම ප්‍රාදේශීය සභාව |
| | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |
| | ප්‍රාදේශීය සභාව වැලිගම | |
| | දෙපාර්තුමේන්තුව වාරිමාර්ග | |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැලිගම | |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | 1.මාර්ග සංවර්ධන අධිකාරිය රෙගුලාසි<br>2. නාගරික සංවර්ධන අධිකාරිය රෙගුලාසි<br>3. වාරිමාර්ග දෙපාර්තුමේන්තුව රෙගුලාසි | 1. මාර්ග සංවර්ධන අධිකාරිය රෙගුලාසි<br>2. වාරිමාර්ග දෙපාර්තුමේන්තුව රෙගුලාසි<br>3. නාගරික සංවර්ධන අධිකාරිය රෙගුලාසි<br>4. ප්‍රාදේශීය සභාව වැලිගම |

## 8. මිදිගම වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | මිදිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය |
| ව්‍යාපෘතිය | සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| ව්‍යාපෘති යෝජනාව | මිදිගම දක්වා වෙරළ තීරය සංවර්ධනය කිරීම. |

**ව්‍යාපෘති ස්ථානය**

| ස්ථානය | පළාත | දකුණු පළාත | දිස්ත්‍රික්කය | මාතර |
|---|---|---|---|---|
| | ප්‍රා.ලේ. කොට්ඨාශය | වැලිගම | පළාත් පාලන ආයතනය | වැලිගම ප්‍රා.ස. |
| | | | | |
| ප්‍රවේශය | ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගය | | | |
| පිහිටීම සිතියම |  | | | |
| යාබද ඉඩම් පරිහරණ |  යෝජිත ව්‍යාපෘති භූමිය ගාල්ල මාතර නව මාර්ගයට සහ වෙරළ තීරයට මැදිව පිහිටා ඇත. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | ✓ | | ✓ | | | | ✓ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | |
|---|---|
| ව්‍යාපෘතියේ අරමුණු | ආකර්ශනීය වෙරළ තීරයක් ඇති කිරීම, විවේක හා විනෝද කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම. රල මත ලිස්සායාමේ ක්‍රීඩාව වැඩි දියුණු කිරීම, ආපනශාලා පහසුකම් සැපයීම, දෙස් විදෙස් සංචාරකයින්ගේ ජීවිත ආරක්ෂාව තහවුරු කිරීම. කැස්බෑවුන්ගේ බෝවීම සුරක්ෂිත කිරීම. |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | මිදිගම වෙරළ උද්‍යානය ඉදිකිරීමට යෝජිත ප්‍රදේශය මාතර දිස්ත්‍රික්කයේ මායිම් ස්ථානයයි. ස්වභාවික පුළුල් වැලි තීරය මෙන්ම නොගැඹුරු මද රළ සහිත මුහුදු ප්‍රදේශය වර්තමානය වන විට ධීවර හා සංචාරක කර්මාන්තයට බහුල වශයෙන් යොදා ගනු ලබයි. විශේෂයෙන්ම මෙරටට ආවේනික ධීවර ක්‍රමයක් වන රිටි පන්න ධීවර ක්‍රමය මෙම ප්‍රදේශය ආශ්‍රිතව සිදු වන අතර එය නැරඹීම සඳහා සංචාරකයන් විශාල වශයෙන් ආකර්ෂණය වේ. දැනට මෙම වෙරළ තීරය ඉතා අවිධිමත් මට්ටමකින් පවතින අතර මෙම අවිධිමත් සංවර්ධන කටයුතු වෙරළ තීරය අපවිත්‍රවීමට ප්‍රබල සාධකයක් වී ඇති බැවින් ධීවර හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ කලාපය මනා සංවර්ධනයක් වෙත යොමු කල යුතුව ඇත. විශේෂයෙන්ම මෙම වෙරළ තීරය ගැහැණු කැස්බෑවුන් බිත්තර දැමීමට පැමිණෙන වෙරළ තීරයකින් සමන්විත ක්ෂිතිජය දක්වා විහිදෙන මුහුදක් සහිත වූ සුවිශේෂී භෞතික ලක්ෂණ වලින් සමන්විත ප්‍රදේශයකි. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| හිමිකම පිළිබඳ විස්තර | මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 60.0 |
| මූල්‍ය ක්‍රමය | භාණ්ඩාගාර අරමුදල් | | | | | | |

<table>
<tr><td>ව්‍යාපෘතියේ විස්තරය</td><td colspan="9">

1. රථ වාහන නැවතුම් ඉඩකඩ සැපයීම.
2. Cycle Way එකක් සහිත ඇවිදින මංතීරුව
3. කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයක්
4. වෙරළ තීරය භූදර්ශනය කිරීම.
5. දෙස් විදෙස් සංචාරකයින් සඳහා අපරවායුහ පහසුකම් සැපයීම.</td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම.</td><td colspan="5">ජලය<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය</td><td colspan="4">විදුලිය<br>ලංකා විදුලි බල මණ්ඩලය</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td></td><td>නැත.</td><td>✓</td><td></td><td colspan="3">සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td></tr>
<tr><td>කලාපය</td><td colspan="2">සංචාරක කලාපය</td><td colspan="3">කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
<tr><td colspan="10">වර්තමාන තත්ත්වය<br>මිදිගම වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට දැනට දළ සැලසුම් සකස් කර ඇති අතර, කොළඹ - වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ ගොඩනැගිලි සීමාව සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රක්ෂිත සීමාව තුළ පිහිටා ඇත. එබැවින් අදාල සියළු ආයතනයන්හි එකඟතාවය ලබා ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල යුතුව ඇත.</td></tr>
<tr><td colspan="10">පවත්නා තත්ත්වය<br> </td></tr>
</table>

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| මුළු වියදම | 209.2 |

**අදාල වන ආයතන**

| | | |
|---|---|---|
| සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1. නාගරික සංවර්ධන අධිකාරිය<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>3. මාර්ග සංවර්ධන අධිකාරිය.<br>4. ප්‍රාදේශීය සභාව වැලිගම<br>5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැලිගම | 1. වැලිගම ප්‍රාදේශීය සභාව<br>2. නාගරික සංවර්ධන අධිකාරිය<br>3. වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ දෙපාර්තමේන්තුව<br>4. සමුද්‍රීය පරිසර අධිකාරිය |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| වෙරළ සංරක්ෂණ හා වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම<br><br>විසල් මාතර සංවර්ධන සැලැස්ම | 1. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පනවා ඇති රෙගුලාසි | 1. සංවර්ධන සැලැස්මේ සංචාරක කලාපයට අයත් රෙගුලාසි.<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශය.<br>3. මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය. |

## 9. ගරාඬුව කලපුව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | ගරාඬුව කලපුව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘති යෝජනාව** | ගරාඬුව කලපුව පාරිසරික සංවේදීතාවය සුරකෙන පරිදි සංවර්ධනය කර සංචාරක කටයුතු සඳහා විවෘත කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය | වැලිගම | පළාත් පාලන ආයතනය | වැලිගම ප්‍රා.ස. |
| **ප්‍රවේශය** | ගරාඬුව කලපුව මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |   | | | |
| **යාබද ඉඩම් පරිහරණ** |  ගරාඬුව කලපුව හා ආශ්‍රිත ප්‍රදේශය සඳහා කඹුරුගමුව - ගරාඬුව මාර්ගයේ උඩුපිල - ලැබීම මාර්ගයෙන් ප්‍රවේශය ලැබෙන අතර, වර්තමාන ඉඩම් පරිහරණය අනුව අවට නේවාසික සංවර්ධනයක් පවතින අතර සංචාරක කර්මාන්තය ආශ්‍රිත ඉදිකිරීම් සඳහා වැඩි නැඹුරුතාවක් පවතියි. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | ✓ | | ✓ | | | | | ✓ |
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | | | ✓ |
| **ව්‍යාපෘතියේ අරමුණු** | ගරාඬුව කලපුව ආශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශය සංචාරක ආකර්ශනයක් ඇතිවන පරිදි සංවර්ධනයට යොදා ගැනීම. | | | | | | | |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ගරාඬුව කලපුව ආශ්‍රිත ප්‍රදේශය ඉහළ පාරිසරික වටිනාකමකින් යුත් ප්‍රදේශයකි. කලපුව මැද දූපත් පිහිටා ඇති අතර, එය ඉහළ ජෛව විවිධත්වයක් ඇති ප්‍රදේශයකි. සංචාරක ආකර්ශනය සහිත සංරක්ෂණය කල යුතු ප්‍රදේශයක් වන මෙම කලාපය මනා ලෙස භූ දර්ශනය කර පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට යොදා ගැනීම මෙහි අවශ්‍යතාවය වේ. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | | රජයේ | ✓ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | | දිගු කාලීන (වසර 3) | ✓ | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 200 |
| **මූල්‍ය ක්‍රමය** | භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** | 1. ගරාඬුව කලපුව සංරක්ෂණය කිරීම හා කලපුව වශයෙන් පවත්වා ගැනීම.<br>2. සංචාරක ආකර්ශනයක් සහිත උද්‍යානය ඉදිකිරීම.<br>3. කඩොලාන ශාක ආවරණය වැඩි කිරීම.<br>4. පරිසර හිතකාමී බෝට්ටු සේවයක් ඇති කිරීම දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආපනශාලා හා සනීපාරක්ෂක පහසුකම් මෙන්ම රථ වාහන නැවතුම් පහසුකම් ඇති කිරීම. | | | | | | | |

<table>
<tr><td></td><td colspan="8"> </td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම.</td><td colspan="4">ජලය<br>ජල අවශ්‍යතාවය දැනට ක්‍රියාත්මක වන විසල් මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් සැපයීමට යෝජිතය</td><td colspan="4">විදුලිය<br>ලංකා විදුලි බල මණ්ඩලය</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td>✓</td><td>නැත.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">සංචාරක කලාපය</td><td>කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
<tr><td colspan="9">පවත්නා තත්ත්වය<br>  </td></tr>
</table>

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය | මිලියන 200 |

අදාල වන ආයතන

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| ගරාඩුව කලපුව සංවර්ධනය | 1. වැලිගම ප්‍රාදේශිය සභාව<br>2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>3. මධ්‍යම පරිසර අධිකාරිය<br>4. වැලිගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය<br>5. නාගරික සංවර්ධන අධිකාරිය<br>6. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 1. වැලිගම ප්‍රාදේශිය සභාව<br>2. මධ්‍යම පරිසර අධිකාරිය<br>3. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>4. වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>5. වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | සංවර්ධන සැලැස්මේ පාරිසරික සංවේදී කලාපයට හා සංරක්ෂිත කලාපයට අයත් රෙගුලාසි.<br><br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නීති හා රෙගුලාසි<br><br>මාර්ග සංවර්ධන අධිකාරියේ නීති හා රෙගුලාසි.<br><br>මධ්‍යම පරිසර අධිකාරියේ නීති හා රෙගුලාසි |

**10. බොරාල වැව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය.**

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | බොරාල වැව විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | විවේක හා විනෝද කටයුතු ප්‍රවර්ධන ව්‍යාපෘතිය. |
| **ව්‍යාපෘති යෝජනාව** | බොරාල වැව පාරිසරික සංවේදීතාවය සුරකෙන පරිදි සංවර්ධනය කර සංචාරක කටයුතු සඳහා විවෘත කිරීම |

ව්‍යාපෘති ස්ථානය

| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
|---|---|---|---|---|
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිගම** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රා.ස.** |
| **ප්‍රවේශය** | වැලිගම- මුදුගමුව මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |   | | | |
| **යාබද ඉඩම් පරිහරණ (සිතියම සමග විස්තර කරන්න)** |   බොරාල වැව ආශ්‍රිත ප්‍රදේශය සඳහා, වැලිගම - මුදුගමුව මාර්ගය, බටවල පාතේගම මාර්ගය, පන්වාලිය බොරාල මාර්ගය මගින් ප්‍රවේශය ලබන අතර අවට පිහිටි ඉඩම් නේවාසික භාවිතය සඳහා යෙදවී ඇත. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝද කටයුතු | | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල පහසුකම් |
| | ✓ | | ✓ | | | | | ✓ |
| **ව්‍යාපෘති අංශ** | පාරිසරික | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ | | |
| **ව්‍යාපෘතියේ අරමුණු** | බොරාල වැව ආශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශය සංචාරක ආකර්ශනයක් ඇතිවන පරිදි සංරක්ෂණය කිරීම | | | | | | | |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි බොරාල වැව ආශ්‍රිත ප්‍රදේශය ඉහළ පාරිසරික සංවේදීතාවයකින් යුත් ප්‍රදේශයකි. මෙම වැව අවට ප්‍රදේශය නේවාසික සංවර්ධනයට යෙදවී ඇති අතර, ක්‍රම ක්‍රමයෙන් වැව වටා ප්‍රදේශය ගොඩවීමේ තර්ජනයට ලක්ව ඇත. එම නිසා මෙම වැව ආශ්‍රිත ප්‍රදේශය මනා ලෙස භූ දර්ශනය කර පාරිසරික සංචාරක ව්‍යාපෘතිය සඳහා යොමු කිරීම. | | | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | **පුද්ගලික** | | **රජයේ** | ✓ | **වෙනත්** | |
| **හිමිකම පිළිබඳ විස්තර** | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | **කෙටි කාලීන (වසර 1)** | | **මධ්‍ය කාලීන (වසර 1-3)** | ✓ | **දිගු කාලීන (වසර 3)** | | **මුළු ඇස්තමේන්තුගත පිරිවැය** | මි. 300.0 |
| **මූල්‍ය ක්‍රමය** | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය** |  | 1. වැවට ගෘහස්ථ අපද්‍රව්‍ය බැහැර කිරීම නැවැත්වීම.<br>2. සංචාරක ආකර්ශනයක් සහිත ඇවිදින මංතීරු ඉදිකිරීම.<br>3. වන ආවරණය වැඩි කිරීම.<br>4. පරිසර හිතකාමී බෝට්ටු සේවයක් ඇති කිරීම | | | | | | |

<table>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම.</td><td colspan="5">ජලය<br>ජල අවශ්‍යතාවය දැනට ක්‍රියාත්මක වන විසල් මාතර ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් සැපයීමට යෝජිතය.</td><td colspan="4">විදුලිය<br>විදුලි බල මණ්ඩලය</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td><td></td><td colspan="3">සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">පාරිසරික සංවේදී කලාපය</td><td colspan="2">කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td></td></tr>
<tr><td colspan="10">පවත්නා තත්ත්වය<br> </td></tr>
</table>

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| බොරාල වැව සංවර්ධනය | 1. වැලිගම ප්‍රාදේශීය සභාව<br>2. වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>3. මධ්‍යම පරිසර අධිකාරිය<br>4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>5. නාගරික සංවර්ධන අධිකාරිය | 1. වැලිගම ප්‍රාදේශීය සභාව<br>2. මධ්‍යම පරිසර අධිකාරිය<br>3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| **රෙගුලාසි සහ මාර්ගෝපදේශ** | **නීති රීති** | **මාර්ගෝපදේශ** |
| | වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි නීතිරීති | සංවර්ධන සැලැස්මේ පාරිසරික සංවේදී කලාපයට අයත් රෙගුලාසි.<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නීති හා රෙගුලාසි.<br>මධ්‍යම පරිසර අධිකාරියේ නීති හා රෙගුලාසි. |

## 11. දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය |
| ව්‍යාපෘතිය | මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය |
| ව්‍යාපෘති යෝජනාව | දෙනිපිටිය උප මංසන්ධි ආශ්‍රිතව වාණිජ පහසුකම් සංවර්ධනය සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |

ව්‍යාපෘති ස්ථානය

| | | | | |
|---|---|---|---|---|
| ස්ථානය | පළාත | දකුණු පළාත | දිස්ත්‍රික්කය | මාතර |
| | ප්‍රා.ලේ. කොට්ඨාශය | වැලිපිටිය | පළාත් පාලන ආයතනය | වැලිගම ප්‍රාදේශීය සභාව |
| ප්‍රවේශය | වැලිගම - අකුරැස්ස මාර්ගය | | | |
| පිහිටීම සිතියම |    | | | |
| යාබද ඉඩම් පරිහරණ |  දෙනිපිටිය මංසන්ධිය අකුරැස්ස වැලිගම මාර්ගයත්, අකුරැස්ස - පොල්අතුමෝදර මාර්ගය සහ කජුවත්ත මාර්ගයත් අතර ස්ථානගත වී ඇත. පවත්නා භූමි පරිභෝග රටාව අනුව මෙම ප්‍රදේශය දැනට පවතින පොදු වෙළඳපොළ වාණිජ | | | |

### ව්‍යාපෘති සාධාරණීකරණය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති වර්ගය | අලුත් | ✓ | වැඩිදියුණු කිරීම | ✓ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් |
| ව්‍යාපෘති වර්ගය | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල |
| | | ✓ | ✓ | ✓ | | | ✓ |
| ව්‍යාපෘති අංශ | පරිසරය | ✓ | ආර්ථික | ✓ | සමාජ | ✓ | |
| ව්‍යාපෘතියේ අරමුණු | 1. ඌණ භාවිතයේ පවතින දෙනිපිටියේ පොළ හා වාණිජ ගොඩනැගිල්ල ප්‍රශස්ත භාවිතයට යොදා ගැනීම හා නගර මධ්‍ය ප්‍රදේශය තුළ සැලසුම්ගත සංවර්ධනයක් ඇති කිරීම.<br>2. ප්‍රදේශයේ ජනතාවගේ වාණිජ කටයුතු සහ රථවාහන නැවතුම් පහසුකම් වලට ඉඩ සැලසීම.<br>3. මංසන්ධිය තුළ රථ වාහන නැවතුම් තදබදය අඩු කිරීම සහ නගර අලංකරණය. | | | | | | |
| ව්‍යාපෘතියේ අවශ්‍යතාවය | දෙනිපිටිය මංසන්ධිය ප්‍රදේශයේ පිහිටි ඉහල වාණිජ වටිනාකමක් සහිත පොළ භූමිය ඌණ භාවිතයේ පවතින අතර එම ඉඩම රජය සතුවේ. මෙම ප්‍රදේශය මංසන්ධියේ හර ප්‍රදේශය වන අතර, දෙනිපිටිය පාලම ආසන්නයේ පිහිටා ඇත. මංසන්ධිය අවට අවිධිමත් ලෙස සංවර්ධනය වී ඇති අතර, වාහන තදබදයක්ද දැකිය හැකිය. මේ නිසා මංසන්ධිය පුළුල් කර භූ දර්ශනය කර ජනතාවගේ පොදු රථවාහන නැවතුම් හා වාණිජ අවශ්‍යතාවයන් ඉටුකර දීම සඳහා සංවර්ධනය කල යුතුව ඇත. | | | | | | |

### ව්‍යාපෘති විස්තරය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වර්තමාන ඉඩම් හිමිකම | පුද්ගලික | ✓ | රජයේ | ✓ | වෙනත් | |
| හිමිකම පිළිබඳ විස්තර | 1. ප්‍රාදේශීය සභාව සහ පුද්ගලික<br>2. මාර්ග සංවර්ධන අධිකාරිය - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව | | | | | |

### ව්‍යාපෘති විස්තරය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති කාලය | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු.මි. 225 |
| මූල්‍ය ක්‍රමය | මහා භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |

<table>
<tr><td>ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)</td><td colspan="7">
</td></tr>
<tr><td>යටිතල පහසුකම් ලබා ගැනීම</td><td colspan="4">ජලය<br>ඇත</td><td colspan="3">විදුලිය<br>ඇත</td></tr>
<tr><td></td><td>සන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය</td><td>ඔව්</td><td></td><td>නැත.</td><td>✓</td><td>සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න</td><td></td></tr>
<tr><td>කලාපය</td><td colspan="3">වාණිජ</td><td>කලාපීය අනුකූලතාව</td><td>ඔව්</td><td></td><td>නැත</td></tr>
<tr><td colspan="8">පවත්නා තත්ත්වය<br>  </td></tr>
</table>

**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| 1. පොළ ප්‍රතිසංවර්ධනය | 10 |
| 2. දෙනිපිටිය මංසන්ධිය සංවර්ධනය | 100 |
| 3. වාණිජ කටයුතු සංවර්ධනය | 30 |
| 4. රථවාහන නැවතුම් ස්ථාන | 5 |
| 5. නුගරුක අවට භූදර්ශනය | 5 |
| 6. ඉඩම් අත්පත් කිරීම | 25 |
| 7. පැරණි පාලම ප්‍රතිසංවර්ධනය කිරීම | 50 |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| දෙනිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය | වැලිගම ප්‍රාදේශීය සභාව | ප්‍රාදේශීය සභාව |
| | මාර්ග සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | |
| | නාගරික සංවර්ධන අධිකාරිය | |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | 1. සංවර්ධන සැලැස්මෙහි වාණිජ කලාපයට අයත් රෙගුලාසි<br>2. මාර්ග සංවර්ධන අධිකාරියේ රෙගුලාසි<br>3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ |

## 12 වැලිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | වැලිපිටිය මංසන්ධිය සංවර්ධන ව්‍යාපෘතිය |
| **ව්‍යාපෘතිය** | වාණිජ සංවර්ධන පොදු පහසුකම් සැපයීම |
| **ව්‍යාපෘති යෝජනාව** | අක්‍රමවත්ව පවතින වැලිපිටිය පොළ සහ වැලිපිටිය මංසන්ධිය විධිමත්ව සංවර්ධනය කිරීම |

**ව්‍යාපෘති ස්ථානය**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථානය** | **පළාත** | **දකුණු පළාත** | **දිස්ත්‍රික්කය** | **මාතර** |
| | **ප්‍රා.ලේ. කොට්ඨාශය** | **වැලිපිටිය** | **පළාත් පාලන ආයතනය** | **වැලිගම ප්‍රාදේශීය සභාව** |
| **ප්‍රවේශය** | වැලිගම කනංකේ මාර්ගය | | | |
| **පිහිටීම සිතියම** |  | | | |
| **යාබඳ ඉඩම් පරිහරණ** |  වැලිපිටිය මංසන්ධිය වැලිගම කනංකේ මාර්ගය හා මූණමල්පේ මාර්ගය යාබදව ස්ථානගතවී ඇත. පවත්නා භූමි පරිභෝග රටාව අනුව මෙම ප්‍රදේශයේ නේවාසික ,දෙමහල් වාණිජ ගොඩනැගිලි, පුද්ගලික කඩ කාමර, කුඹුරු ඉඩම් පිහිටා ඇත. | | | |

**ව්‍යාපෘති සාධාරණීකරණය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | නව | ✓ | වැඩිදියුණු කිරීම | ✓ | ව්‍යාපෘතිය | | ඉඩම් සංවර්ධනය පමණක් | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති වර්ගය** | සංරක්ෂණ | වාණිජ | භූ දර්ශනය සහ විනෝදය | උරුමය | නිවාස | ප්‍රතිස්ථාපනය | යටිතල |
| | | ✓ | | | | | ✓ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අංශ | | පරිසරය | | ආර්ථික | ✓ | සමාජ | ✓ |

| | | |
|---|---|---|
| **ව්‍යාපෘතියේ අරමුණු** | | 1. ඌණ භාවිතයේ පවතින පොළ භූමිය ප්‍රශස්ත භාවිතයකට යොදා ගැනීම සහ සැලසුම් ගත සංවර්ධනයක් ඇති කිරීම.<br>2. ජනතාවගේ සාමාජීය අවශ්‍යතාවයන් සපුරාලීම.<br>3. වඩා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් එකම ස්ථානයක් තුලින් ලබාදීම.<br>4. වැලිපිටිය මංසන්ධිය විධිමත්ව සංවර්ධනය කිරීම. |
| **ව්‍යාපෘතියේ අවශ්‍යතාවය** | | වැලිපිටිය මංසන්ධියේ පිහිටි ඉහල වාණිජ වටිනාකමක් සහිත පොළ භූමිය ඌණ භාවිතයේ පවතින අතර, එම ඉඩම රජය සතුවේ. මෙහි දැනට පැරණි පොල පිහිටා ඇත. ඒ අනුව පොළ භූමිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියක් තුලින් ජනතාවට වඩා පහසුකම් සහිත වාණිජ සේවාවන් සැපයීම මෙමගින් සිදුවේ. එසේම ප්‍රදේශයේ ජනතාවගේ සාමාජීය අවශ්‍යතාවන් ඉටු කිරීමට, ප්‍රජා ශාලාවක් සේවා පියසක් එකම ස්ථානයේ ඉදිකිරීම තුලින් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබාදීමට හැකියාව ලැබේ. |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **වර්තමාන ඉඩම් හිමිකම** | පුද්ගලික | ✓ | රජයේ | ✓ | වෙනත් | |
| **හිමිකම පිළිබඳ විස්තර** | ප්‍රාදේශීය සභාව / මාර්ග සංවර්ධන අධිකාරිය | | | | | |

**ව්‍යාපෘති විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති කාලය** | කෙටි කාලීන (වසර 1) | | මධ්‍ය කාලීන (වසර 1-3) | ✓ | දිගු කාලීන (වසර 3) | | මුළු ඇස්තමේන්තුගත පිරිවැය | මිලියන 50 |
| **මූල්‍ය ක්‍රමය** | ප්‍රාදේශීය සභා අරමුදල් , භාණ්ඩාගාර අරමුදල් | | | | | | | |
| **ව්‍යාපෘතියේ විස්තරය (සිතියම් සමග)** |   | | | | | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම් ලබා ගැනීම** | ජලය | | | | විදුලිය | | |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය | ඔව් | ✓ | නැත. | | සුදුසු නොවේ SWM යෝජනාව ඉදිරිපත් කරන්න | |
| **කලාපය** | වාණිජ කලාපය | | | කලාපීය අනුකූලතාව | ඔව් | ✓ | නැත |

පවත්නා තත්ත්වය





**ව්‍යාපෘති අයවැය**

| ක්‍රියාකාරිත්වය | වියදම (රු. මිලියන) |
|---|---|
| පවතින පොළ ප්‍රතිසංවර්ධනය කිරීම | 30 |
| සේවා පියස ප්‍රජා ශාලාව ඉදිකිරීම | 50 |
| වැලිපිටිය මංසන්ධිය පුළුල් කිරීම | 50 |
| | |

**අනුමත කරන ආයතන**

| ක්‍රියාකාරිත්වය | අදාල වන ආයතන | වගකිව යුතු ආයතන |
|---|---|---|
| | වැලිගම ප්‍රාදේශීය සභාව | වැලිගම ප්‍රාදේශීය සභාව |
| | නාගරික සංවර්ධන අධිකාරිය | මාර්ග සංවර්ධන අධිකාරිය |
| | වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | |
| | මාර්ග සංවර්ධන අධිකාරිය | |

| රෙගුලාසි සහ මාර්ගෝපදේශ | නීති රීති | මාර්ගෝපදේශ |
|---|---|---|
| | නාගරික සංවර්ධන අධිකාරි සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි | 1. සංවර්ධන සැලැස්මේ වාණිජ කලාපයට අයත් රෙගුලාසි<br>2. මාර්ග සංවර්ධන අධිකාරියේ රෙගුලාසි |

# II වන කොටස

# 07 වන පරිච්ඡේදය

## සංවර්ධන කලාප හා කලාප නියමතා

## 7.1. හැඳින්වීම

අපේක්ෂිත සංවර්ධනය මත පදනම්ව “මාතර පුරවරයේ නොනිඳන සංචාරක නාගරිකය” යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධන සැලැස්ම (2023- 2033) සකස් කර ඇති අතර ඒ තුලින් ඉදිරි වසර 10ක කාලසීමාව සඳහා අරමුණු හා පරමාර්ථ හඳුන්වා දී ඇත. මීට අමතරව, මෙම අරමුණු හා පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් හයක් ද හඳුන්වා දී ඇත. ඒ අනුව ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ගික සැලැස්ම ඉහත සඳහන් උපායමාර්ගික සැලසුම් වලින් එකකි.

විශේෂයෙන්ම, මෙම සැලැස්ම තුලින් සාම්ප්‍රදායික ඉඩම් පරිහරණය හා සාම්ප්‍රදායික කලාපීකරණ සැලසුම් වලින් ඔබ්බට සණත්වය පදනම් කරගත් සංවර්ධනය සඳහා අවස්ථාව ලබා දෙන අතර යෝජිත නාගරික ව්‍යුහය නිර්මාණය කිරීම අපේක්ෂා කරයි.

මෙම පරිච්ඡේදයේ සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා විස්තරාත්මකව දක්වා ඇත. මෙහිදී, සංවර්ධන කලාප , කලාපීකරණ සංගුණකය, සංවර්ධන කලාප සඳහා අවසර ලත් භාවිතයන් සහ එම සංවර්ධන කලාපවලට බලපාන පොදු නියමතා විස්තර කර ඇත.

මෙම කලාපීකරණ සැලැස්ම සකස් කිරීම සහ එහි මායිම් සත්‍යාපනය, සැලසුම් ප්‍රදේශයට අදාළ අවකාශීය විශ්ලේෂණයන් කිහිපයක ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මේ (2023- 2033) සැලසුම් සංකල්පය , සංවර්ධන පීඩන විශ්ලේෂණය, සංවේදීතා විශ්ලේෂණය, වාසයට සුදුසු බව නිර්ණය කිරීමේ විශ්ලේෂණය සහ විභව අවකාශ විශ්ලේෂණය, ප්‍රධාන නගර වලට ඇති දුර සහ යටිතල පහසුකම් පුළුල් කිරීම යන නිර්ණායක මෙම කලාප හඳුනා ගැනීමට යොදා ගෙන ඇත.

## 7.1 කලාපීකරණ සැලැස්ම

**සිතියම් අංක 16 : වැලිගම ප්‍රා. ස. බල ප්‍රදේශය - කලාපීකරණ සැලැස්ම- 2023-2033**




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, මාතර දිස්ත්‍රික් කාර්යාලය

**සංවර්ධන කලාප සහ කලාප සංගුණකය**

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම මගින් ප්‍රධාන සංවර්ධන කලාප 06 කට බෙදා ඇති අතර එම ප්‍රධාන සංවර්ධන කලාප අපේක්ෂිත සංවර්ධන ඝනත්වය මත පදනම්ව නැවත උප කලාප වලට බෙදා දක්වා ඇත. ඒ අනුව, එම සංවර්ධන කලාපය සඳහා අපේක්ෂිත සංවර්ධන ඝනත්වය හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය මත පදනම්ව කලාප සංගුණකය නිර්ණය කරන ලදී.

**වගු අංක 13 : සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන්**

| සංවර්ධන කලාපය | උප සංවර්ධන කලාපය | කලාප සංකේතය | කලාප සංගුණකය |
|---|---|---|---|
| **නේවාසික කලාපය (Residential Zone)** | අධි ඝනත්ව කලාපය | R1 | 1.50 |
| | මධ්‍ය ඝනත්ව කලාපය | R2 | 1.0 |
| **වාණිජ කලාපය(commercial Zone)** | මධ්‍ය ඝනත්ව කලාපය | C2 | 1.50 |
| **මිශ්‍ර සංවර්ධන කලාපය (Mix Development Zone)** | - | MD | 1. 50 |
| **සංචාරක කලාපය (Tourism Zone)** | අධි ඝනත්ව කලාපය | T1 | 2.00 |
| **කර්මාන්ත කලාපය (Industrial Zone)** | - | I | 1.30 |
| **සංරක්ෂණ කලාපය (Conservation Zone)** | අධි සංවේදී සංරක්ෂණ කලාපය | Cn1 | 0.00 |
| | මධ්‍ය සංවේදී සංරක්ෂණ කලාපය | Cn2 | 0.00 |
| | අඩු සංවේදී සංරක්ෂණ කලාපය | Cn3 | 0.00 |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

## 7.2. සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

01. වර්ෂ 1978 අංක 41 දරණනාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ අංක 223/16 දරණ 1982.12.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් වෙරළේ සිට කි.මී. 1.0 ක කලාපය ද විසල් මාතර නාගරික සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රකාශිත බල ප්‍රදේශය අංක 1409/8 දරණ 2005.09.07 දිනැති ගැසට් නිවේදනය, දක්ෂිණ අධිවේගී මාර්ගය සඳහා සකස් කරන ලද 2005.11.23 දිනැති අංක 1420/17 දරණ අති විශේෂ ගැසට් හා අංක 2302/20 දරණ 2022.10.19 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් වැලිගම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයම නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

02. කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී, ඊට අදාල වන සැලසුම් හා සංවර්ධන නියමතා සඳහා මෙම කලාපිකරණ සැලැස්මේ නියමතාවන්ට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජූලි මස 08 දින අංක 2235/54 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති සැලසුම් හා ගොඩනැගිලි නියෝග /රෙගුලාසි (පොදු) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මක වේ.

03. කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පෙර අනුබෙදුම් කර ඇති බිම් කොටස් පවත්නා බිම් කට්ටියක් ලෙස සලකනු ලබයි.

04. යම් ඉඩමක අයිතිකරුවකු විසින්, වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්, යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සඳහා සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු ලබයි. නමුත් බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට/ යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිය යුතුය.

05. මෙම වෙළුමේ 08 වන පරිච්ඡේදයේ වගු අංක 24 හි සඳහන් යෝජිත මාර්ග පළල පදනම් කර ගෙන සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීමේදී එම ප්‍රදේශයේ පවතින සංවර්ධන නැඹියාව, ප්‍රධාන මාර්ග හා සම්බන්ධ වන දුර රථවාහන දෙකක් පහසුවෙන් මාරුවීමට ඇති හැකියාව සහ යෝජිත සංවර්ධනයේ ස්වභාවය යන සාධක සැලකිල්ලට ගෙන තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

06. සංචාරක කලාපය තුළ නේවාසික නොවන භාවිත සඳහා (තරු පන්තියේ හෝටල් සහ උත්සව ශාලා හැර අනෙකුත් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ සංවර්ධන කටයුතු ආශ්‍රිතව) යෝජිත මාර්ග පළලක් සඳහන් කර නොමැති අවස්ථාවක සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීමේදී සංවර්ධන නැඹියාව ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ වන දුර, රථවාහන දෙකක් පහසුවෙන් මාරුවීමට ඇති

අවස්ථාව, නීත්‍යානුකූල ප්‍රවේශ අයිතිය ඇති මාර්ග එකකට වැඩි ප්‍රමාණයක් පැවතීම යන කරුණු සළකා මාර්ගයේ පළල අඩු කර තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

07. එකිනෙකට ස්වායක්තව ප්‍රධාන මාර්ගයන් හා සම්බන්ධ වන, අවම පළල මීටර් 6ට හෝ ඊට වැඩි සහ නිත්‍යානුකූල ප්‍රවේශ අයිතිය හිමි මාර්ග එකකට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධන පරිශ්‍රයට මුහුණලා ඇති අවස්ථාවන්හිදී, ප්‍රවේශ මාර්ගයේ පළල ලෙස එකී සියලු මාර්ගවල පළල එකතුව සලකා අවසරලත් සංවර්ධනය ගණනය කිරීම අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

08. ගොඩනැගිලි ඉදිකිරීමේදී, "ඇ ආකෘතියෙහි" දක්වා ඇති කලාප සංගුණකයට අදාළ අවසරලත් ගෙබිම් ප්‍රමාණය තීරණය කිරීමේදී, යෝජිත භූමියෙහි ආනතිය සලකා බලා වගු අංක 14හි දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව උපරිම ගෙබිම් අනුපාතය තීරණය කල යුතුය.

**වගු අංක 14 : භූමියෙහි ආනතිය අනුව අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය සහ ගෙබිම් අනුපාතයෙහි ප්‍රතිශතය**

| **ඉඩමේ ආනතිය (අංශක)** | **අවසර දිය හැකි උපරිම භූමි ආවරණය** | **අවසර දිය හැකි උපරිම ගෙබිම් අනුපාතයෙහි ප්‍රතිශතය (%)** |
|---|---|---|
| **00 සිට 10 දක්වා** | කලාපිකරණ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | 100% |
| **11 < සිට 20 දක්වා** | කලාපිකරණ රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | 75% |
| **21 < සිට 30 දක්වා** | 50% | 50% |
| **31 < සිට 45 දක්වා** | 40% | 35% |
| **45 ට වැඩි** | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශයට අනුකූලව සංවර්ධන කාර්යයන් සඳහා අවසර දෙනු ලැබේ. | |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

සටහන - $11^0$ට වඩා වැඩි වන අවස්ථා වලදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය ලබාගත යුතුය.

ආනතිය සහිත ඉඩමක් අනුබෙදුම් කිරීමේදී වගු අංක 15 හි දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව අවම බිම් ප්‍රමාණය පවත්වා ගත යුතුය.

**වගු අංක 15 : භූමියෙහි ආනතිය අනුව අවසරලත් අවම භූමි ප්‍රමාණය සහ ඉඩමේ අවම පළල හා ගැඹුර**

| ඉඩමේ ආනතිය (අංශක) | අවසර දිය හැකි අවම භූමි ප්‍රමාණය (ව.මී) | අවසර දිය හැකි ඉඩමේ අවම පළල හා ගැඹුර |
|---|---|---|
| **00 සිට 10 දක්වා** | 150 | සැලසුම් හා සංවර්ධන රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |
| **11 < සිට 20 දක්වා** | 250 | |
| **21 < සිට 30 දක්වා** | 500 | |
| **31 < සිට 45 දක්වා** | 750 | |
| **45 ට වැඩි** | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශයට අනුකූලව සංවර්ධන කාර්යයන් සඳහා අවසර දෙනු ලැබේ. | |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

09. ආනතියක් සහිත භූමියක සිදු කරන ඉදිකිරීම් කටයුතු සඳහා කරනු ලබන ඉවුරු කැපීම් වලදී අදාළ ආයතන වල නිර්දේශ ලබා ගත යුතු අතර කැපුම්තලය ඉහළ කෙළවර සිට යාබද වැට මායිම දක්වා අවම වශයෙන් මීටර් 1 ක ඉඩක් වෙන් කළ යුතුය.

10. කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට වැටන සේ පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට හසුවන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය ලබන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මගිනි.

11. එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය. *සංරක්ෂණ කලාප සඳහා මෙම නියමතාවය අදාළ නොවේ.

12. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් අතරට හසු වන සේ ඇත්නම්, එම බිම් කොටස එයට ප්‍රධාන ප්‍රවේශය ලබන කලාපයේ භාවිතයන් සඳහා, අදාළ පළාත් පාලන ආයතනවල එකගතාවය මත අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ.

13. එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් පළාත් පාලන බල ප්‍රදේශය අදාළ කරගත යුතුය.

14. යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටි ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඈතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ.

15. යම්හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇති විටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය.

16. කලාපිකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත් එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිලිබඳ තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

17. යෝජිත කලාපිකරණ සැලැස්ම තුළ අනුමත භාවිතයන් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පමණක් අවසර ලබාදීම සලකා බලනු ලැබේ. නමුත් පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලබා දීම පිලිබඳව සලකා බලනු නොබලන අතර, භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යැයි හැඟී යන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස නියම කරනු ලැබිය හැක.

18. ගොඩනැගිලි සීමාව තුළ මායිම් තාප්ප ඉදිකිරීම සඳහා මාර්ගය අයත් ආයතනය සමග නිර්වන්දි ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

19. ගොඩනැගිලි සීමා හඳුන්වා දී ඇති මීටර් 5.0 ට අඩු මාර්ග වල මායිම් තාප්ප ඉදිකිරීමේදී මාර්ගය ඉමේ සිට අවම වශයෙන් මීටර් 0.5 ක් තැබිය යුතු අතර, ප්‍රවේශ මාර්ගයේ භෞතික පළල, දිග, ප්‍රවේශය ලබන බිම් කට්ටි ප්‍රමාණය යන කරුණු සැලකිල්ලට ගෙන මාර්ගය ඉමේ සිට තැබිය යුතු බිම් ප්‍රමාණය මීටර් 1.0 දක්වා වැඩිකර ඉල්ලා සිටීමට සැලසුම් කමිටුව තීරණය කළ හැකිය.

20. ප්‍රදේශයේ මංසන්ධි මාර්ග දෙපස ගොඩනැගිලි සීමා, මාර්ග පළල් කිරීමේ සීමා හා රක්ෂිත තුළ විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ සමාන ඉදිකිරීම් සඳහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් සිදු නොකරනු ලබයි.

21. සංවර්ධන සැලැස්ම තුළ හඳුනාගෙන නොමැති නමුත් පහත් බිම්, වගුරු බිම්, කුඹුරු, තෙත්බිම් හෝ ඕවිට හෝ වෙනත් එවැනි ඉඩම් සඳහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියෙහි නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

22. අනුමත භාවිතයන්ට අදාල අවම බිම් ප්‍රමාණය උපලේඛන අංක V ළ ආකෘතියට අනුව සපුරාලිය යුතුය.

23. යම් සංවර්ධනයක් සඳහා කුළුණු දොඹකර භාවිතා කරනු ලබන්නේ නම් ඒ සඳහා සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ නිර්දේශ සහ රක්ෂණාවරණයක් සහිතව අවසර පත්‍රයක් අදාළ සංවර්ධනය සඳහා අනුමැතිය ලබාදුන් ආයතනයෙන් ලබාගතයුතුය.

24. යම්සංවර්ධනයක් සඳහා නීත්‍යානුකූලව ලබාදිය යුතු රථවාහන නැවතුම් පිළිබඳ අවශ්‍යතාවය උපලේඛණ අංක VI ඌ අනුව සපුරාලිය යුතුය.

25. පාසල් හා ළමා නිවාස සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී විවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් 50%ක ප්‍රමාණයක් විවෘතව තැබිය යුතුය.

26. රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට අපොහොසත් වන්නේනම්, උපරිමය මීටර් 100ක දුරින් පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය.

27. අධිකාරිය විසින් හඳුනා ගනු ලබන ප්‍රදේශ වල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය.

28. මෙම සැලසුම් ප්‍රදේශය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, දුම්රිය දෙපාර්තමේන්තුව යනාදී රාජ්‍ය ආයතන දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් හා සංවර්ධන යෝජනා ලබා ගත යුතු වේ.

29. සියලු කැණීම් කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු අදාළ ආයතනයන්හි නිර්දේශයන්ට අනුව සිදු කල යුතු අතර, එම කටයුත්ත නිම වීමෙන් පසුව එකී ආයතනයේ නිර්දේශයට අනුකූලව කැණීම් කරන ලද ස්ථාන යථා තත්වයට පත් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

30. යම්කිසි නීතිගත සැලසුම්, සංවර්ධන හෝ ගොඩනැගිලි රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රයෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතුවේ.

31. සංවර්ධන අනුමැතිය ලබා දීමේදී යම් හේතුවක් නිසා භූමිය සම්බන්ධව රෙගුලාසියක් ලිහිල් කරන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් සහ එම රෙගුලාසියට අයත් ඉඩමේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව ගණනය කර, ඊට අදාළ වටිනාකම තක්සේරු කර, එම වටිනාකමින් 30% කට නොවැඩි මුදලක් අවස්ථානුකූලව අධිකාරියට අය කර ගත යුතුය.

32. සංවර්ධන ප්‍රදේශයේ ක්ෂණික ගං වතුර තත්ත්වයන් පාලනය සඳහා ජලය රඳා පවතින පහත් බිම් ඒ ආකාරයෙන්ම පවත්වා ගත යුතුය.

33. හෙක්ටයාර් 01කට වඩා වැඩි වන පොල්, කුරුඳු ඉඩම් කෘෂිකර්මාන්ත නොවන කටයුත්තක් සඳහා අයදුම් කරන්නේ නම් අදාල ආයතනයේ නිර්දේශය සමඟ නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණය සඳහා අයදුම් කළ යුතුය.

34. මෙහි නියෝග/ රෙගුලාසි/ අර්ථනිරූපනයන්ට අදාලව සිංහල හා ඉංග්‍රීසි භාෂා අතර කිසියම් නොගැලපීමක් ඇති වුවහොත් සිංහල භාෂාව සලකා බලනු ලබයි.

## 7.3. සංවර්ධන කලාප නියමතා

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සභා සංවර්ධන සැලැස්ම මගින් සංවර්ධන බල ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 06 ක් සඳහා බලපැවැත්වෙන කලාපීකරණ නියමතා පහත දක්වා ඇත.

වගු අංක 16 : නේවාසික කලාපය

| ප්‍රධාන කලාපය | නේවාසික කලාපය | |
|---|---|---|
| **කලාප ලක්ෂණ** | මෙම කලාපය ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වන්නේ සාමාන්‍ය මහජනතාවගේ නිවාස අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නේවාසික ගොඩනැගිලි සහ එම භාවිතයට කිසිදු ආකාරයකට අහිතකර බලපෑමක් ඇති නොවන භාවිතයන් සඳහා පමණක් අවසර ලබාදීම වේ. | |
| **කලාප මායිම්** | ඇමුණුම් අංක 01 අනුව විය යුතුය. | |
| **උප කලාපය** | අධි ඝනත්ව කලාපය | මධ්‍ය ඝනත්ව කලාපය |
| **කලාප අංකය** | R1 | R2 |
| **කලාප සංගුණකය** | 1.50 | 1.0 |
| **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | උපලේඛණය I සහ II හි සදහන් “අ” සහ “ආ” ආකෘති අනුව විය යුතුය. | |
| **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව විය යුතුය. | |
| **විවෘත අවකාශයන් සහ උපරිම උස** | උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව විය යුතුය. | |
| **අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය** | කලාප අංකය (R1)<br>ව.මීටර් 250 | කලාප අංකය (R2)<br>ව.මීටර් 250 |
| **අවසරලත් භාවිතාවන්** | උපලේඛණය IV සහ V හි සදහන් “ඊ” සහ "උ" ආකෘති අනුව විය යුතුය. | |
| **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | උපලේඛණ IV “ඉ” සදහන් අවසරලත් භාවිතයන් යටතේ * සඳහන් භාවිතා වලදී පවතින ගොඩනැගිලිවල සංශෝධනයන් සහ පහසුකම් සඳහා වූ නව ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලැබේ. උපලේඛණ IV හි “ඉ” සදහන් ⅄ භාවිතය අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ.<br>ප්‍රායෝගිකව ලබාදිය නොහැකි රථවාහන නැවතුම් සඳහා දඩ මුදල් ගෙවීම සලකා බැලිය නොහැක. | |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

වගු අංක 17 : වාණිජ කලාපය

| ප්‍රධාන කලාපය | වාණිජ කලාපය |
|---|---|
| කලාප ලක්ෂණ | සියළුම වාණිජ කටයුතු වලට ප්‍රමුඛතාවයක් ලබාදෙමින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙම කලාපයේ අරමුණ වේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක 01 අනුව විය යුතුය. |
| උප කලාපය | මධ්‍යම ඝනත්ව වාණිජ කලාපය |
| කලාප අංකය | C2 |
| කලාප සංගුණකය | 1.5 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය | උපලේඛණය I සහ II හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව විය යුතුය |
| අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය | උපලේඛණය II සහ III හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව විය යුතුය |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | උපලේඛණය III හි සඳහන් “ඉ” ආකෘතිය අනුව විය යුතුය |
| අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය | ව.මීටර් 150.0 |
| අවසරලත් භාවිතාවන් | උපලේඛණය IV සහ V හි සඳහන් “ඊ” සහ "උ" ආකෘති අනුව වියයුතුය |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | උපලේඛණ IV “ඉ” සඳහන් අවසරලත් භාවිතයන් යටතේ * සඳහන් භාවිතා වලදී පවතින ගොඩනැගිලිවල සංශෝධනයන් සහ පහසුකම් සඳහා වූ නව ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලැබේ.<br>උපලේඛණ IV හි “ඉ” සඳහන් ⅄ භාවිතය අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ. |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, , 2023

වගු අංක 18 : මිශ්‍ර සංවර්ධන කලාපය

| ප්‍රධාන කලාපයේ නම | මිශ්‍ර සංවර්ධන කලාපය |
|---|---|
| කලාප ලක්ෂණ | වාණිජ හා සංචාරක කලාප සඳහා ඇතිවන පීඩනය පාලනය කරමින් බහුවිධ ආර්ථික කටයුතු සඳහා ඉඩ පහසුකම් සැපයීම මෙම කලාපය ස්ථාපිත කිරීමේ අරමුණ වේ. |
| කලාප මායිම් | ඇමුණුම් අංක 01 අනුව විය යුතුය. |
| කලාප අංකය | MD |
| කලාප සංගුණකය | 1.50 |
| අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය | උපලේඛණය I සහ II හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය |
| අවසරලත් උපරිම බිම් කවරේජ් ආවරණය | උපලේඛණය II  සහ III හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය |
| විවෘත අවකාශයන් සහ උපරිම උස | උපලේඛණය III හි සඳහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය |
| අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය | ව.මීටර් 150.0 |
| අවසරලත් භාවිතාවන් | උපලේඛණය IV සහ V හි සඳහන් “ඊ” සහ "උ" ආකෘති අනුව වියයුතුය |
| කලාපය සඳහා වන පොදු රෙගුලාසි | උපලේඛණ IV “ඉ” සඳහන් අවසරලත් භාවිතයන් යටතේ * සඳහන් භාවිතා වලදී පවතින ගොඩනැගිලිවල සංශෝධනයන් සහ පහසුකම් සඳහා වූ නව ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලැබේ.උපලේඛණ IV හි “ඉ” සඳහන් ⅄ භාවිතය අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ. |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

වගු අංක 19 : සංචාරක කලාපය

| ප්‍රධාන කලාපය | සංචාරක කලාපය |
|---|---|
| **කලාප ලක්ෂණ** | මෙම කලාපය ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ සංචාරක කර්මාන්තයට අවශ්‍ය ඉඩ පහසුකම් සපයමින් අධි ඝනත්ව සංචාරක කටයුතු සඳහා යෝජනා දිරිමත් කරමින් සංචාරක ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමයි. |
| **කලාප මායිම්** | ඇමුණුම් අංක 01 අනුව විය යුතුය. |
| **උප කලාපය** | අධි ඝණත්ව සංචාරක කලාපය |
| **කලාප අංකය** | T1 |
| **කලාප සංගුණකය** | 2.00 |
| **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | උපලේඛණය I සහ II හි සඳහන් “අ” සහ “ආ” ආකෘති අනුව විය යුතුය. |
| **අවසරලත් උපරිම බිම් කවරේ ආවරණය** | උපලේඛණය II සහ III හි සඳහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව විය යුතුය. |
| **විවෘත අවකාශයන් සහ උපරිම උස** | උපලේඛණය III හි සඳහන් “ඉ” ආකෘතිය අනුව විය යුතුය. |
| **අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය** | ව.මීටර් 150.0 |
| **අවසරලත් භාවිතාවන්** | උපලේඛණය IV සහ V හි සඳහන් “ඊ” සහ "උ" ආකෘති අනුව විය යුතුය. |
| **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | උපලේඛණ IV “ඉ” සඳහන් අවසරලත් භාවිතයන් යටතේ * සඳහන් භාවිතා වලදී පවතින ගොඩනැගිලිවල සංශෝධනයන් සහ පහසුකම් සඳහා වූ නව ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලැබේ.<br><br>උපලේඛණ IV හි “ඉ” සඳහන් ⅄ භාවිතය අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ. |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, , 2023

වගු අංක **20 :** **කර්මාන්ත කලාපය**

| **ප්‍රධාන කලාපය** | **කර්මාන්ත කලාපය** |
|---|---|
| **කලාප ලක්ෂණ** | මාතර නගරයේ හා තදාසන්න ප්‍රදේශයේ විසිර පවතින කර්මාන්ත එකම ස්ථානයක ස්ථාන ගත කර අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ අරමුණින් මෙම කලාපය පිහිටුවා ඇත. |
| **කලාප මායිම්** | ඇමුණුම් අංක 01 අනුව විය යුතුය. |
| **කලාප අංකය** | I |
| **කලාප සංගුණකය** | 1.30 |
| **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | උපලේඛණය I සහ II හි සදහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය |
| **අවසරලත් උපරිම බිම් කවරේ ආවරණය** | උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය |
| **විවෘත අවකාශයන් සහ උපරිම උස** | උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය |
| **අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය** | ව.මීටර් 1000.0 |
| **අවසරලත් භාවිතාවන්** | උපලේඛණය IV සහ V හි සදහන් “ඊ” සහ "උ" ආකෘති අනුව වියයුතුය |
| **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | උපලේඛණ IV “ඉ” සදහන් අවසරලත් භාවිතයන් යටතේ * සඳහන් භාවිතා වලදී පවතින ගොඩනැගිලිවල සංශෝධනයන් සහ පහසුකම් සඳහා වූ නව ගොඩනැගිලි සඳහා පමණක් අවසර ලැබේ.<br><br>උපලේඛණ IV හි “ඉ” සදහන් ⅄ භාවිතය අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ.<br><br>ප්‍රායෝගිකව ලබාදිය නොහැකි රථවාහන නැවතුම් සඳහා දඩ මුදල් ගෙවීම සලකා බැලිය නොහැක. |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

**වගු අංක 21 : සංරක්ෂණ කලාපය**

<table>
<tr><td>i. ප්‍රධාන කලාපය</td><td colspan="3">සංරක්ෂණ කලාපය</td></tr>
<tr><td>ii. කලාප ලක්ෂණ</td><td colspan="3">තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා තෙත්බිම් සහ අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ යොදා ගැනීමත්, ඒවායේ විභවයන්, ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීම.</td></tr>
<tr><td>iii. කලාප මායිම්</td><td colspan="3">ඇමුණුම් අංක 01 අනුව විය යුතුය.</td></tr>
<tr><td>iv. උප කලාපය</td><td>අධි සංවේදී</td><td>මධ්‍ය සංවේදී</td><td>අඩු සංවේදී</td></tr>
<tr><td>v. කලාප අංකය</td><td>Cn1</td><td>Cn2</td><td>Cn3</td></tr>
<tr><td>vi. කලාප සංගුණකය</td><td>0.00</td><td>0.00</td><td>0.00</td></tr>
<tr><td>vii. ගං වතුර රැඳවුම් ධාරිතාවය</td><td colspan="3">ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි නිර්දේශයන්ට අනුකූල විය යුතුය.</td></tr>
<tr><td>viii. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන අවම බිම් කට්ටි ප්‍රමාණය</td><td>හෙක්ටයාර් 4 (අක්කර 10)</td><td>හෙක්ටයාර් 2 (අක්කර 5)</td><td>ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ අනෙකුත් අදාල ආයතනයන්හි (මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආදී) නිර්දේශයන්ට අනුකූල විය යුතුය.</td></tr>
<tr><td>ix. උපරිම බිම් කට්ටි ආවරණය (ගොඩනැගිලි සඳහා යට වන ප්‍රදේශ)</td><td>වැඩ බිමෙහි ප්‍රමාණයෙන් 1 % පුරවන ලද බිම මත ඉදිකරන වැසිකිළි හැර සියළු ගොඩනැගිලි කුළුණු මත විය යුතුය.</td><td>මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 3 % කි. පිරවූ ඉඩමෙහි කුළුණු මත සියළුම ගොඩනැගිලි අනුමත වේ. (වැසිකිළි හැර)</td><td>වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල නගර සංවර්ධන සැලැස්ම අනුව තීරණය වේ.</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| **x.** | **අවසර ඇති උපරිම යටිතල පහසුකම් ව්‍යාපෘති (විදුලිය, ජල සැපයුම, දුරකථන, මහා මාර්ග ආදිය)** | මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 4%කි. | මුළු ව්‍යාපෘති ප්‍රදේශයෙන් 7% කි. | සීමිත නොවේ. ව්‍යාපෘති වර්ගය අනුව බිම් ප්‍රමාණය රඳාපවතී. |
| **xi.** | **ගොඩනැගිලි සඳහා අනුමත උපරිම බිම් මහල** | වර්ග මීටර් 100 | වර්ග මීටර් 300 | වැඩ බිමෙහි විශේෂත්වය අනුව තීරණය වේ. |
| **xii.** | **අවසර දෙනු ලබන උපරිම ගොඩනැගිලි උස** | පිහිටි පොළව මට්ටමේ සිට මීටර් 7කි. (ප්‍රධාන සංකල්පයට ගැලපෙන පරිදි කුළුණු/නිරීක්ෂණ මධ්‍යස්ථාන, සැගවී සිට සතුන් නිරීක්ෂණය කල හැකි මධ්‍යස්ථාන) | පිහිටි පොළව මට්ටමේ සිට මීටර් 7 කි. (ප්‍රධාන සංකල්පයට ගැලපෙන පරිදි කුළුණු / නිරීක්ෂණ මධ්‍යස්ථාන, සැගවී සිට සතුන් නිරීක්ෂණය කල හැකි මධ්‍යස්ථාන ) | වැඩ බිමෙහි විශේෂත්වය මත තීරණය කර අනුමත කරනු ලැබේ. |
| **xiii.** | **ගොඩනැගිලි වර්ගය** | ගොඩනැගිලි තනි තනිව පිහිටි හෝ දර්ශනීය සිත් ඇදගන්නා වූ වහල වලින් සමන්විත සමූහයක් ලෙස තැබිය හැකිය. එහි දර්ශනීයත්වය විවෘත ප්‍රදේශයන්ට යාබද පොදු මාර්ග වලින් හා පොදු ප්‍රදේශ වලින් ආවරණය නොවන පරිසර හිතකාමී ලෙස පැවතිය යුතුය. | | |
| **xiv.** | **අනු බෙදුම්** | අනුමැතිය නොමැත. | අනුමැතිය නොමැත. | අනුමැතිය ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **xv.** | **සීමා මායිම් ලකුණු කිරීම** | මායිම් තාප්ප සඳහා අවසර නැත. පවතින උස් බිමකට යාවූ මායිමක් දිගේ පමණක් වැසි වතුර ගලා යාමට බාධා නොවන ලෙස, භූ දර්ශනයට ගැලපෙන, මායිම් වැටකට අනුමැතිය ලබා දිය හැක. අනෙකුත් මායිම් වල සීමාව සලකුණු කිරීම, භූ දර්ශනයට ගැලපෙන සලකුණු (මීටර් 10 ක අවම පරතරය සිටින සේ) යොදා සිදු කළ යුතුය. ඉහත අවස්ථා දෙකෙහිම එම වැඩ බිම විශේෂිත වන පදනමින් නාගරික සංවර්ධන අධිකාරියේ | | වැට මායිම් සලකුණු සඳහා අවසර ඇත. එය වැසි වතුර ගලා යන පද්ධති සඳහා බාධා නොවිය යුතුය. නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය තිබිය යුතුය |
| **xvi.** | **විශේෂ අවස්ථාවන්හිදී ඉහත කොන්දේසි ලිහිල් කිරීම** | අනුමැතිය නොමැත. | වැදගත් මහජන අපරව්‍යුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ අවස්ථාවකදී, ඉහත කොන්දේසි | අදාළ නොවේ. |
| **xvii.** | **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | 1. ජල බැස යාම් හා ගංවතුර රැඳවුම් ධාරිතාවයන්ට බාධා වන කිසිම ඉදිකිරීමක් තෙත් බිමක, ජලාශ්‍රිතව හෝ ජල මාර්ග වල සිදු නොකළ යුතුය. නමුත් මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාණ උපදේශන මාර්ගෝපදේශ සැලැස්මකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘති අදාළ ආයතනයන්වල නිර්දේශය හා අනුමැතියට යටත්ව සිදු කළ යුතුය.<br><br>2. තෙත් බිම් කලාපවල අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.<br><br>3. තෙත්බිම් පිරවීමේදී ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ තිරසාර වැසි ජල බැස යාමේ ක්‍රම භාවිතා කල යුතුය.<br>4. තෙත්බිම් පිරවීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය පිළිබඳ මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා ගත යුතුය. | | |

| | |
|---|---|
| | 5. තෙත් බිම්වල අනුමත කාර්යයන් වලදී නීත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුයි.<br>6. තෙත්බිම්වල සංවර්ධන කටයුතු සැලසුම් සකස් කිරීම, නිර්මාණ සහ අධීක්ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.<br>7. තෙත්බිම්වලට අපජලය බැහැර නොකළ යුතුය. මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයට අනුව පිරිපහදු කළ ජලය පමණක් මුදාහැරිය හැකිය.<br>8. අඩු සංවේදී කලාපයේ පවතින තෙත්බිම් අනුමත සංවර්ධන කටයුතු සඳහා යෙදවීමේදී ඊට ආසන්නවම පවතින කලාපයේ කලාප සංගුණකය සැලකිල්ලට ගෙන සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා දීම සිදුකල යුතුය.<br>**9.** අවශ්‍ය අවස්ථාවන්හිදී පරිසර පනත යටතේ පවතින " නියමිත ව්‍යාපෘති" (Prescribe Projects) සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතනයන්ගේ කොන්දේසි ආරෝපනය කල හැක. |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

# 08 වන පරිච්ඡේදය

# යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා

# 8 ගොඩනැගලි සීමා සහ යෝජිත මාර්ග පළල

## 8.1 *ප්‍රධාන මාර්ග*

**වගු අංක 22 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය : මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග**

| අනු අංකය | මාර්ගයේ නම | මාර්ග වර්ගීකරණය | යෝජිත මාර්ග පළල (මීටර්) | යෝජිත ගොඩනැගිලි සිමාව (මීටර්) |
|---|---|---|---|---|
| 1 | කොළඹ - වැල්ලවාය මාර්ගය (A2) | A | 24.0 (මාතර මහ නගර සභා මායිමේ සිට කඹුරුගමුව මංසන්දිය දක්වා) | 15.0 |
| 2 | කොළඹ - වැල්ලවාය මාර්ගය (A2) | A | 15 .0 (කඹුරුගමුව මංසන්දියේ සිට වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවසාන සීමාව දක්වා) | 15.0 |
| 3 | ගාල්ල - මාදම්පෙ මාර්ගය (A17) | A | 20.0 | 15.0 |
| 4 | වැලිගම - කනංකේ මාර්ගය | B | 20.0 | 15.0 |
| 5 | වැලිගම - තෙලිජ්ජවිල මාර්ගය | B | 20.0 | 15.0 |
| 6 | පැලැන - පොල්වත්ත දෙනිපිටිය මාර්ගය | B | 20.0 | 15.0 |

### 8.2 පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග

වගු අංක 23 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග

| අනු අංකය | මාර්ගයේ නම | මාර්ග වර්ගීකරණය | යෝජිත මාර්ග පළල (මීටර්) | යෝජිත ගොඩනැගිලි සීමාව (මීටර්) |
|---|---|---|---|---|
| 01 | වැලිගම - පංචාලිය මාර්ගය | C | 9.0 | 10.7 |
| 02 | බටවල - පාතේගම මාර්ගය | C | 12.0 | 10.7 |
| 03 | මිදිගම-ඉබ්බාවල මාර්ගය | C | 12.0 | 10.7 |
| 04 | උඩුපිල තන්හාගොඩ මාර්ගය | C | 9.0 | 10.7 |
| 05 | මිරිස්ස වටරවුම් පාර (වරාය පාර) | C | 12.0 | 10.7 |
| 06 | ලැබීම ගොඩගම සුල්තානාගොඩ මාර්ගය | C | 15.0 | 15.0 |
| 07 | පොල්වතුමෝදර දෙනිපිටිය මාර්ගය | C | 9.0 | 10.7 |
| 08 | එළුවාවිල මාර්ගය | C | - | 10.7 |
| 09 | සුල්තානාගොඩ වරකපිටිය මාර්ගය | C | 9.0 | 10.7 |
| 10 | උඩුකාව හල්ලල පාර | C | 12.0 | 10.7 |
| 11 | මාලිම්බඩ අකුරුගොඩ වැලිහිද මාර්ගය | C | 12.0 | 10.7 |
| 12 | කපුවත්ත දෙනිපිටිය මාර්ගය | C | - | 10.7 |
| 13 | වැලිහිද මුණමල්පෙ මාර්ගය | C | - | 10.7 |
| 14 | කොටවිල කිරිමැටි මුල්ල පාර | C | 12.0 | 10.7 |
| 15 | බොරාල වැව අද්දර පාර | C | - | 10.7 |
| 16 | කඹුරුගමුව - ලැබීම-හේන්වල මාර්ගය (කඹුරුගමුව මංසන්දියේ සිට හේන්වල හන්දිය හමුවන ස්ථානය දක්වා) | D | 24.0 | 15.0 |
| 17 | පොල්වත්ත එළුවාවිල මාර්ගය | D | - | 10.7 |
| 18 | වරකපිටිය කොටවිල නිදන්ගල මාර්ගය | D | - | 10.7 |
| 19 | ගරාඩුව රජමහාවිහාරය | D | - | 10.7 |
| 20 | සුනන්ද පාර | - | 09 | 7.32 |

*8.3 වැලිගම ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග*

වගු අංක 24 : වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය - ප්‍රාදේශීය සභා මාර්ග සඳහා **යෝජිත මාර්ග පළල**

| අනු අංකය | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්) | ගොඩනැගිලි සීමාව (මීටර් ) | පවතින මාර්ග පළල (මීටර්) |
|---|---|---|---|---|
| 1. | පැනැටියන මූනමල්පේ මාර්ගය | 12.0 | 9.0 | 6.0 |
| 2. | ගරාඩුව පාර | 9.0 | 6.0 | 5 – 6 |
| 3. | පලල්ල බොරාල කොලේදණ්ඩ පාර | 9.0 | 6.0 | 4 - 6 |
| 4. | යටිපිල මාර්ගය | 9.0 | 6.0 | 4 - 5 |
| 5. | එපිටමුල්ල මාර්ගය | 9.0 | 6.0 | 4.5 |
| 6. | පෙම්උයන්වත්ත මාර්ගය | 7.0 | 6.0 | 4.5 |
| 7. | මීරාවැල්ල මාර්ගය | 7.0 | 6.0 | 4.5 |
| 8. | වෙහෙරගල පන්සල අසල මාර්ගය | 7.0 | 6.0 | 5.5 |
| 9. | 20 -20 හෝටලය අසල මාර්ගය | 7.0 | 6.0 | 4.5 |
| 10. | සහබන්දුවත්ත ප්‍රවේශ මාර්ගය | 7.0 | 6.0 | 4.5 |
| 11. | අභිමානීගම කන්ද පාමුල මාර්ගය | 7.0 | 6.0 | 4.5 |
| 12. | දේනුවල සාගර කරවල කඩය ඉදිරිපිට මාර්ගය | 7.0 | 6.0 | 4.5 |
| 13. | තල්අරඹ අත්තම් නිවාස පාර | 7.0 | 6.0 | 4.5 |
| 14. | උදිත තොටහේවා මාවත ඉදිරිපිට මාර්ගය | 7.0 | 6.0 | 4-5 |
| 15. | ගුණසිරි නාහිමි මාවතෙන් ආරම්භ වන කොප්පර මුල්ල පාර | 7.0 | 6.0 | 5.0 |
| 16. | ඉන්දුසාර මාවත | 7.0 | 6.0 | 4.5 |
| 17. | විහදගොඩ පාර | 7.0 | 6.0 | 4.5 |
| 18. | මදුරුදූව පාර | 7.0 | 6.0 | 4.5 |
| 19. | කොලනිය පාර | 7.0 | 6.0 | 4.0 |
| 20. | නුග ගහ හේන පාර | 7.0 | 6.0 | 3.0 |
| 21. | තුඩැල්ල පාර | 7.0 | 6.0 | 4.0 |
| 22. | රණවිරුතොට හේවා මාවත ඉදිරිපස මාර්ගය වෙරළ දක්වා | 7.0 | 6.0 | 4.0 |
| 23. | වට්ටක්කා ගොඩ පාර | 7.0 | 6.0 | 4.5 |
| 24. | දෙනිපිටිය මුල්ල බොක්ක පාර | 7.0 | 6.0 | 4.5 |
| 25. | කපුවත්ත පාර | 7.0 | 6.0 | 4.5 |
| 26. | කුඩාවෙල්ල මාර්ගය | 07 | 06 | 4.5 |
| 27. | කොටවිල මහ වෙල්ල මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 28. | දිග්ගහ ගොඩ මාර්ගය | 07 | 06 | 4.5 |
| 29. | හට්ටිදූව - කොටවිල මාර්ගය | 07 | 06 | 4.5 |

| | | | | |
|---|---|---|---|---|
| 30. | විජය මාවත | 07 | 06 | 4.0-4.5 |
| 31. | ගුණසේකර මාවත | 07 | 06 | 4.0-4.5 |
| 32. | මීරුප්පා මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 33. | කම්මල්තොට මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 34. | මන්දාරා හෝටල් මාර්ගය | 07 | - | 4.0-6.0 |
| 35. | පළල්ල වට්ටක්ක ගොඩ මාර්ගය | 07 | 06 | 4.5 |
| 36. | බෝද්දුව මාර්ගය | 07 | 06 | 4.5 |
| 37. | දෙල්ගහ තොට මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 38. | පැණැටියන මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 39. | බෝදගල මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 40. | මීරුප්පා කුරුදුවත්ත තේක්කවත්ත මාර්ගය | 07 | 06 | 4.0-4.5 |
| 41. | ජයමාවත | 07 | 06 | 5.0-5.5 |
| 42. | අද්දරවෙල මාර්ගය | 07 | 06 | 4.5-5.0 |
| 43. | ඉල්වත්ත මාර්ගය (අද්දරවෙල මාර්ගයේ සිට කි.මී. 2ක් පමණ) | 07 | 06 | 4.5-5.0 |
| 44. | බොරොල්ල පාර | 07 | 06 | 4.5-5.0 |
| 45. | ගුණසිරි නාහිමි මාවත | 09 | 06 | 4.5-5.0 |
| 46. | ගුරු බැබිල පාර | 07 | 06 | 4.0-5.0 |

**සැලකිය යුතුය:**

1. ඉහත ලේඛණයට ඇතුලත් නොවන ප්‍රදේශීය සභා මාර්ග සඳහා ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට දෙපසට මීටර් 6.0කි.

2. අනෙකුත් පොදු මාර්ග/ පටු මංමාවත් සඳහා ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට දෙපසට මීටර් 3.0ක් ලෙස බල පැවැත් වේ.

3. දුම්රිය මාර්ගය සඳහා අදාල වන දුම්රිය මාර්ග රක්ෂිතය සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනුව තීරණය කරනු ලැබේ.

### 8.4 මුහුද, ඇළ මාර්ග, ගංගා, කලපු සහ ජලාශ සඳහා ගොඩනැගිලි සීමා සහ රක්ෂිත

වැලිගම ප්‍රාදේශිය සභා සංවර්ධන සැලැස්මේ සඳහන් කර ඇති වෙරළ රක්ෂිත සීමා පහත පරිදි වේ.

### 8.5 වෙරළ රක්ෂිත සීමා

1. වෙරළ කලාපය තුළ ගොඩනැගිලි ඉදිකිරිමේදි වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමෙන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

2. ගරාඩුව කලපුව හා ඊට සම්බන්ධ ඇළ මාර්ග වටා / ගොවියපාන කලපුව යම් සංවර්ධන කටයුත්තක් සිදු කරන්නේ නම් ඒ සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමෙන්තුවේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය

### 8.6 ගඟ සඳහා ගොඩනැගිලි සීමා

1. පොල්වත්ත ගඟ සඳහා ගොඩනැගිලි සීමාව ගඟ ඉමෙහි සිට මීටර් 10.0කි.

### 8.7 ඇළ මාර්ග, වැව් හා ජලාශ සඳහා රක්ෂිතයන් / ගොඩනැගිලි සීමා

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරනු ලබන සියළුම ඇළ මාර්ග හා වැව්, ජලාශ සඳහා එම දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා නිර්දේශය පරිදි ගොඩනැගිලි සීමා වෙන් කල යුතුවේ.

2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නඩත්තු කරන ලබන සියළුම ඇළ මාර්ග සඳහා එම දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා නිර්දේශය පරිදි අදාල ගොඩනැගිලි සීමා වෙන් කල යුතුය.

3. අනෙකුත් සියළුම ඇළ මාර්ග සඳහා ඇළ ඉමේ සිට දෙපසට මීටර් 03ක ගොඩනැගිලි සීමාවක් පවත්වා ගත යුතුය.

*8.8 ඇළ රක්ෂිතය ගොඩනැගිලි සදහා අදාල නියමයන් හා කොන්දේසි*

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලිඛිත අවසරයකින් තොරව ඇළ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ඇළ රක්ෂිතයේ කිසිදු ගොඩනැගිල්ක් හෝ ව්‍යුහයක් ඉදි නොකල යුතුය.

2. ඇළ මාර්ග රක්ෂිතය ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කල හැක්කේ විකල්ප මාර්ගයක් නොමැති විට පමණක් වුවද මාර්ගයේ පදික වේදිකාව, කොන්ක්‍රීට් හෝ වෙනත් ආකාරයෙන් සකස් නොකලයුතුය. (නාගරික සංවර්ධන අධිකාරිය විසින් කරනු ලබන විශේෂ ව්‍යාපෘති හැර)

3. ඇළ රක්ෂිතයක් වෙනත් කිසිදු කටයුත්තක් සඳහා විකිණීමට හෝ බදු දීමට කිසිදු පුද්ගලයකුයට, සංගමයකට, ආයතනයකට හෝ පළාත් පාලන ආයතනයකට ඉඩ නොදේ.

4. ඇළ රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ වාහන නැවැත්වීමට හෝ ගරාජ් සඳහා භාවිතා නොකල යුතුය

5. කිසිදු අවස්ථාවක රක්ෂිත තුළ මායිම් බිත්ති ඉදි කිරීමට අවසර නැත. කෙසේ වෙතත් දැල් වැටක් සඳහා අවසර දීම සලකා බලනු ලැබේ.

# උපලේඛන

උපලේඛණය I - "අආකෘතිය ": නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් ගෙබිම් අනුපාතයන්

| ඉඩමේ ප්‍රමාණය ( වර්ග මීටර්) | කලාපිය සංගුණකය = 0.50 - 0.74 | | | | කලාපිය සංගුණකය = 0.75-0.99 | | | | කලාපිය සංගුණකය =1.00-1.24 | | | | කලාපිය සංගුණකය =1.25-1.49 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | | මාර්ගයේ අවම පළල | | | |
| | **මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | **මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | **මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි | **මීටර් 6 | මීටර් 9 | මීටර් 12 | මීටර් 15 සහ වැඩි |
| 150 - 250ට අඩු | 0.8 | 0.9 | 0.9 | 0.9 | 1.3 | 1.3 | 1.4 | 1.4 | 1.6 | 1.7 | 1.8 | 1.9 | 2.0 | 2.2 | 2.3 | 2.4 |
